සරල සන්න සහිත

# ලෝකෝපකාරය


එල්. ගුණරත්න

විසින් ලියන ලද විස්තර සන්න සහිතයි.



89783



ප්‍රකාශනය:

රත්න පොත් ප්‍රකාශකයෝ

513, මරදන පාර,

කොළඹ 10.

1978

4.50

LB/183/83

88
2006
[illegible]/2005/HY/32951

මුද්‍රණය:
විජිතසේන රත්නායක
ඉන්දික මුද්‍රණාලය
98, ඩීන්ස් පාර,
කොළඹ 10.

89783

# පෙරවදන

සුචරිත මාර්ගයේ උසස්කමත්, දුශ්චරිත මාර්ගයේ පහත්කමත් ප්‍රකාශ කිරීමේ පුරුද්ද සාහිත්‍යකාරයන් තුළින් ඉස්මතු වී ඇත. සමාජය ශිෂ්ට කිරීමට ලේඛකයා නිරතුරුව ම මහන්සියක් ගෙන ඇති බව ඒ ඒ සාහිත්‍යයන්ට නෙත් යොමා බලන විට හොඳින් පෙනේ. ලෝවැඩ සඟරාව, සුභාෂිතය, ලෝකෝපකාරය ඒ බඳු ගණයේ පොත් වශයෙන් ගිණිය හැක. සංස්කෘත සාහිත්‍යයේ උපදේශ කාව්‍ය බොහෝ ගණනක් ඇත. නීතිශතක, නීතිසාර ආදී නීති ග්‍රන්ථ බොහෝ ඒවක් අපට දකිය හැක. පංචතන්ත්‍ර වැනි කථා පොත්වලින් ද මේ නීතිය ම ඉගැන්වීමට ලේඛකයෝ තුටු වී ඇත්තාහ. පාලි සාහිත්‍යයේ ධර්මයෙන් කැළතුණු ඔවා ජනතාවට [බෙද දුන් අයුරු කවුරුත් දනිති. ධම්මපදය, ජාතකකථා විශේෂයෙන් ම මේ සංඛ්‍යාවෙහි ලා ගිණිය හැක. දෙමළ සාහිත්‍ය ද උපදේශ කාව්‍යයන්ගෙන් පුෂ්ටිමත් ය. තිරුක්කුරල් නාඩක්යාර් ආදී බොහෝ ගණනක් පොත් මේ විෂය සඳහා ලියවී ඇත.

සමාජය නිතර නො මඟට ගමන් කිරීම සිරිති. සමාජයක් නො මඟට යවන මාධ්‍ය බොහෝ ගණනක් අප අතර ඇත. සමහර චිත්‍රපටි, සමහර නාට්‍ය අසභ්‍ය පොත්පත් පමණක් නොව නො තිත් කාමාසාවන්ගෙන් පෙළෙන ඇතමුන්ගේ ක්‍රියා කලාප ද ලොකු හේතුවක් වී ඇත. නීතියෙන් තහනම් කළයුතු තරමට පොහොසත් අසභ්‍ය වටාපිටාවක් වර්තමාන සමාජයේ ඇත. කාමුක අදහස් වලින් තෙරපවන නවකථා, ප්‍රවෘත්ති පත්‍ර, ඡායාරූප ආදිය නිසා සිදුවී ඇති අනර්ථය කිව නො හැකි තරම් ය. ආර්ථික පදනමක් සොයන ඇතැම් කුකෙයෝ, තමන්ගේ අභිතමාර්ථය මුදුන් පමුණුවා ගන්නේ නොයෙක් සමාජ රෝග අසභනකාරි තරුණ තරුණියන්ට බෝ කරමිනි. සමහර පුවත්පත් පාලකයෝ ද මේ ගණයෙන් නො මිදෙති. තරුණ සිත කුප්පවන නිර්වස්ත්‍ර හෝ ඒ තරම් ම කිටටු කාන්තා රූප පළකරවමින් අලෙවිය වැඩිකර ගැනීමට උපාමාරු යෙවීම

ඔවුන්ගේ සිරිත වී ඇති බැවිනි. නීතියෙන් තහනම් කළයුතු මෙ බඳු දේ තව තවත් ව්‍යාප්තව ඉදිරියට ගමන් කිරීමට ඉඩ දීම රට ප්‍රපාතයකට හෙලීමකි.

සමාජ මට්ටම කවදත් වෙනස් වන්නකි. එක් යුගයක ධර්මයට බරවෙන අතර බොහෝ යුග අධර්මයට බර වෙයි. අධර්මය, අයුක්තිය යම්කිසි සමාජයක රජ කරන විට මෙ විපත දකින මධ්‍යස්ථ උගත් ජනයා අනුකම්පාවෙන් සැකියන හදවතකින් සමාජය සුමඟට යැවීමට තමන්ගේ ශක්තිය පාවිච්චි කිරීමට පැන භාවිත කරති. මෙ නිසාය, අපේ සාහිත්‍යයට කඩින්කඩ උපදේශ පොත් අමුතුවෙන් එකතු වන්නේ.

## ලෝකෝපකාරය

'ලෝක+උපකාරය' යන දෙ සද එක්වීමෙන් මෙ තනි වචනය සැදී තිබේ. ලොවට කරන උපකාර යන අරුතක් බසින් පැවසේ. ලොවට වැඩ වැඩීමට උපකාර වන කියමන් වලින් ලෝකෝපකාරය පොෘහොසත් ය. ලෝකෝපකාරය නැරඹීමට කතුවරයා අප වෙහෙසවන්නේ මෙසේ ය.

''නොයෙක් කටයුතුකම්-දන්නා ලෙසට ලොව නැණැති වී
නොයෙක් උපමායෙන් - සැදූ නිරතුරු බලා ගැනුමට
අනුවණ දුරැර සැප - වාසය කර මෙලොව නිරතුරෙන්
සඟමොක් සැපත් ලැබ-ගන්ට බලවී ලෝකෝපකාරය.''

මෙලොව ඇති නොයෙක් කටයුතු දනගැනීමට ලෝකෝපකාරය අත්‍යන්ත උපකාරවන බව කතුවරයාගේ පිළිගැනීමයි. කතුවරයා කියන අයුරෙන් ලෝකෝපකාර–යෙන් දෙන අවවාද ඒ වූ විධියට පිළිගෙන කටයුතු කරන්නාට මෙලොව දියුණුව ලබාගැනීම අපහසුවන්නක් නො වේ. මෝඩකම් දුරුකිරීමට ද මෙ ග්‍රන්ථය මඟ පාදයි. හැම කෙනෙක් ම සැප වාසයට කුටුවෙති. මෙලොව වාසනාවත් කිරීමටත් සඟමොත් සැපත් ලැබීමටත් කියවිය යුතු හොඳම ග්‍රන්ථයකි, ලෝකෝපකාරය පොත ලියන්නට හේතුව සමාජයේ පවතින දුර්ගුණ නැති කොට සුගුණ මිනිස් සන්තානවල වගා කිරීමට බව කතුවරයාගේ අදහස් වලින්මා ඔප්පු වේ.

කතුවරයා

කතුවරයා ගැන මත භේදයක් පවතී. ඇතැමෙක් ලෝකෝපකාරයත්, ලෝවැඩ සඟරාව ලියූ මහනෙත් පාමුල මෛත්‍රෙය හිමියන්ගේ බව පිළි ගනිති. පැරණි ඇතැම් පිටපත්වල කර්තෘ සන්දර්ශනය මෙසේ සඳහන් වේ.

කිත්දිගු බිත් සුනැදි කුති හැම ස ද
මෙත් මහනෙත් පාමුල මහයති ස ඳ
සත් වග සෙත් කළ සුගතිඳු පද වැ ඳ
සිත් ලෙස අත් කළ මොක් සැප මනනද

මෙයින් එක එල්ලේම කියවෙන්නේ ග්‍රන්ථ කර්තෘවරයා මහනෙත් පහයෙහි මහසාමී වූ මෛත්‍රෙය හිමි බව ය. එසේනම් මේ ග්‍රන්ථයේ කාලසීමාව කෝට්ටේ යුගය තෙක් දිවයෙයි.

ලෝකෝපකාරයේ කතුවරයා රණස්ගල්ලේ, තෙර සාමීන් බව අනිත් මතයයි. රණස්ගල්ලේ හිමි මහ වියත් පරපුරෙක කෙනෙකි. තොටගමුවෙ වෙහෙරෙහි ශ්‍රී රාහුල හිමිදාණන් වහන්සේගේ ප්‍රශිෂ්‍යයෙකු වශයෙන් රණස්ගල්ලේ හිමි හඳුන්වා දීමට හැකිය.

සිරිසර ගුණැති මහ නැණ කෙදිනි පරසිඳුව සිටී
සිරිපිරි තොටගමුවෙ වෙහෙර
බොහොසෙ කල් හැර වැඩ සිටී

කෙළවර කළෙ මෙ පොත – පුර සත්‍ය සකවස පිරි සිටී
පරපුර වණිජ කුල – රණස්ගලු තෙර සාමින්

පුර සත්‍ය නම සකවසේ දී මේ ග්‍රන්ථය නිමා කළ බව මෙයින් කියවේ. පුර සත්‍ය නම 1721 යි; ක්‍රිස්තු වර්ෂයෙන් 1799 යයි.

මේ දෙ මතයෙන් ම කතුවරයා ගැන කියවෙන බැවින් ලෝකෝපකාර කතුවරයා අවිනිශ්චිත වශයෙන් සැලකීම යෝග්‍යය.

කතුවරයා ගිය, තම මාධ්‍ය කොට ගත් බව අමුතුවෙන් කිව මනා නො වේ. ගියට මුල් අවස්ථාවලදී තුබූ සැලකිල්ල මෙ යුගය වන විට හීන වී තිබුණි. එහෙත් කතුවරයා ගී මාධ්‍යයෙන් සිය ග්‍රන්ථය රචනා කළේ ය.

කතුවරයාගේ මේ උපදෙස් අතුරෙන් බොහෝ උපදෙස් සංස්කෘත, පාලි, දෙමළ යන මූලග්‍රන්ථයන්ගෙන් ගෙන තම ග්‍රන්ථය සකස් කොට ඇත. ඇතැම් තැන ජාතක කථාව ම කියා ඇත. කතුවරයාගේ ම නිර්මාණයන් මේ ගිණීමට හැකි තැන් ද නැත්තේ නො වේ.

භාෂාව මටසිලුටු යයි කිව හැක. මාතෘභාෂිය වදන් ම ඇතැම් තැන විරල වශයෙන් උපයෝගී කොට ගෙන ඇත. අපේ ව්‍යාඛ්‍යාව

ලෝකෝපකාරයාට නොයෙක් අරුත් වියතුන් තිබේ. මේ ග්‍රන්ථය දහම් පාසැල්හි අවසාන අවුරුද්දට හා පාසැල් හී අටවන ශ්‍රේණියටද නියමිතව ඇත. එම නිසා සරල ව්‍යාඛ්‍යාවක් අවශ්‍ය බව වැටහී ගිය බැවින් එම සිසුන්ගේ මනදෙළ පිරෙනු සේ ඉතා සරල බසින් පදර්ථ හා භාවය පමණක් මෙහි යෙදීමු.

## සරල සන්න සහිත

# ලෝකෝපකාරය

### නමච් මුණිසරණ

1. මුනිඳුට සරි කෙනෙක් - තුන්ලොවම නැති මුනිතුමෙක් මුත්
අපමණ තරු රැසින් - සඳට සරි තරුවක් නොමැතිමෙන්

පදර්ථ:- මුනිඳුට - බුදුරදුන්ට, සරි කෙනෙක් - සමාන කෙනෙක්, මුනිතුමෙක් මුත් - බුදුවරයෙකු හැර, තුන් ලොවම, තුන් ලොවෙහිම, නැත් - නැත්තාහ. අපමණ -ප්‍රමාණ කළ නො හැකි, තරු රැසින් - තරු සමූහයෙන්, සඳට - චන්ද්‍රයාට, සරි - සමාන ව, තරුවක් - තාරකාවෙක් නොමැතිමෙන් - නො මැත්තාක් මෙනි.

ාවය:- බුදුවරයෙකුට බුදුවරයකු හැර සමාන බවක් ඇති කෙනෙක් තුන් ලොවෙහි ම නැත්තාහ. බොහෝ තරු අතර සඳට සමාන තරුවක් නැත්තා මෙනි.

2. සමුදුර මෙර පොළෝ - තරු ලේ හිස් මසට ඇස් දුන්
නොසරිවන කල ලොව - බුදු බව පතනුවෝ ළතර වෙත්.

ද‍ර්ථ:- ලොව - ලෝකයෙහි, බුදු බව පතනුවෝ - බුදුබව පතන්නෝ, ලේ, හිස්, මස්, ඇස් දුන් - ලේ, හිස්, මස්, ඇස් දන් දුන්හ, සමුදුර - මහ මුහුද ද, මෙර - මහා මෙරුව ද, පොළෝ - මහ පොළොව ද, තරු - තාරකාද, නො සරි - සමාන නො වේ. (එනිසා බෝසත්හු) ළතර වෙත් - දැඩි සිත් ඇත්තෝ ය.

භාවය:- බුදුබව පතන බෝසත්හු ලේ, හිස්, මස්, ඇස්, දන් දුන්හ. මහ මුහුදෙහි වතුරට වඩා ලේ ද, මහමෙරට වඩා හිස් ද, පොළොවෙහි පසට වඩා මස්ද දන්දුන්හ. එ නිසා බෝසත් වරු දැඩි සිත් ඇත්තෝ ය.

3 දහම් සිතුරුවනට වඩිනා - වතෙක් තුන් ලොවම නැති
දහම් සොඬ නරනිඳු - ඉන්වද රකුසු කටට පැන්නේ,

පදර්ථ: - දහම් - ධර්මය, සිතුරුවනට - චින්තා මාණික්‍යයට, වඩනා වතෙක් - වටිනා වස්තුවක්, තුන් ලොවම නැත,

තුන් ලෝකයෙහිම නැත්තේය, දහම් සොඬ නරනිඳු,
දහම් සොඬ රජතුමා රකුසාගේ කටට, පැන්නේ ඉන්වද
– පැන්නේ ඉන් නිසාද?

භාවය:– ධර්මය සිතූ පැතූ දේ දෙන මාණික්‍යයකි. එ බඳු
වටිනා දෙයක් තුන් ලොවම නැත්තේ ය. දහම් සොඬ
රජතුමා රකුසාගේ කටට පැන්නේ ඒ නිසා ම ය.

මෙයින් දහම් සොඬ ජාතකය සිහියට නඟවා ඇත.

4. වටු පැටිව දෙගුරුන් – නොමතිවද ලව්ගිනි එනු බල බලා
කළ සත් කිරි බෙලෙන් – සිටපි ගංතෙරට පත්මෙන්.

පදර්ථ:– වටු පැටිව - වටු පැටියෙක් ව, දෙගුරුන් – දෙමා–
පියන් නොමැතිවද – නැතිකල, ලැව්ගිනි-ලැව් ගින්නක්,
එනු බලබලා, – එනවා බලමින්, කළ සත්කිරි බෙලෙන්
කළා වූ සත්‍යක්‍රියා බලයෙන්, ගංතෙරට පත් මෙන් –
ගඟ සීමාවට පත්වූවාක් මෙන්, සිටපි – නතර කරවී.

භාවය:– වටු පැටියෙක් වූ බෝසත් තෙම, දෙමාපියන්
ලැව්ගින්න දැක බියව ගියවිට (සන්ති පක්ඛා අපතනා
යනාදීන්) කරන ලද සත්‍ය ක්‍රියා බලයෙන් ලැව් ගින්න
සංසිඳවීමට පැමිණ වීය. ගංතෙරට පත් ගින්නක් නිවී
ගියා සේ සත්‍ය ක්‍රියා බලයෙන් ගින්න නිවී ගියේය.
මෙයින් කතුවරයා වට්ටක ජාතකය සිහියට නංවා ඇත.

5. මනා වන විදුවක් – අවිදුන් මැදෙහි පාන අවියත්
අඳ දනහට <u>දපණ</u> – ඔවුන් වත බලන්නට දෙන වැනි.

පදර්ථ:– මනාවන විදුවක් – යහපත් වන විද්‍යාවක්, අවිදුන්
මැදෙහි – නූගතුන් අතර, පාන – ප්‍රකාශ කරන්නා වූ,
අවියත් – මෝඩයා, අඳ දනහට – අන්ධ ජනයාට, ඔවුන්
වත බලන්නට – ඔවුන්ගේ මුහුණ බැලීම සඳහා, දපණ
දෙන වැනි - කණ්ණාඩියක් දෙන්නාක් මෙනි.

භාවය:– නූගත් පිරිසක් මැද වැදගත් විද්‍යාවක් පෙන්වන්නා ද
මෝඩයෙකි. ඔහුගෙ ක්‍රියාව දෙ ඇස නැත්තන්ට
තමන්ගේ මුහුණ බැලීම සඳහා කණ්ණාඩියක් දෙන්නා
මෙනි.

6. සුදනන් කෝප වුව – දුදනන් මෙන් වුවද නො තිබෙ
මඳක් කල් තිබුවත් – ඉන්වන වැඩක් අවැඩක් නැති.

පදර්ථ: සුදනන් - සත්පුරුෂයන්, කෝප වුව - කෝප වුවත්, දුදනන් - දුර්ජනයන්, මෙත් වුවද - මිතුරු වුවත්, නො තිබෙ - නො පවතී, මදක් කල් - ටික කලක්, තිබුණත්, ඒ කෝපය තිබුණත්, ඉන්වන - එයින් වන්නා වූ අවැඩක් - අනර්ථයක්, නැත - නැත්තේය.

භාවය: සත්පුරුෂයන්ගේ කෝපයත්, දුර්ජනයන්ගේ මිත්‍රකමත්, යන දෙකම වැඩිකල් නො පවතී. මේ දෙක ටික කලක් පැවතීමෙන් වැඩක් හෝ අවැඩක් සිදු නො වේ.

7. රන්හසව රිවි සමඟ - දිවත් ජයගති බුදුකුරු විසින්
තිරිසන්ව උපනත් - බෝසතුන් සිතු දෙයක් සිදුවේ.

පදර්ථ: රනහස - ස්වර්ණ හංසයා, රිවි සමඟ - සූර්‍ය සමඟ, දිවත් - දිවුවත්, බුදුකුරු විසින් - බෝසතුන් විසින්, ජයගති - ජයග්‍රහණය කළේ ය, තිරිසන්ව - තිරිසනෙක් වී, උපනත් - උපන්නත්, බෝසතුන් - බෝධිසත්වයන් විසින්, සිතු දෙයක් සිතන ලද දෙයක්, සිදුවේ-සිද්ධ වේ.

භාවය: බෝසත් රනහංසයා සූර්‍ය සමග දිවීමෙන් ජය ගත්තේය. බෝසත් වරෙයක් තිරිසන්ව උපන්නත් ඔහු සිතූ දෙය ඉටුවීම සිරිති.

කතුවරයා බෝසත්කමේ අගය පෙන්වීමට මේ ඉදිරිපත් කළේ ජවන හංස ජාතකයයි.

8. රුරු මුවරද කල - මහදන කුමරු ගඟින් ගොඩ ලා
බඹදත් රජුට දම් දෙසා - සුව අබය ලදි සත්හට.

පදර්ථ: රුරු මුවරද කල - (බෝසත්) රුරු මුවරාජව උපන් කාලයෙහි, මහදන කුමරු - එ නම් කුමාරයා, ගඟින් ගොඩලා-ගඟින් එගොඩ කොට, බඹදත් රජුට-බ්‍රහ්මදත්ත රජුට, දහම් දෙසා - ධර්මය දේශනා කොට සත්හට-සත්වයාට, සුව අභය ලදි - සැපය හා අභය ලද්දේ ය.

භාවය: බෝසත් රුරු මුවරාජව උපන් යුගයෙහි මහදන කුමරු ගඟෙහි ගිලෙන්නට නොදී ගොඩ ගත්තේය. පසු කල බ්‍රහ්මදත්ත රජුට බණ කියා තමන්ගේ පිරිවර සතුන්ට සැප හා අබය ද දෙවී ය.

කතුවරයා රුරුමිග ජාතකයේ එන සිඩිය මෙසින් පිළිබිඹු කෙරේ. මහදන කුමාරයා ගොඩගත් බෝසත් තමා ගැන කිසිවකුට නො කියන සේ ගිවිය ගත්තේ බ්‍රහ්මදත්ත රජුට ධන ආශාවෙන් මුවා ගැන කී ය.

9. අමා රසයට වැඩි රසයෙක් - නො මැත සුරන් බුදිනා
ඊටත් වැඩිය රසයකි - තමා දරුවන් ඇණූ සුබොජුන්

පදර්ථ: සුරන් - දෙවියන්, බුදිනේ - අනුභව කරන්නේ, හැම රසයට ම - සියළු රසයන්ට, වැඩි, - අධික වූ, නො මැති රසයෙකි - දුර්ලභ රසයෙක් වේ, තමා දරුවන් ඇණූ - තමාගේ දරුවන් විසින් අණන ලද, සුබොජුන් - මනා භෝජනය, ඊටත් වැඩි රසකි - ඊටත් වඩා රසයෙක් වේ.

භාවය: දෙවියන් අනුභව කරන අමා රසයට වැඩි රසයෙක් නැත. තමාගේ දරුවන් ඇණූ හොඳ ආහාරය ඊටත් වඩා රසවත් වේ.

10. දෙගුරුන් විසින් තම දරුවන්ට - දෙන නොමඳ දන නම්
වියතුන් සබා මැද - ඉන්ට ඉදිරිව සිල්ප දෙනුමැයි.

පදර්ථ: දෙගුරුන් විසින් - දෙමාපියන් විසින්, තම දරුවන්ට - තමන්ගේ දරුවන්ට, දෙන - දෙන්නා වූ, නො මඳ - බොහෝ වූ, දන නම් - ධනය නම්, වියතුන් සබා මැද - උගතුන්ගේ සභා මැදෙහි, ඉදිරිව - අභිමුඛව, ඉන්ට - හිඳීමට, සිල්ප දෙනුමැයි - ශිල්ප ඉගැන්වීමයි.

භාවය: දෙමාපියන් විසින් දරුවනට දිය යුතු හොඳම වස්තුව නම්, උගතුන් වාසය කරන සභාවක ඉදිරියට ගොස් වාඩිවීමට හැකිවන සේ ශිල්ප ඉගැන්වීමයි.

11. සඳකැන්.සඳුන් මඳ නල - මේ ඇම සිසිලටත්
උතුම් සිසිලසයකි - ගතෙහි තම දරුවන් වැකෙනවා.

පදර්ථ: තම දරුවන් - තමාගේ දරුවන්, ගතෙහි - සිරුරෙහි, වැකෙනවා - ගැවීම, සඳකැන් - චන්ද්‍ර රශ්මිය, සඳුන් - හඳුන්, මඳ නල - මඳ පවන, මේ ඇම සිසිලටත්-මේ සියලු සිසිලට වඩා, උතුම් සිසිලසකි - උත්තම සිහිලකි.

භාවය: තම දරුවන් සිරුර ස්පර්ශ වීම සඳරැස්, සඳුන්, මඳ සුළඟ යන හැම සිසිලට ම වඩා උතුම් ය.

12. දෙගුරුන්ටත් වඩා - දරුවන්ටමයි දනෝ සෙනෙහස
මෙලොවත් රැක මළත්-සඟමොක් දෙන බැවින් කරවිපින්

පදර්ථ:- දෙගුරුන්ටත් වඩා - දෙමාපියන්ටත් වඩා, දනෝ - මිනිස්සු, දරුවනට මයි සෙනෙහස - සෙනෙහස දරුවන්ටමයි, මෙ ලොවත් - මේ ලෝකයත්, රැක - රක්ෂා

කොට, මළත් - මැරුණත්, සගමොක් - ස්වර්ග මෝක්ෂ දෙක, දෙන බැවින් - දෙන නිසා, පින් - පුණ්‍ය කර්මයක්, කරව - කරව.

භාවය:- මිනිස්සු තමන්ගේ දෙමාපියන්ට වඩා දරුවන්ට ආදරය කරති. එනිසා දරුවෝ දෙමාපියන් රක්ෂණ කොට පින්කම් කළ යුතුය. එය ස්වර්ග මෝක්ෂ ලාභය කෙරේ.

13. සාව අප බෝසත් - සක් බමුණාට දෙනුව ඇඟ මස්
පිනු සඳ ගින්නට - සුරිඳු ගෙන සඳ මැදෙහි ඇන්දේ

පදර්ථ:- අප බෝසත් - අපගේ බෝසත් තෙම, සාව - සාවෙක් ව, ඉපිද - ඉපිදී, ඇඟ මස් - ශරීර මාංශය, සක් බමුණාට - ශක්‍ර බ්‍රාහ්මණයාට, දෙනුව - දෙනු පිණිස, ගින්නට - ගින්දරට, පිනු සඳ - පිනු කල්හි, සුරිඳු - ශක්‍ර තෙම, ගෙන - අරන්, සඳ මැදෙහි - චන්ද්‍ර මණ්ඩලයෙහි, ඇන්දේ - ඇන්දේ ය.

භාවය:- බෝසත් සාවෙක්ව ඉපිද ඇඟ මස්, බමුණු වෙසින් පැමිණි ශක්‍රයාට දීම සඳහා ගින්නට පැන්නේ ය. ශක්‍රයා ගින්නට පනින සාවා රැගෙන ගොස් සඳෙහි ඔහු රූ සටහන ඇන්දේ ය.

මෙයින් සස ජාතකය සිහියට නංවා ඇත.

14. මුනිඳුන් ගුණ මහිම - මෙ ලොව දනෙයි නිදිගත් විට
යක් බූ ඔබාගත - සුගත සිහිකළ බිය බැහැර යේ.

පදර්ථ:- මුනිඳුන් ගුණ මහිම - බුදුරජාණන් වහන්සේගේ ගුණ මහිමය, නිදිගත් විට - නින්දට ගිය කල්හි, මෙලොවම - මේ ලෝකයෙහිදී ම, දනෙයි - දැනගත හැකි වෙයි. යක් බූ - යක්ෂ භූතයන්, ඔබාගත - ඔබාගත් කල්හි, සුගත - බුදුරජුන්, සිහිකළ - සිහිකළා නම්, බිය - භීතිය, බැහැරයේ - පිටතට යෙයි.

භාවය:- බුදුගුණ මහිමය මෙ ලොවදී ම දනෙයි. නිදිගත් විට (සිහිනෙන) යකුන් විසින් වැළඳ ගත් කල්හි, බුදුරජුන් සිහි කළ විට බිය දුරුවෙයි.

15. ඉසුරෙන් පිරිහුණත් - සුදන තම ගුණය අඩු නො කරත්
බිඳුනත් රන් බඳුන - ඇති බර අගය අඩුනොවන මෙනි.

පදර්ථ:- සුදන – සජ්ජනයෝ, ඉපුරන් පිරිහුනත් – සම්පත් තිබෙයන් පිරිහී ගියත්, තම ගුණය – තමන්ගේ ගුණය, අඩු නොකරත් – අඩු නො කරත්, රන් බඳුන – රත්රන් භාජනය, බිඳුණත් - බිඳී ගියත්, ඇති බර – ඇත්තා වූ බර හා, අගය – අගය, අඩු නො වන මෙන් – අඩු නො වන්නාක් මෙනි.

භාවය:- යහපත් අය ධනයෙන් පිරිහී ගියත් ගුණයෙන් නො පිරිහෙත්. රන් බඳුන බිඳී ගියත් එහි ඇති බර අගය අඩු නො වන්නාක් මෙනි.

16. සුදනෝ තම සිරිත් – කළවුන් තමන් ලෙසම සලකත්
පහනින් ගත් පහන් – එක ලෙසට බබළන විලස්නෙන්

පදර්ථ:- සුදනෝ – යහපත් මිනිස්සු, තම සිරිත් – තමන්ගේ චාරිත්‍රයන්, කළවුන් – කළා වූ අය, තමන් ලෙසම – තම න්ගේ ආකාරයෙන් ම, සලකත් – සලකති, පහනින් – පහනෙන්, ගත් – ගත්තා වූ, පහන් – ප්‍රදීප, එක ලෙසම – එක් අයුරින්, බබළන විලසනෙන් – බැබළෙන්නාක් මෙනි.

භාවය:- යහගුණ ඇති තමන්ගේ සිරිත් අනුගමනය කරන අය තමන් අයුරින් ම සලකත්. එය පහනකින් දල්වා ගත් පහනක් ඊ වූ විදියට බබළන්නා මෙනි.

17. මුතු මිණි කනාවත් – නො මඳ පළඳිතත් සිත් සේ
ගුණ නුවණ සිප් දත් – දරුවන් ලබනු වැඩි පෙම් ලබයි.

පදර්ථ:- මුතු මිණි කනාවත් - මුතු, මැණික්, රන් ආදී වස්තු, නො මඳ ලැබ – බොහෝ ලැබ, සිත් වූ පරිදි පළඳිතත් – කැමැති පරිදි පැළැන්දත්, ගුණ නුවණ සිප් දත් – ගුණ හා ඥානය ඇති, දරුවන් – දරුවන් ලබනු, වැඩි පෙම – අධික ප්‍රේමයක්, වඩයි - වඩයි.

භාවය:- මුතු මැණික්, රන් ආදී වස්තු ලැබ තමන්ට කැමති පරිදි පළඳින්' ගුණ නුවණ වැඩි ශිල්ප දත් දරුවන් ලැබීම ඊට වඩා සෙනෙහසක් ඇති කෙරේ.

18 සවන පිනවන සව් නදට – තුටුවන දනෝ ලෙව්හි
තම දරුවන් බොළඳ - වදන් නො ඇසූ එ දනෝ

පදර්ථ:- ලෙව්හි – ලොවෙහි, සවන – කණ, පිනවන – පින වන්නා වූ, සව් නදට – සියලු නාදයන්ට, තුටුවන–සතුටු

වන්නා වූ, දනෝ – මිනිස්සු, තම දරුවන් – තමන්ගේ දරුවන්, බොළඳ වදන් – මොළකැටි වචන; නො ඇසූ – නො අසන ලද්දෝද, ඒ දනෝ – ඒ ජනයෝ; නැසූ – කනට ප්‍රිය වදනක් නැසුවෝය.

භාවය:– ලොව ඇති කන් පිනවන නාදයන්ට සතුටු වන මිනිස්සු තම දරුවන්ගේ බොළඳ වදන් නො ඇසූ අය වෙති.

19. තම පාපිටෙහි උන් රුපුන් – නො නසා රකිති උතුමෝ
අඳුරු රුපු පහන් කඳ මුල – අඳුරු නුදුරු කළ මෙන්

පදර්ථ: උතුමෝ – උතුම අය, තමන් පාපිටෙහි – තමන්ගේ යටතෙහි, උන් – උන්නාවූ, රුපුන් – සතුරන්, නො නසා – විනාශ නො කොට, රකිති – ආරක්ෂා කෙරෙති, රුපඳුරු – අඳුරට විරුද්ධ වූ, පහන් කඳ – පහන් කඳ, මුල – මුල්හි, අඳුරු – අන්ධකාරය, නුදුරු කළ මෙන් – දුරු නො කරන්නා මෙනි.

භාවය: උතුමෝ තමන් යටතට පත්වූ සතුරන් නොනසා රකිති. අඳුර නැති කරන පහන, පහන් කඳ මුල ඇති අඳුර නොනසන්නා මෙනි.

20. උතුමෝ දුදන බස් – නො අසත් සතන් බස් මිස
සුගඳ දුගඳ දෙකට සතුටු – නොසතුටු වන ගහණ මෙන්.

පදර්ථ:– උතුමෝ – උත්තමයෝ, සතන් බස් මිස – සත් පුරුෂයන්ගේ බස් හැර, දුදන – දුර්ජනයන්ගේ, බස්, නො අසත් – නො අසති. සුගඳ දුගඳදෙකට – සුගන්ධ දුර්ගන්ධ දෙකට, සතුටු නොසතුටු වන – සන්තෝෂ අසන්තෝෂ වන්නාවූ, ගහණ මෙන් – නාසය මෙනි.

භාවය: උත්තමයෝ යහපත් මිනිසුන්ගේ වචනයට තුටු වෙති. දුර්ජනයන්ගේ වචනයට අසතුටු වෙති. නාසය දුගඳට අසතුටු වන අතරම සුවඳට සතුටු වන්නා මෙනි.

21. ඇසුරුවන් සත – සිය පණ සෙ රක්නා සුදන හට
මොක් දකිනා තුරුම-දුකක් නොම වේ ලෙව් සතන්ගෙන්.

පදර්ථ:– ඇසුරුවන් සත – ආශ්‍රය කරන අය, සිය පණසෙ – තමන්ගේ ප්‍රාණය මෙන්, රක්නා සුදන හට – ආරක්ෂා කරන යහපත් ජනයාට, මොක් දකිනා තුරුම –

නිර්වාණය දක්නා තුරාම, ලෙව් සතන්ගෙන් – ලෝක වාසී සත්වයන්ගෙන්, දුකක් නො මවෙ – දුකක් ඇති නො වේ.

භාවය:– ඈසුරට පැමිණි අය තමන්ගේ පණ මෙන් රකිනා සුදනන් හට නිවන් දකිනා තුරුම ලෝ සතුන්ගෙන් කිසි දුකක් ඇති නො වේ.

22. ඇම සැපයටම වැඩි – සැපයෙකි දනුව දකුම උතුමන්
ඊටත් වැඩි සැපෙකි – නොදකීම කලකින් දුදනයන්.

පදාර්ථ:– උතුමන් දකුම – උත්තමයන් දකීම, ඇම සැපයට ම වැඩි – සියලු සැපයන්ට වැඩි, සැපයෙකි–සැපයෙක් වේ. දුදනයන් – දුර්ජනයන්, කලෙකින්–කිසියම් කාලයකින් නො දකීම, නො දක්ම, ඊටත් වැඩි උසස් සැපයෙකි.

භාවය:– උතුමන් දකීම හැම සැපයට ම උසස් සැපයෙකි. කිසි කලෙක දුර්ජනයන් නො දකීම ඊටත් වඩා උසස් සැපයෙකි.

23. උතුමෝ නොලැබලබ-වැඩකෙරෙති ලොවෙහි නිවතුන්ටත්
නොයෙක් පල බරතුරු – සද පලදු සතන් රකිනෙව.

පදාර්ථ:– උතුමෝ – උතුම් අය, ලැබ නො ලැබ – ලාභයන් නො ලබා, ලොවෙහි – ලෝකයෙහි, නිවතුන්ටත් – වස්තු නැත්තන්ටත්, වැඩ කෙරෙති – වැඩ වඩති. නොයෙක් පලබරතුරු – නොයෙක් පලයන්ගෙන් බර වූ ගස්, සද – හැමකල්හි, පල දී – පලදයක කොට, සත රකිනා එව – සත්වයන් රක්ෂා කරන්නා මෙනි.

භාවය:– උසස් අය කිසි ලාභයක් නො ලබා ලෝකයෙහි වාසය කරන නිර්ධන මිනිසුන්ට වැඩ කටයුතු කෙරෙති. නොයෙක් පලතුරු පිරුණු ගස් හැමකල්හි පලදෙමින් සත්වයන් ආරක්ෂා කරන්නා මෙනි.

24. මසුරු දනා දන – සුදනනට පත් දනට වැඩි වෙ
කරදිය මෙ රඳුට – හසුව සකහට අමා වන මෙන්.

පදාර්ථ:– මසුරු වූ දනා – මසුරු මිනිසුන්ගේ, දන – වස්තුව, සුදනතට – යහපත් මිනිසුන්ගේ අතට, පත් – පැමිණ, දන – ජනයාහට, වැඩි වෙ – වැඩ සිදුවේ. කරදිය –

මුහුදු දිය, මෙරඳුට – මෙස රාජයාට, (වැසි වළාකුලට) හසුව – අසුවී, සතහට – සත්වයාට, අමාවන මෙන් – මිහිරි වන්නාක් මෙනි.

භාවය:– මසුරු මිනිසුන්ගේ වස්තුව සුදනන් අතට පත්වූ විට ජනයාට වැඩ පිණිසම වේ. මුහුදු ජලය වලාකුලට අසුව සතුන්ට අමාවක් වන්නා මෙනි.

25. නිදුකින් සව් ඉසුරු-නො මඳ ලැබෙතත් නුවණ ඇතියෝ
අනුන් නසා ලබන – ඉසුරු වසුරු අයුරු සලකත්.

පදර්ථ:– නිදුකින් – දුකක් නො මැතිව, සව් ඉසුරු – සියලු සම්පත්, ලැබෙතත් – ලැබුණත්, නුවණ ඇතියෝ – නුවණ ඇත්තෝ, අනුන් නසා – අන්‍යයන් විනාශ කොට, ලබන – ලබන්නා වූ, ඉසුරු – සම්පත්, වසුරු අයුරු සලකත් – වර්චස් මෙන් සලකත්.

භාවය:– බුද්ධිමත් අය ඉතා පහසුවෙන් සියලු සම්පත් ළඟා කරති. එහෙත් අනුන් වනසා ලබන සම්පත් අගුචි සේ සලකත්.

26. ගුරුන් දෙගුරුන් හා – නෑ සිය සුතඹු රකින සුදනෝ
මෙලොව යස මඟුලුත් - ලබත් පරලොව සුව සහමොක්.

පදර්ථ:– දෙගුරුන් හා – මවුපිය දෙදෙනා හා, ගුරුන් – ආචාර්යයන් ද, නෑසිය – සිය නෑයන්ද, සුතඹු – පුත්‍ර-දරාවන් ද, රකින – රකින්නා වූ, සුදනෝ – යහපත් අය, මෙලොව – මේ ලෝකයෙහි, යස – කීර්තියත්, මඟුලුත් - මංගලත්, පරලොව – පරලෙව්හි, සහමොක් සුව – ස්වර්ග මෝක්ෂ සැපත්, ලබත් - ලබන්නාහ.

භාවය:– දෙමාපියන්, ගුරුවරුන්, නෑයන්, අඹුදරුවන් රකින සත් පුරුෂයෝ මේ ලෝකයෙහි කීර්ති ප්‍රශංසාත්, පරලොව ස්වර්ග මෝක්ෂ සම්පතුත් ලබති.

27. ගුණමකු දනන් හා - සමඟ විසුවත් නැණති සුදනෝ
මනා ගුණ නො හරිත්-කොසඹ තුර තුළ බැඳි මීය මෙන්.

පදර්ථ:– නැණැති සුදනෝ – නුවණ ඇති යහපත් මිනිස්සු ගුණමකු – ගුණමකන, දනන් හා ජනයන් හා, සමග – එකතුව, විසුවත් – වාසය කළත්, මනාගුණ – යහපත්

ගුණයන්, නො හරිත් - නො හරින්නෝය. කොසඹ
තුරු තුළ - කොංහොඹ වෘක්ෂයක ඇතුළත බැඳි -
බැන්දවූ, මිය මෙන් - මීය මෙනි.

භාවය:- බුද්ධිමත් යහපත් අය ගුණමකුවන් හා එක් ව
වාසය කළත්, ඔවුන්ගේ යහපත් ගුණ අත් නොහරිත්.
කොසඹ වෘක්ෂය තුළ බැඳි මීය එහි පැණි රස අත්
නො හරින්නා මෙනි.

28. කළගුණ දෙලොව බස - රස සුදන මෙ ඇම දත් උතුමෝ
මිනිස් වෙස් ගෙනවුත්- මෙලොව සත රකින සුරනයුරු වෙත්

පදාර්ථ:- කළගුණ - කරන ලද්දවූ ගුණය, දෙලෝ - මෙලෝ
පරලෝ ය, රස බස - රසබස් ය. සුදන - සුදනයා,
මෙ ඇමදත් - මේ සියල්ල දත්, උතුමෝ - උත්තමයෝ,
මිනිස් වෙස් ගෙනවුත් - මිනිස් වෙස් රැගෙන, මෙලොව -
මේ ලෝකයෙහි, සත රකින - සත්වයා ආරක්ෂා කරන,
සුරන් අයුරු වෙත් - දෙවියන් වැනි වෙත්.

භාවය:- කෙළෙහි ගුණ දන්නා අය, මෙ ලොව පරලොව
දන්නා අය, රස වදන්, සජ්ජනයන් යන මෙ හැම
දෙයක් ගැන දන්නෝ මිනිස් වෙසින් මෙහි පැමිණ
ඇති දෙවියෝ ය.

29. නුවණැතියෝ සසල-නොවෙත් කොතරම් දුක්සැප වුවත්
ගැසුවත් තද මෙග - පවන් නිසලව සිටින සල මෙන්.

පදාර්ථ:- නුවණැතියෝ - නුවණ ඇත්තෝ, දුක් සැප - දුක්
හා සැප, කොතරම් වුවත් - කොතෙක් වුවත්, සසල
නොවෙත් - චංචල බවට නොයෙත්. තද මෙග
ගැසුවත් - දැඩි මේඝයන් ගැසුවත්, පවනින් - මාරුත-
යෙන්, නිසලව - නොසෙල්වන, සලමෙන් - පර්වතය
මෙනි.

භාවය:- නුවණ ඇත්තෝ දුක් හා සැප කොතෙක් වුවත්
චංචල නොවෙත්. දැඩි මේඝ ගර්ජනා තිබුණත්
සුළඟින් නොසෙල්වෙන පර්වතයක් මෙන් වේ.

30. විරිදුන් මඳවරද - කියනුයේ දකිනට තමන් දෙස්
කිසි කලෙකත් දුකෙක්-කෙසග විතරක් නොවෙ
දෙලොවින්.

පදර්ථ:- විරිදුන් – සතුරන්ගේ, මදවරද – සුළු වරද, කියනුයේ කියන්නේ ය, තමන් දෙස් – තමන්ගේ දෝෂය, දකිනට – දක්නාහට දෙ ලොවින් – දෙ ලොවින් ම, කිසි කලෙකත් – කිසිම කාලයකත්, දුකෙක් – දුකක්, කෙසඟ විතරක් – කෙස්ගස් අගක් පමණවත්, නො වේ– නොවන්නේ ය.

භාවය:- සතුරාගේ සුළු වරද කියන්නා සේ තමන්ගේ වරදක් දකින තැනැත්තාට කිසි කලෙකත් කෙසඟක් පමණවත් දුකක් දෙ ලොවෙහි ම සිදු නො වේ.

31. උතුමන් ගුණ නුවණ – කියනුහට දෙලෝ වැඩ අත් වේ.
එහෙයින් සත් සතන් – ගුණත් මනුවණ පමණ දක්වමි.

පදර්ථ:- උතුමන් – උතුම් අයගේ, ගුණ නුවණ – ගුණය හා ඥානය, කියනුහට - කියන්නාහට, – දෙ ලෝ වැඩ – දෙ ලොවෙහි වැඩ, අත්වේ – අත්වේ. එහෙයින්, එනිසා, සත් සතන් – සාධු සත්වයන්ගේ, ගුණත්, – ගුණයනුත්, මනුවණ පමණ – මගේ නුවණ පමණින්, දක්වයි-ප්‍රකාශ කරමි.

භාවය:- උතුමන්ගේ ගුණ නුවන කියන්නාහට දෙ ලොව අභිවෘද්ධිය අත් වේ. එනිසා යහපත් තැනැත්තන්ගේ ගුණත්, මාගේ නුවණ පමණින් දක්වමි .

32. රන් බඳුනෙහි කෙසර-තෙල් අඩු නොවී පවතින මෙන්
උතුමන් හද සපිරි – කුළුණු මෙත් අඩු නොවි පවති.

පදර්ථ:- රන් බඳුනෙහි – රන් බඳුනක, කෙසර තෙල් – සිංහ තෙලය, අඩු නොවී, – අඩු නොවී, පවතින මෙන් – පවතින්නාක් මෙන්, උතුමන් – උත්තමයන්ගේ, හද– හෘදයෙහි, සපිරි – පිරී ගිය, කුළුණු මෙත් – කරුණා මෛත්‍රිය, අඩුනොව – අඩුවක් නො මැතිව, පවතී – පවතියි.

භාවය:- රන් බඳුනෙහි සිංහ තෙල් වත්කළ විට අඩුවක් නොවී පවතී. එසේ උත්තමයන්ගේ හෘදයෙහි පිරුණු කරුණා, මෛත්‍රී ගුණ ද අඩු නොවී පවතී.

33. සුදනෝ නිවන්වත් – පරහට දුකක් විට පිහිට වෙත්
කිසි නැති පවන් පත – පවන දැරියා ගිම'නරින මෙන්.

පදාර්ථ:- සුදනෝ සත් පුරුෂයෝ, නිවත්වත් - දුප්පත් වූව, පරහට - අන්‍යයන්ට, දුකක් විට - දුකක් ඇති කල්හි, පිහිට වෙත් - පිහිට වෙති' කිසිනැති - කිසිවෙක් පවනක් නැති, පවන්පත - විජිනිපත යා පවන ඇර - යහපත් පවන් යවා, ගිමන්, - ග්‍රීෂ්මය, අරින මෙන - අරින්නා මෙනි.

භාවය:- සුදනෝ තමාට වස්තුව නැතත් අන්‍යයන්ට දුකක් වූ විට පිහිට වෙති. කෙසේද? කිසිම දෙයක් නොමැති විජිනි පත පවන ගෙන දී ගමන් වෙහෙස දුරු කරන්නා මෙනි.

34. දෙ පස රුපුනිදිතත් - වෙසෙත් සැපසේම නුවණැතියෝ
දසන් දෙතිසක් මැද - වැය නොතැළී දවසරින දිවමෙන්.

පදාර්ථ:- දෙ පස - දෙ පැත්තෙහි, රුපුන් - සතුරන්, ඉඳිතත් - උන්නේ වී නමුත්, නුවණැතියෝ - ඥානවන්තයෝ, සැපසේ ම - සැපවත් ව, වෙසෙත් - වාසය කරති, දෙ තිසක් දසන් මැද - තිස් දෙකක් දත් අතර, දිව - දිව නො තැලී - තැලෙන්නේ නො මැතිව, දවසරින - දවස් අරින්නාවූ, දිව මෙන් - දිව වගේ.

භාවය:- නුවණැතියෝ දෙ පසම සතුරන් ඇතත් බුද්ධිමත්ව ජීවත් වෙති. දත් දෙ තිසක් මැද ඒ දත්වලට නො තැලී ඇති දිව මෙනි.

35. යමකු කළ යහපත සිහි නොවනුයේ ලොව නපුරු නැති
ලුහු දන කළ නපුර - සිත නො තබනු යහපතෙක් නැති

පදාර්ථ:- යමකු කළ - යමකු විසින්, කරන ලද, යහපත - යහපත්කම, සිහිවනුයේ - සිහියට එන්නේ නම, ලොව - ලෝකයෙහි, නපුරක් - නපුරක්, නැත් - නැත්තේමය, ලුහු දන - පොඩි අය විසින්, කළ - කරන ලද, නපුර - නපුරුකම, සිත - සිත්හි, නො තබනු - නො තබන්නේ නම, යහපතෙක් - යහපතක්, ඇත - ඇත්තේය.

භාවය:- යමකු කළා වූ යහපතක් සිහි නො කිරීම වැනි වූ නපුරක් තවත් නැත. පොඩි අය කළා වූ නපුරු දෙය සිත නො තැබීම වැනි යහපතක් නැති.

36. කෙත්වත් ලොව නොයෙක් - පලතුරු රහිත මෙග විලසින්
සත් සත් කළත් සැප - සත දුක් ගිනට මහත් සෙවනක්.

පදර්ථ:- ලොව - ලෝකයෙහි, කෙත්වත් - ක්ෂේත්‍ර වස්තූන් හා, නොයෙක් පලතුරු - නානා වර්ගික පලතුරු, රකින - රකින්නාවූ, මෙග විලසින් - වැස්ස මෙන්, සත් සත් - සත් පුරුෂ අය, අත් කළ, තමා අයත් කළ- සැප - සම්පත්තිය, සත් - සත්වයන් ගේ, දුක් ගිමට, දුඃඛ ග්‍රීෂ්මයට, මහත් සෙවනෙක් - මහත්වූ සෙවනක් වේ.

භාවය:- කෙත් වතු හා නොයෙක් පලතුරු වෘක්ෂ ආරක්ෂා වන්නේ වර්ෂාව නිසා ය. මෙසේ සත් ජනයන් ලැබූ සැපත සත්වයන්ගේ දුක් නමැති ග්‍රීෂ්මය නිවීමට මහත් සෙවනක් වේ.

37. මහළු පඩි තපසුන් - අඳ, ද දුබල දිළිඳා සත්සත් මෙ ඇමට පිහිට වනු-නිරිඳුන් විනා අන්කෙනෙක් නැත්.

පදර්ථ:- මහළු - වයසක අය, තපසුන් - තාපසයන්, අඳ ද- අන්ධයන්, දුබල - දුබලවූවන්, දිළිඳු - දිළින්දන්, සත්සත් - සත් පුරුෂයෝ ද, අත් කළ - තමා අයත් කළ, සැප - සම්පත්තිය, සත - සත්වයන්ගේ, දුක් ගිමට දුක්ඛ ග්‍රීෂ්මයට, මහත් සෙවනක් - මහත්වූ සෙවනක්වෙ.

භාවය:- මහළු, පඩි, සුදන, දුබල වූ දිළිඳු වූ හැම කෙනෙකුගේ ම පිහිට සඳහා රජතුමා හැර අන් කෙනෙක් නැත.

38. නො මද ගං හෝ ඇල-දිය නිති වැදත් නො පිරිසිඳු මෙන් අපමණ දන ලදත් - ඉසුරුමත් දනගෙ සිත් නොපිජේ.

පදර්ථ:- නොමද-බොහෝ වූ, ගං-ගංගා, හෝවල, දිය-වතුර නිති වැදත් - නිතර වැදීමෙන්, ගැලීමෙන්, නො පිරි - නොපිරිහෙන්නා වූ, සිඳු මෙන් - මුහුදු මෙනි, අපමණ බොහෝ, දන දනවස්තුව, ලදත් - ලැබුවත්, ඉසුරුමත්- සම්පත්තියෙන් මත් වූ, දනගෙ - මිනිසුන්ගේ, සිත්- සිත. නො පිජේ, නො පිරෙන්නේ ය

භාවය:- බොහෝ ගංගා, ඇල දෙලවල දිය නිතර ගලා බසින මුහුද මෙන් කොතරම් ධනය තිබුණත් යස ඉසුරු ඇති මිනිසුන්ගේ සිත් නොපිරිහෙන්නේය.

39. යමකු යම් තැනකට - පමුණුවනු ගුණ දනයි නියවත් සුරනිඳු දිනිඳු හැර - කරිඳු මැඳ සසැඳියා විලසින්.

පදර්ථ:- නියවත් - ඥානවන්තයෝ, යමකු - යම්කෙනෙකු, යම් තැනකට - යම් ස්ථානයකට, පමුණුවතු - පමුණු වන්නේ, ගුණ දනයි - ගුණය දන්න යෙනය. සුරනිඳු - ශක්‍රයා, දිනිඳු හැර - සූර්‍ය්‍යයා හැර, තරිඳු මැද - චන්ද්‍රයා මැද, සසැඳියා විලසින් - සස ලපය ඇන්ද මෙනි.

භාවය:- බුද්ධිමත් අය යමෙක් යම් තැනකට පමුණු වන්නේ ඔහුගේ ගුණ දනගෙන ය. ශක්‍රයා සූර්යයා අත්හැර, චන්ද්‍රයා මැද සස ලපය ඇන්ද මෙනි.

40. මේග ගං පලතුරු - පරහට ම වැඩ පමණුවන මෙන්
සුදනන් ලත් ඉසුර - සවසතට වැඩ වේය නිතියෙන්.

පදර්ථ:- මේග - වර්ෂාව, ගං පලතුරු - ගංගා හා වෘක්ෂයන් ගෙන් වන්නාවූ. වැඩ - අර්ථයන්, පරහටම - අන්‍ය යන්ට ම, පමුණුවන මෙන් - පමුණුවන්නාක් මෙන්, සුදනන් - සත්පුරුෂයන් විසින්, ලත් ඉසුරු - ලබන ලද සම්පත්, නිතියෙන් - නිරන්තරයෙන්, සවසතට - සියලු සත්වයන්ට, වැඩවේය - වැඩක් වන්නේ ය.

භාවය:- වැස්ස - ගංගා හා පල දරණ ගස් අනුන් හට වැඩ සිදු කරයි. එමෙන් සුදනන් ලත් වස්තුව ද සියලු සත්වයන්ට නිතර යහපත ගෙන දේ.

41. නිවයන් රැගෙනත් - සිදුවන දෙයක් සිදු කෙරේ කැත්
කනා නො මදැතිවත් - ලෝ කැඩ පතෙන් වත බලනු මෙනි.

පදර්ථ:- කැත් - රජතෙම, සිදුවන දෙයක් - සිදුකරන දෙයක්, නිවයන් - පහත් අයගෙනුත්, රැගෙනත් සිදු කෙරේ - සිද්ධ කෙරේ. කනා - රන්, නො මද ඇතිවත්, බොහෝ ඇති නමුත්, ලෝකැඩ පතෙන් - ලෝ කැඩ පතින්, වත - මුහුණ, බලනු මෙනි - බලන්නා මෙනි.

භාවය:- රජතෙම සිදුවන දෙය නිවයන්ගෙනුත් සිදු කර ගනී. රත්රන් කොතරම් තිබුනත් ලෝහ කැඩපතින් මුහුණ බලන්නාක් මෙනි.

42. එකකට වත් එකෙක් - සමත් අනෙකක් අනික් එකකට
තද පවන ලදුවත් - නැව ගොඩත රිය මුහුද නො දිවේ.

පදර්ථ:- එකෙක් - එකෙක්, එකකට - එක කරුණකට, සමත් වේ - දක්‍ෂ වේ, අනෙකෙක් - අන් එකෙක්,

අනික් එකෙකට - අන් දෙයකට, සමත් - දක්ෂය. තද පවන ලදුවක් - සැඩ සුළං හමා ගියත්, නැව - නෞකාව, ගොඩත් - ගොඩත්, රිය - රථය, මුහුද - මුහුදෙහි ද, නො දිවේ - නො දිවේ.

භාවය:- එකෙක් එකකට සමත් වෙයි. අන් එකෙක් අනික් එකකට සමත් වෙයි. සැඩසුළං හමා ගියත් නැව ගොඩෙහිත් රිය මුහුදෙහිත් ගමන් නො කෙරේ.

43. ඇම සතට වැඩ වන – ගම්මැදෙහි පලතුරක් විලසින් සුදනන් අතට පත් – ඉසුරු වැඩිවේය සව් ලෙව් හට.

පදාර්ථ:- ඇම සතට - සියළු සත්වයන්ට, වැඩවන – වැඩක් සිද්ධ වන, ගම් මැදෙහි – ග්‍රාම මධ්‍යයෙහි, පලතුරක් විලසින් - ඵල වෘක්ෂයක් මෙන්, සුදනන් – සත්පුරුෂ යන් ගේ, අතට පත් - අතට පැමිණි, ඉසුරු–සම්පත්තිය, සව් ලෙව් හටත් – සියලු ලෝකයා හටක්, වැඩ වේ – වැඩ පිණිස වන්නේ ය.

භාවය:- හැම දෙනාට යහපත සලසන පලතුරු ගසක් මෙන් සුදනන් අතට පත් වූ වස්තුව සියලු ලෝකයාට ම යහපත සලසයි.

44. නසතත් දුදනයන් – සුදනෝ උන්ට ම වැඩ සලසත් සඳුන් තුරු සිඳිනා – පොරොව මුව අත සුවඳ'වන මෙන්

පදාර්ථ:- සුදනෝ - සත්පුරුෂයෝ, දුදනයන් – දුර්ජනයන් විසින්, නසතත් – විනාශ කළත්, උන්ටම – ඔවුන්ටම, වැඩ සලසත් – වැඩ සිද්ධ කරති. සඳුන් තුර – සඳුන් ගස්, සිඳිනා - කපන්නාවූ, පොරොව – පොරොවේ, මුව අත – මුවාත, සුවඳ අමන මෙන් - සුගන්ධය හමන්නා මෙනි.

භාවය:- දුර්ජනයන් තමන් විනාශ කරතත් සුදනෝ උන්ටම වැඩ සලසති. සඳුන් ගස කපන්නාවූ පොරොවෙහි මුවාතෙහි සුවඳ හමන්නා මෙනි.

45 තද රුදු ගුණැතිවත් – ලියෝ මඳහස සිසිල පැලත් තද යකඩින් තැනූ – යහපත් සිසිලසය පානෙව්.

පදාර්ථ:- තද – දැඩිවූ, රුදු – රෞද්‍ර වූ, ගුණැතිවත් - ගුණ ඇතත්, ලියෝ - කාන්තාවෝ, මදහස - මඳ සිනා, සිසිල - සීතල බව, පැලත් - ප්‍රකාශ කරත්, තද යකඩින්

තද වූ යකඩින් තැනූ - තනන ලද යදත් - යකඩ පත්‍රය,
සිසිලසය - සීතලකම, පාන එව - පාන්නක් මෙනි.

භාවය:- කාන්තාවෝ තද රෞද්‍ර ගති ඇති වුවත් මද සිනා පෙන්වති. තද යකඩින් තැනූ පත්‍රය සීතල බවක් පෙන්වන්නාක් මෙනි.

46. රකුසෙක් තම ලියක - තිබී කරඬුවක ලා කුසතුළ
එහි තුළ වන් සිඳුට - තම හිමිට දියුණුව කළා පෙම්.

පදර්ථ:- රකුසෙක් - රාක්ෂසයෙක්, තම ලියක - තමන් ගේ ස්ත්‍රිය, කරඬුවක ලා - කරඬුවක දමා, කුස . තුළ - කුස ඇතුළෙහි, තිබී - තැබූයේය, එහි තුළ - ඒ ඇතුළට, වන් - ඇතුල් වූ, සිඳුට - සිද්ධයාට, තම හිමිට - තමන්ගේ ස්වාමියාට, වඩා දියුණුව - දෙගුණයක්, පෙම් කළා - ප්‍රේමකළාය.

භාවය:- රාක්ෂසයෙක් සිය බිරිය රැකීමට ඇය කරඬුවෙක දමා තමන්ගේ කුස තුළ කරඬුව තබා ගති. මේ කරඬුව තුළට ඇතුල් වූ සිද්ධයකුට තම සැමියාට වඩා දෙගුණයක් ම ආදරය කළාය.

මේ සමුග්ග ජාතකය සිහියට නංවයි.

47. සඳ නද කරන සඳ - පහන් සියුරන් මන තෙමන මෙන්
සඳ සඳ පහන් සඳ - සලෙළු සඳ කොඳ සඳ පහන් වේ.

පදර්ථ:- සඳ - සන්ධ්‍යා කාලයෙහි, නද කරන - නාද කරන් නාවූ, සඳ පහන් - චන්ද්‍රාලෝකය, සියරන් - ඇට්කුකුළු වන්ගේ, මන - චිත්තය, තෙමන මෙන් - තෙමන්නාක් මෙන්, සඳ - සුන්දරියන්ගේ, සඳ - චිත්තය, පහන් සඳ - පහන් වූ කල්හි, සලෙළු - සල්ලාලයාගේ, සඳ කොඳ - සිත් නමැති කුන්දයට, සඳ පහන් වේ - චන්ද්‍ර ප්‍රභාව වෙයි.

භාවය:- සල්ලාලයාගේ සිත් කොඳ වනය පිනවීමට සඳ එළිය උදවු වේ. සන්ධ්‍යාවෙහි නාද කරන ඇට්කුකුළා ද චන්ද්‍ර ආලෝකයෙන් සතුටට පත් වේ.

48. නිමල ගුණ රුසිරු - ඉසුරු තෙද විකුම් ඇති තැනටත්
පැමිණ කද රැකවල - ඇතත් සිතුවක් කෙරෙති අඟනෝ.

පදර්ථ:- නිමල - නිර්මල වූ, ගුණ - ගුණයන් ද, රුසිරු - රූපශ්‍රීයද, ඉසුරු - සම්පත් ද, තෙද - තේජස ද, විකුම් - වික්‍රමය ද, ඇත් - ඇත්තාවූ, තැනටත් - ස්ථානයටත්, පැමිණ - පැමිණ, තද රැකවල ඇතත් - දැඩි ආරක්ෂා ඇතිමුත්, අඟනෝ - කාන්තාවෝ, සිතුවක් කරති - කැමැත්තක් කරති.

භාවය:- හොඳ ගුණවත්, රූපවත්, ධනවත්, තෙදවත්, වික්‍රමවත් ස්වාමියෙකු යටතට පැමිණියත්, නොයෙක් ආරක්ෂා තැබුවත් ඒවා බිඳ දමා, අඟනෝ තමන්ගේ අභිමතය ඉටු කරගනිති.

49. කනාලිය පැරයූ - තුනු සිරිමවා ඇතිද සිවුවත්
මනා ගුණ පිය පියා - හදතුළ ගලක් අතුළේ තුළේ.

පදර්ථ:- කනාලිය පැරයූ - රන්ලිය පරදවා, සිවුවත් - මහබඹු තුනු සිරි මවා - ශෝභාසම්පන්න රූපයක් මවා, ඇතිද - ඇත්තේ වී නමුත්, පිය-ස්ත්‍රියගේ, මනගුණ-චිත්තයෙහි ගුණයන්, පියා - පහ කොට, හද තුළ - හෘදයාභ්‍යන්තර යෙහි, තුළේ - මහත් වූ, ගලක් - ගලක්, අතුළේ - අතුරන ලද.

භාවය:- රන්රන් රුවක් සේ ස්ත්‍රිය මවා ඇයගේ හෘදය ගලක් සේ තද බවට පත් කිරීම නිසා මහබඹු නුවණ නැත්තෙකැයි කියන ලදී.

50. වැදුවත් දරුවන් - ලදුන් සෙනෙහස සැබෑ නොකරව
සිළුමිණිනි බබලන - උරග විස සහවා කෙළන වැනි

පදර්ථ:- දරුවන් - දරුවන්, වැදුවත් - ප්‍රසූත කළත්, ළඳුන් සෙනෙහස - කාන්තාවන්ගේ සෙනෙහස, සැබෑ නො කරව - විශ්වාස නො කරව, සිළුමිණිනි - චූඩාමාණික්‍ය යෙන්, බබළන - බබළන්නාවූ, උරග - නාගයා, විස - විෂ, සහවා - සඟවා ගෙන, කෙළින වැනි - ක්‍රීඩා කරන්නාක් වැනිය.

භාවය:- දරුවන් ලැබුවත් කාන්තාවන්ගේ ආදරය සැබෑ යයි නො සිතව. සිළුමිණින් නාගයා තම විෂ වසාගෙන ක්‍රීඩා කරන්නා වැනි ය.

51. ගෙයි දෙය පිටත දී - තැන තැන ඇවිද කරන නොපනත්
ලියන්ගෙන් වන වැඩ - ඇතත් උන් කෙරෙහි
ලොබ නො කරව.

පදර්ථ:– ගෙයි දෙය – ගෙදර බඩු, පිටත දී – පිටතට දී, තැන තැන – තන්හි තන්හි, ඇවිද – ඇවිදිමින්, නො පනත් කරන – නො පනත් කරන්නා වූ, ලියන්ගෙන් – කාන්තාවන්ගෙන්, වන වැඩ ඇතත් – වන්නාවූ වැඩ ඇතත්, උන් තෙරෙහි – කාන්තාවන් කෙරෙහි, ලොබ නො කරව් – ලෝභ නො කරව්.

භාවය:– තම ගෙදර ඇති වස්තු පිටත දෙමින් නොයෙක් තැන ඇවිදිමින් කාන්තාවෝ නොපනත්කම් කරති. මේ කාන්තාවන්ගෙන් වැඩ සිදුවුනත් ඔවුන් ගැන ගිජු කමක් නො කරව්.

52. තම සිතට නො හැඟෙන – ලෙස වසන රුදු දූත අඟනන්
ලුණු බෝමාළුවෙහි – නොවන මෙන් හැර කරව් දුරු.

පදර්ථ:– තම සිතට – තමන්ගේ සිතට, නො හැඟෙන ලෙස – නො නැඟෙන පරිදි, වසන – වාසය කරන, රුදු – රෞද්‍ර වූ, දූත අඟනන් – ධූර්ත ස්ත්‍රීන්, ලුණු බෝ මාළුවෙහි – ලුණු අධික ව්‍යංජනයෙහි, ලොබ නොවන මෙන් – ලෝබයක් නැත්තා සේ, හැර – ලෝභය පහකොට, දුරු කරව් – දුරු කරව්.

භාවය:– තමාගේ සිතට නො හැඟෙන්නා සේ වාසය කරන නරක ස්ත්‍රීන් ලුණු වැඩි මාළුව ගැන ආශා නොකරන්නා සේ දුරු කරව්.

53. සලෙළුන් දක ලියන්-සැඟවෙනු නොවේ බලව විලියෙන්
බළලුන් ගොදුරකට-පැමිණෙන තෙක් වැන්න සැඟවුම.

පදර්ථ:– ලියන් – කාන්තාවන්, සලෙළුන් දක – සල්ලාලයන් දක, සැඟවෙනු – සැඟවීම, විලියෙන් නො වේ – ලජ්ජා වෙන් නො වේ, ගොදුර – ගෝචරය, අතට පැමිණෙන තෙක් – අතට පැමිණෙන තුරු, බළලුන් - බළලුන්ගේ, සැඟවුම වැන්න – සැඟවීම වැන්න.

භාවය:– සලෙළුන් දක කාන්තාවන් සැඟවෙන්නේ ලජ්ජා වෙන් නො වේ. බලව්. බළලුන් අතට ගොදුර පත්වන තෙක් සැඟවෙන්නා මෙනි.

54. අගනන්ට රකවල් – කැර පමණ කොට හිඳින අවියත්
බිජු වපුරා වැවෙ – සියොතුනට වැට බැඳ ඉඳිනමෙනි.

පදර්ථ:– අඟනන්ට – ස්ත්‍රීන්ට, පමණකට – ප්‍රමාණයකට, රකවල කර – රැකවල් දී රක්ෂාවරණ කොට, ඉඳින –

ඉන්නාවූ, අවියත් - අව්‍යක්තයන්, වැවෙ - වැවෙහි, බිජු - බීජයන්; වපුරං - වපුරා. සියොතුන්ට - කුරුල්ලන්ට, වැට බැඳ - වැටක් බැඳ, ඉඳින වැනි - ඉන්නා මෙනි.

භාවය:- ස්ත්‍රීන්ට රැකවල් කොට එය පමණ කොට වාසය කරන මෝඩයා වැවක බිත්තර වපුරා කුරුල්ලන්ට වැට බැඳ වාසය කරන්නා වැන්න.

55 තමාහන හැරලා - තැන් තැන්හි පරහන පතනුවෝ
අම යයි සුරා බී - දෙලොව දුක් විඳිනවුන් වැන්නෝ.

පදර්ථ:- තමා අහන - තම භාර්යාව, හැරලා - අත්හැර, තැන් තැන්හි - නොයෙක් තැන්වල, පරහන පතනුවෝ අන්‍ය ස්ත්‍රීන් ප්‍රාර්ථනා කරන්නෝ, අමායයි-අමෘතයයි, රාබී - රා පානය කොට, දෙලොවම - දෙ ලොවම, දුක් විඳින වැන්නෝ - දුක් විඳින වැන්නෝය.

භාවය:- තම විවාහක භාර්යාව අත්හැර නොයෙක් තැන්වල අන් ගැහැණුන් බලාපොරොත්තු වන්නෝ අමෘතය යන සැකයෙන් සුරා බී දෙ ලොවම දුක් විඳින අය මෙනි.

56. සගමොක් දෙකට යන - මග අකුලි මාවත නිරායන
විස මුසු අමායුරු - ලියෝ මායම් පිරූ බඳනෙක.

පදර්ථ:- ලියෝ - කාන්තාවෝ, සගමොක් දෙකට යන, ස්වර්ග මෝක්ෂ දෙකට යන්නා වූ මග - මාර්ගයට, අකුලි, අකුලෙක නිරායන - නිරයට යන්නා වූ, මාවත - මහ පාරෙකි. විසමුසු - විෂමිශ්‍ර, අමායුත් - අමෘතයක් වැන්න. මායම් පිරූ - රැවටිලි පිරුවා වූ - බඳුනකි - භාජනයකි.

භාවය:- කාන්තාවෝ ස්වර්ග මෝක්ෂ දෙකට යන මං අවුරති. නිරයට යන මං විවෘත කරති. විෂ මිශ්‍ර කළ අමෘතයක් වැන්න. මායාවන් පිරුණු භාජනයකි.

57. ළඳුන් පෙම බැඳුමට - පැමිණ දුක් විඳිනු අවියත්
බෝසත් රන මොනර - සෙබඩක නිසාවුත් බැඳුනු වැනි.

පදර්ථ:- ළඳුන් - කාන්තාවන්ගේ, පෙම බැඳුමට - පෙම බැඳීමට, පැමිණ අසුවී, දුක් විඳිණු - දුක් විඳිම, රන මොනර බෝසත් - ස්වර්ණ මයුර වූ බෝධි සත්වයා, සෙබඩක නිසා - මොනරියක සඳහා, අවුත් - පැමිණ, බැඳුණු වැනි - බැඳුණාක් මෙනි.

89783

භාවය:- කාන්තාවන්ගේ පෙම බැඳීමට අසුවී පිරිමි දුක් විඳිති. බෝසත් රත මොනරා සෙබඩියක නිසා පැමිණ මලයෙහි බැඳුණා වැන්නේය.

58. තම හිමි ඉන්ද දී - නො හිමිඳුට කල් බඳින සොරහන
තම බුදින මස් ඇර-නො කන මස් කා කුල නසන මෙන.

පදර්ථ: තම හිමි - තමන්ගේ ස්වාමියා, ඉන්දදී - වංසය කරද්දී, නො හිමි දූවු - අහිමියන් දුටුව, කල් බඳින - කාම බන්ධනය කරන්නා වූ, සොරහන - සොර ස්ත්‍රීහු, තම බුදින - තමන් අනුභව කරන්නාවූ, මස් ඇර - මස් අත්හැර, නො කන මස් - අනුභව නො කරන මාංශයන්, කා - අනුභව කොට, බැඳුනු වැනි බැඳුනාක් මෙනි.

භාවය:- තම හිමියා සිටියදී පර පුරුෂයන් දුක ආලය කරන නරක ස්ත්‍රීහු තමන් අනුභව කරණ මස් අත්හැර කුණුමස් අහරට ගන්නාක් මෙනි.

59. ලියන් නිසා කරන - බැහැර නො මඳ දුක් විඳිති සත
පබවත කෙරේ ලොබින්- කුසරජ පවා වසුන් කත් ඇද්දේ.

පදර්ථ:- ලියන් නිසා කරන - ස්ත්‍රීන් ඇසුරු කරන, සත - සත්වයෝ, බැහැර - බාහිර වූ, නො මද දුක් - බොහෝ දුක්, විඳිත් - විඳිති, පබවත කෙරේ - පබාවතී කෙරෙහි, ලොබින් - ලෝභයෙන්, කුසරජ පවා - කුසරජතුමා පවා, වසුන් කත් ඇද්දේ - අඩුක්කු කත් ඇද්දේ ය.

භාවය:- ස්ත්‍රීන් ආශ්‍රය කරන පිරිමි බාහිර නොයෙක් කරදරයන්ට මුහුණ පාති. පබාවතී කෙරෙහි ලෝබයෙන් කුස රජ අඩුක්කු කත් ඇද්දෝය.

60. ලියෝ බොරු සෙනෙහස- පසා තමහිමි සොරුගෙන නසත්
කොටකුට කළ ලොබින්- ගලින් බෝසත් හෙළූ ලියමෙන්

පදර්ථ:- ලියෝ බොරු සෙනෙහස - කාන්තාවෝ බොරු සෙනෙහස, පසා - පාමින්, සොරු ගෙන - සොර මිනිසුන් අරගෙන, තම හිමි - තමන්ගේ ස්වාමින් නසත් - විනාශ කරති, කොටකුට - අත් පා කැපූ පුද්ගලයකුට, කළ ලොබින් - කරන ලද ආශාව නිසා, බෝසත් - බෝධි සත්වයන්, ගලින් - පර්වතයෙන් හෙළ - පෙරලූ, ලියමෙන් - ගැහැනිය මෙන්.

භාවය:- කාන්තාවෝ බොරු ආදරය හිමියාට පාමින් සොර සැමියන් අරගෙන සිය හිමියන් විනාශ කරති. කොටිකුට කළ ආශාව නිසා තමන්ගේ හිමියා ගලකින් පෙරලූ කාන්තාව මෙනි.

මෙයින් චුල්ල පදුම ජාතකය සිහියට නංවයි.

61. ගුණ නැණැති විරියවත් - ලිය ඉඳින ගෙට වැඩෙ සවසිරි
සවසිරි සපිරි ගේවත් - අවගුණ ලියක වන දිළිඳු වෙ.

පදර්ථ:- ගුණ නැණ - ඇති - ගුණය හා ඥානය ඇති, විරියවත් - වීර්යවත් වූ, ලිය ඉඳින ගෙට - කාන්තාව වාසය කරන ගෙයි, සවසිරි - සියළු සැපත්, වැඩේ - දියුණු වෙ, සවසිරි සපිරි - සියළු සම්පත්වලින් පිරිගිය, ගේවත් - ගෘහයටත්, අවගුණ ලියක් - නරක ගතිගුණ ඇති ලියක් වන - ප්‍රවිෂ්ටවී නම, දිළිඳුවෙ - දුප්පත් වෙ.

භාවය:- ගුණය, නුවණ, වීර්ය, ඇති කාන්තාව, වාසය, කරන නිවාසය සියලු ඉසුරෙන් පිරේ. සියලු ඉසුරෙන් පිරුණු එබඳු නිවසකට අවගුණ ඇති ස්ත්‍රියක් පිවිසියහොත් පිරිහේ.

62. සිය ලිය පමණ කොට - ඉඳින අවියත් දනෝ ලෙව්හි
විසගොර උරග ගෙන උරෙහි ලා කෙළනවුන් වැන්නෝ.

පදර්ථ:- සියලිය - ස්වකීය භාර්‍යාව, පමණකොට - ප්‍රමාණ කොට, ඉඳින - වාසය කරන, ලෙව්හි - ලෝකයෙහි, අවියත් දනෝ, - මෝඩ මිනිස්සු, විස-විෂ ඇතිගොර-ඝෝර වූ, උරග ගෙන - නයින් අල්වා ගෙන, උරේ ලා-කරේලා, කෙළනවුන් - ක්‍රීඩා කරන්නවුන් වැනිය.

භාවය:- ලෝකයෙහි තමන්ගේ භාර්‍යාව අදහා වෙසෙන මෝඩයෝ නපුරු ව විෂ සහිත නයින් කරෙහි ලා ක්‍රීඩා කරන්නවුන් මෙනි.

63. උරණ හැම කල - යෙහෙන් රකිතත් පණ සෙ නිතියෙන්
බඩුවක් මෙන් විකිණි - පහස දෙත් කාටවත් අහනෝ.

පදර්ථ:- හැම කල - හැම කල්හි, උරණ නොව - කෝප නොවී, නිතියෙන් - නිතරම, පණසෙ - පණමෙන්, යෙහෙන් - යහපත් සේ, රකිතත් - ආරක්ෂා කරතත්, අහනෝ-කාන්තාවෝ, විකිණි බඩුවක් මෙන්-විකිණීම සඳහා තිබෙන බඩුවක් මෙන්, කාටවත් - කිසිවෙකුටත් පහස දෙත් - ස්පර්ශය දෙත්.

භාවය:– නිතර පණමෙන් ආදරයෙන් රකින කාන්තාවෝ විකුණන ලද බඩුවක් මෙන් සිය පහස කාටත් දෙති.

64. බොරු මායම් කියා – සැබෑ වරදක් නැතැයි සාදත්
බොරු කා යම් දෙයක් - දුනත් ගෙන සහ තොසින් ළංවෙත්.

පදර්ථ:– බොරු මායම් කියා – බොරු වූ ඉච්චා බස් කියා, සැබෑ වරදක් – සැබෑ වරදක්, නැතැයි – නැත්තේ යයි, සාදති – සිද්ධ කරති. සොරු – හොර හිමියෝ, කා – අනුභව කොට, යම් දෙයක් – ඉතිරි වූ දෙයක්, දුනත් – දුන්නත්, ගෙන – එය රැගෙන, සහ තොසින් – සන්තෝෂයෙන්, ළංවත් – ළංවෙත්.

භාවය:– බොරු මායම් කියමින් කළ ඇත්ත වැරැද්ද ඔප්පු කෙරෙයි. හොර හිමියා කා ඉතිරි කළ දෙය සතුටින් පිළිගෙන උන් ළඟට යෙත්.

65. එකකු සෙවූ දෙය ගෙන – එකකු කවමින් සෙවෙත්
බැඳ පෙම්
කෙසරිඳු හෙළූ ගිජිඳු – සිවල් කාකා කාකායන මෙන්.

පදර්ථ:– එකකු – එකෙක්, සෙවූ දෙය – සැපයූ දෙය, එකකු – එකකුට, කවමින් – කවමින්, පෙම් බැඳ-පෙම් බැඳමින්, සෙවෙති – සේවනය කරති. කෙසරිඳු-සිංහයා හෙළූ – හෙලන ලද, ගිජිඳු – ඇතා, සිවල් කාකා-කැන-හිලුන් හා කවුඩන්, කකා යන මෙන් – අනුභව කරමින් යන්නා මෙනි.

භාවය:– එකෙකක් සැපයූ දෙය අනිකකුට කවමින් ඔවුන් හා පෙම් බැඳ සේවනය කරති. සිංහයා මරා දැමූ ඇතා සිවලුන් හා කවුඩන් කා දමන්නාක් මෙනි.

66. ඇස දුටු වරදවත්–බොරු යයි කියති බැහැර වැස වැස
තද බොරු විසට බා – මිහිකත් තොමෝ ගිලූ ලිය පෙර.

පදර්ථ:– ඇස දුටු වරදවත්–ඇසට දුටු වරද පවා, බැහැර වැස වැස – පිටත වාසය කරමින්, බොරු යයි කියති – (එය) බොරු යයි කියති. තද බොරු විස තබා – තද බොරු නමැති විෂ තබමින් ලියක් - ස්ත්‍රියක්, පෙර – පූර්වයෙහි, මිහිකත් තොමෝ – මහ පොළොව, ගිලූ – ගිල්වන ලදී.

භාවය:– පිට අය සමග වාසය කරමින් ඇසට දුටු වරද පවා බොරු යයි කියති. තද බොරු නමැති විෂට බියෙන් මිහිකත කාන්තාවක් ගිල ගත්තා ය.

මෙයින් බොරු කියූ චිංචමානවිකාව අදහස් කරයි.

67. දරු පෙම් ගුණ නුවණ - සමත් බැව් කියත් මෙම මළකල
තමු ලිය ගුණ ඇතත් - නො කිය වියතුනි මළත් උන්නත්.

පදර්ථ:- දරු පෙම් ගුණ-දරුවන් කෙරෙහි ප්‍රේමය ද ගුණය ද, නුවණ - ඥානය ද, සමත් බැව් - සමර්ථ භාවය දැයි යන, මෙම - මේ සියල්ල, මළකල - ස්ත්‍රීන් මළ කල කියති, වියතුනි - උගත්නි, තම ලිය - තම ස්ත්‍රියගේ ගුණ ඇතත් - ගුණ තිබුණත්, මළත් උන්නත්-මැරුණත් ජීවත් වුනත්, නො කිය - නොකියන්න.

භාවය:- දරුවන්ගේ පෙමේ ගුණ, නුවණ, සමත්කම් ආදිය මළකල්හි කිව්වත් මැනවි. වියත්නි තම භාර්‍යාවගේ ගුණ ඇතත් එය ජීවත් වුවත්, මළත් නො කියනු.

68 සිරිනිවන් කල ලිය - ලුහු දනටම ලොභ වඩත්
කිරෙන් බත් ලූවත් - සුනකයෝ කසලටම ලොබ වෙත්.

පදර්ථ;- ලිය - භාර්‍යාව, සිරිනි - සම්පත්තියෙන්, වන් කල; පොහොසත් වූ කාලයෙහි, ලුහු දනටම - හීන ජනයාට ම, ලොබ වඩත් - ලෝභ වඩත්. කිරෙන් - කිරි සහිතව, බත් ලූවත් - බත් දැම්මත්, සුනඛයෝ - බල්ලෝ කසලටම-අශුචියට ම, ලොබ වෙත්-ලෝභවෙත්.

භාවය;- කාන්තාව සම්පත්තියෙන් පොහොසත් වූ කල හීන ජනයාට ම ලෝභ වඩයි. කිරි සහිතව බත් දුන්නත් බල්ලෝ අශුචියට ලෝභ වෙති.

69. ඉසුරට ලොබින් ලිය - ලොවට වැඩ කරනුවන් වනසා
පඬි කාලිදසත් නසා - රජනුත් වැනසූ අඟනක්.

පදර්ථ!- ලිය කාන්තාව, ඉසුරට - සම්පත්තියට, ලොබින් - ලෝභයෙන්, ලොවට වැඩ කරනු වස් - ලෝකයට වැඩ කරන්නන්, වනසත් - විනාශ කරත්, අඟනක් - කාන්තාවක්, පඬි කාලිදසත් - පණ්ඩිත කාලිදසත්, නසා - විනාශ කොට. රජුනුත්-රජතුමාත්, නැසී - වැනසුවාය.

භාවය:- කාන්තාව සම්පත්තියට ලෝභය නිසා ලොවට වැඩ කරන්නන් වනසයි. කාන්තාවක් කවි කාලිදසත් විනාශ කොට රජතුමාත් වැනසුවාය.

70. ලිය ලියලයි තුරින් - තුර ඇද බද නිති තුඩු දිදී
එමෙන් ලිය දුටු දුටු - සලෙළුන් බද වෙනන් තුඩු දෙති.

පදර්ථ:- ලිය-වැල. තුරින් - ගසින්, තුර. ගස, බද - බදමින්, ලියලයි ලියලන්නේය. නිතර. නිරන්තරයෙන්, තුඩුදෙයි - තුඩු දෙයි. එමෙන්-එසේ, ලිය - ස්ත්‍රිය, දුටු දුටු, දක්ක - දක්ක, සලෙළුන් - සල්ලාලයන්, බද - බද ගනිමින්, වෙනත්-අන් දිසා වලට ද. තුඩු දෙත්-තුඩුදෙත්.

භාවය:- වැල ගසින් ගස වෙලා ගනී. එසේම කාන්තාව ද දක්ක දක්ක සලෙලා අල්ලාගනී. අනික් අයද අල්ලාගනී.

71. හොරා සුරා බී - උනත් රා මතය එළිවෙන මෙන්
සොරා ලියන් කරන-නොපනත් පැනෙන් සඳෙහිලප මෙන්.

පදර්ථ:- හොරා - හොරෙන්, සුරාබී - මත්පැන් බී. උනත් - උන්නත්, රා මතය - රාමදය, එළිවන මෙන් - එළිවන්නාක් මෙන්. ලියන්. ස්ත්‍රීන්, හොරා කරන-හොරෙන් කරන්නා වූ, නොපනත් - අයහපත් වැඩ, සඳෙහි - සඳ මඬලෙහි, ලප මෙන්, - ලපය මෙන්, පැනෙන් - පැනෙන්නේය.

භාවය:- හොරා සුරා බීවත් රා මතය එනවිට එය එළිවේ. රහසේ කාන්තාවක් කරන්නා වූ වැරදි ක්‍රියා සඳෙහි ලප මෙන් පෙනේ.

72. ළඳුන් වසඟයට - නො පැමිණෙනුවෝ ඇද්ද දෙ ලොවෙහි
සුරනා ඉසුරු තමා කනා ලිය ඉදිනි උසුලනුයේ.

පදර්ථ:- ළඳුන් - කාන්තාවන්ගේ. වසඟයට - වසඟත්වයට, නො පැමිණෙනුවෝ - නො පැමිණෙන්නෝ, දෙලොවෙහි, දෙ ලොවෙහි ම. ඇද්ද - ඇද්ද. සුරනා - දේව නායකයා, (ඊශ්වර) තමා - තමාගේ, කනාලිය-කන්‍යා කුමරිය, උසුලනුයේ - උසුලන්නේ, ඉදිනි, පසුවෙනි.

භාවය: කාන්තාවන්ගේ වසඟත්වයට දෙ ලොවෙ ම අය අසුවෙති ඊශ්වර දෙවියා තමන්ගේ කාන්තාව උසුලා-ගෙන සිටින්නේ පසුවෙනි.

73. ගෙය තුළෙහි ගිනිසිළු ඇතත් තම කඳ යනු දීපයෙහි
මැතිසෙන නොම දනත් - දීප බබලනු තෙදිනි නිරිඳුන්

පදර්ථ: ගෙය තුළ - ගෙය ඇතුලෙහි, ගිනිසිළු ඇතත් - ගිනි පුපුරු ඇතත්, තමකඳ - අන්ධකාරය, යනු - යන්නේ, දීපයෙනි - පහනෙනි, මැතිසෙන් - මන්ත්‍රී සේනාව, නො මැදතත් - කොතෙක් සිටියත්, දීප බබලනු - දීපය බබලන්නේ, නිරිඳුන් - රජුන්ගේ, තෙදිනි - තේජස නිසා ය.

භාවය: ඉග් ඇතුළෙහි ගිනි අඟුරු තිබුණත් අන්ධකාරය ගෙවී යන්නේ පහනකිනි. මන්ත්‍රී සේනාව කොපමණ තිබුණත් දිවයින බබලන්නේ රජුන්ගේ සේනාව නිසාය.

74. ඉසුරු අපමණ ඇති-රජුගේ රටටත් සෑල පැමිණේ
ඉසුරු උන් කෙලෙස පවා-දස ඉස් සසල නො කෙළදෙ?

පදර්ථ:- ඉසුරු - සම්පත්, අපමණ ඇති-අප්‍රමාණ ඇත්තාවූ, රජුගේ - රජතුමාගේ, රටටත් - රටට පවා සසල පැමිණේ - කරදර පැමිණේ, ඉසුරු - ඊශ්වර දෙවියා, උන් - උන්නා වූ, කෙලෙස පවා - කෛලාශය පවා, දස ඉස් - රාවණයා, සසල නො කෙළෙද-නො සෙල්විද?

භාවය:- අප්‍රමාණ සම්පත් ඇති රජුගේ රටටත් විපත් පැමිණේ. ඊශ්වරයා වාසය කළ කෛලාශය පර්වතය පවා රාවණා රජ නො සෙල්විද? සෙල්විය.

75. පුන් සඳට තෙවුනා - තරුත් අමරැස් පතුරුවන්නේ
නිරිඳුන් පවතිනා - පණත තමයි පවතින්නේ මැතිවරු.

පදර්ථ:- පුන්සඳට - පුන්සඳව, තෙවුනා - බබලන, තරුත් - තාරකාත්, අමරැස් - අමාරැස්, පතුරුවන්නේ - පතුරුවන්නේ ය. මැතිවරු පවතින්නේ - මන්ත්‍රීවරු පවතින්නේ ද, නිරිඳුන් - රජුන්, පවතින - පවතින්නා වූ, පණතමයි, පණතෙහිම ය.

76. උබය පස පහන්-නැතහොත් නොහොබි සුරවරන්ටත්
නිරිඳුන්ටත් නොහොබි- වියත් මැතිවර දෙපස නැතහොත්

පදර්ථ:- උබය පස - උබය පාර්ශ්වයෙහි, පහන් - පහන්, සුරවරන්ටත් - දෙවියන්ටත්, නො හොබි - නො හොබනේ ය. දෙපස-දෙපැත්තෙහි, වියත් මැතිවර - වියත් මන්ත්‍රීවරු, නැතහොත් - නො මැතිනම්, නිරිඳුන්ටත් - නො හොබි - නො හොබනේ ය.

භාවය:- දෙපස පහන් නැතහොත් එය දෙවියන්ට සුදුසු නොවේ. එසේම දෙ පස මන්ත්‍රීවරුන් නුවූවහොත් එය රජුට ද නො හොයි.

77. දුකකුදු නොවී කිසි-දෙ ලොව සැප මොක් පහන වියතුනි
දෙකකුදු නොම සිතා-පස් පවින් වැලකී කරව පින්.

පදර්ථ:- කිසි දුකකුදු නොවී-කිසි දුකක් නොමවී, දෙ ලොව උභය ලෝකයෙහි, සැපදුක් පතන වියතුනි - සැපදුක්

පතන්නා වූ උගතුනි, දෙකකුදු නොම සිතා - දෙකක් නො සිතා, පස්පවින් - පස් පවින්, වැළකී - වැලකී, පින් - පින්, කරව් - කරගනිවු.

භාවය:- කිසි දුකක් නො මැතිව දෙලොව සැප පතන්නෙහි නම් දෙකක් ගැන නොසිතා පස් පවින් වැලකී පින්කරව.

78. සව්සතට යහපත් ලෙසට දවසරින නුවණැතියෝ
මිය පරලොව ගියත් - සුරනර සැපත් ලබත් නිවනුත්.

පදර්ථ:- සව්සතට - සියලු සත්වයන්ට, යහපත් ලෙසට - යහපත් අයුරින්, දිවි ගෙවන - ජීවිතය ගෙවන්නා වූ, නුවණැතියෝ, ඥානවන්තයෝ, මිය පරලොව ගියත් - මිය පරලොව ගියත්, සුරනර සැපත් - දිව්‍ය මනුෂ්‍ය සැපත් හා, නිවනුත් - නිර්වාණයත්, ලබත් - ලබත්මැයි.

භාවය:- කාටත් යහපත්සේ දිවි ගෙවන නුවණැත්තෝ මියපර ලොව ගියත් දිව්‍ය මනුෂ්‍ය සැපත් හා නිර්වාණයත් ලබති.

79. බියෙන් තම වෙත පත්-සතට නො බවයියෙහෙන් රැකියෝ-
බියක් නොව කලෙකත්-විඳුති සුරසිරි මොක්ලබන තෙක්

පදර්ථ:- බියෙන් - භයෙන්, තම වෙත පත් - තමන් සමීපයට පත්, සතට - සත්වයන්ට, නොබවයි - බිය නොවෙවයි. යෙහෙන් - යහපත් සේ, රැකියෝ - ආරක්ෂා කළෝය. කලෙකත් - කිසි කලෙකත්, බියක් නොව - බයක් නොවී, මොක් ලබන තෙක්-නිවන් ලබන තෙක්, සුරසිරි දෙව් සැපත් විඳිති, විඳිති.

භාවය:- බිය නිසා තමන් වෙතට පැමිණි සත්වයාට බිය නොමවයි කියා හොඳින් රැක බලා ගත්තෝ ය. නිවන් ලබන තෙක් කිසි බියක් නො මැතිව දිව සම්පත් විඳිති.

80. නිරා දුකට වඩින -- දුකෙක් නැර දිවසින් බැලුවක්
ඊටත් අනතුරුව-දෙගුරුන් නො රැක බඩ වඩනවා,

පදර්ථ:- නිරාදුකට - අපාය දුකට, වඩිනා වැඩි, දුකෙක් - දුකක්, දිවසින් දිව්‍ය ඇසින් බැලුවත්, නැත - නැත්තේය. දෙ ගුරුන් නො රැක - දෙමාපියන් රක්ෂා නොකොට. බඩ වඩනවා බඩ වැඩිම, ඊටත් අනතුරුව - ඊටත් වඩා දුකෙකි.

භාවය:- දුක් අතර භයංකර දුක අපාය දුකයි. දිවසින් බැලුවත් එය එසේමය. දෙමාපියන් පෝෂණය නොකොට, තමන්ගේ උදරය පෝෂණය කරන්නා ඊටත් වඩා දුකක් විඳී.

81. සුතනැඹු රන් රුවන් – නොමඳ කෙත්වත් හා දැසි දසුන්
මේ සියලු තිබියදී – කළ පව් පිනයි කැටුව යන්නේ.

පදර්ථ:- සුතන් අඹු – පුත්‍රදාරාවන් ද, රන් රුවන් – රත්තරන් හා මැණික් ද, නො මඳ – බොහෝ වූ, කෙත්වත් හා දැසි දසුන් – කුඹුරු වතු, දාස දාසීන් ද; මේ සියලු – මේ සියල්ල, තිබියදී-තතරව, කළ-කරන ලද, පව් පින් – පව් හා පින, කැටුව යන්නේ – තමා සමඟ යන්නේ ය.

භාවය:- දරුවන්, අඹුව, රන්, රිදී, මැණික් ආදිය ද වතුපිටි කුඹුරු ආදිය ද, දාසි දසුන් ආදී මේ හැම දේ ක්ම අත්හැර තමා විසින් කරගත් පව් පින් තමා සමඟ යන්නේ ය.

82. දියෙහි ද මස් පියුම් – කොඳපුල් දුගඳ වන මෙන්
එක කුසෙහි උපනත් – සතන් ගුණ වෙන වෙනම පවතී.

පදර්ථ:- දියෙහි – ජලයෙහි වූ, මස් – මසුන් ද, පියුම් – නෙළුම් ද, කොඳ – කොඳ ය, උපුල් – උපුල් ය, යන මොවුන්ගේ ගඳ සුවඳ, වන මෙන් – වන්නාක් මෙන්, එක කුසෙහි – එක මව්කුස, උපනත්, සතන් – සත්වයන්ගේ, ගුණ – ගුණය, වෙන වෙන ම පවතී – වෙන් වෙන් ව පවතී.

භාවය:- දියෙහි හටගත් මසුන්ගේ ද, පියුම් කොඳ උපුල් යන මල්වල ද ගඳ හා සුවඳ ඇත්තාක් මෙන් එකම මව්කුස උපන් දරුවන්ගේ ද වෙනස ඇතිවේ.

83. සිය පණ සුතනුඹුවන් – සව්සිරි විකුම් පවතී නොසිතව
නුවණැසිනි විමසා – බැලුව සිනෙන් ලත් ඉසුරු වැනි.

පදර්ථ:- සිය පණ – තමන්ගේ පණ ද, සුතන් – දරුවන් ද, අඹුවන් – භාර්‍යාවන් ද, සව්සිරි – සියළු සැපත් ද, විකුම් වික්‍රමය ද, පවතී – පවතියි. නො සිතව – නො සිතන්න, නුවණැසිනි – නැණ ඇසින්, විමසා බැලුව – විමසා බැලුවහොත්, සිනෙන් – හීනෙන්, ලත් – ලැබූ ඉසුරු වැනි – සම්පත් වැනිය.

භාවය:- තමන්ගේ පණ, දරුවන්, අඹුවන් ද වික්‍රමය ද සියලු කල්හි ඒකාකාරයෙන් පවතී යයි නො සිතන්න. ඒවා නුවණින් විමසා බැලුවහොත් සිහිනෙන් ලබන සම්පත් මෙනි.

84. දුකක් සැලසුණු සත - තෙදැතියන් නම කියා ගැලවෙත්
සපුන් සත ඩැහැකල - ගුරුළිඳු අණින් විස බාන වැනි.

පදර්ථ:- දුකක් - දුකක්, සැලසුණු - සැලසුණු කල්හි, සත - මිනිස්සු. තෙදැතියන් - තේජස් ඇත්තන්ගේ, නම කියා නම ප්‍රකාශ කොට, ගැලවෙති - ගැලවීම ලබති, සපුන් සර්පයන්, සත - මිනිසුන්, ඩැහැකල - දෂ්ට කළ කල්හි ගුරුළිඳු අණින් - ගුරුළාගේ නියෝගයෙන්, විස බාන වැනි - විෂ බාන්නා වැනිය.

භාවය:- දුකක් යෙදුණු කල මිනිස්සු තේද ඇත්තන්ගේ නම කියා ගැලවෙති. සර්පයන් සපා කෑ කල්හි ගුරුළු රජුන්ගේ නම, යොදා, විෂබාන්නාක් මෙනි.

85. දත් හිවත් හැකිල - නෙත් කෙස් සුදුව ගත රැලි වැටී
එක් ලි එලීගෙන - සිත් තරුණ බව නොමයේ මිනිසුන්.

පදර්ථ:- දත් හී - දත් වැටී, වත් හැකිල - මුහුණ මැලවී, නෙත් කෙස් - නේත්‍රය හා කේශ, සුදුව - සුදුවී, ගත රැලි වැටී - ශරීරයේ රැළි වැටී, එක් ලි එලීගෙන - (එක ලීයෙක) සැරයටියෙහි එල්ලී එන්නේ නමුත්, සිත් තරුණ බව සිතෙහි තරුණකම, මිනිසුන්ගේ, නොමයෙ, නො යති.

භාවය:- දත් වැටී, මුහුණ ඇකිලී නෙත් හා කෙස් සුදුවී ඇඟ රැළි වැටී සැරයටිය වාරුවෙන් යන්නේ නමුදු සිතේ තරුණ කම මිනිසුන්ගෙන් පහ නො වේ.

86: රුසිරි යොවුන් ගුණ - නැණ සියල්ලෙන් නො අඩු වූ මුත්
නො දතොත් සිල්ප සත - සුවඳ නැති කැලමල සමවේ.

පදර්ථ:- රුසිරි - රූප සම්පත්තිය, යොවුන් ගුණ-තරුණකම, නැණ - නුවණ, යන සියල්ලෙන්ම - යනාදී සියල්ලෙන්, නො අඩුමුත්-අඩු නැතිමුත්, සිල්ප සත - ශිල්ප ශාස්ත්‍රය, නො දනිතොත් - නො දනිතොත්. සුවඳ නැති - සුවඳක් නැති, කැලමල් සම වේ - කැලමලක් සම වේ.

භාවය:- රූ සැපත, යොවුන් බව නුවණ ආදී සියල්ලෙන් අඩුවක් නැතත් ශිල්ප ශාස්ත්‍රයක් නො දනිතොත් ඒ මිනිසා සුවඳ නැති කැලමලක් මෙනි.

87. තමා තනි කරමින්-දෙන්නෙක් ම සතුරුව වෙසෙත් නම්
උපදෙසිනි කිසියම් - ඉන් එකෙකු ගත සිතුව පැදේ.

පදර්ථ:- තමා තනි කරමින් - තමන් තනි කරමින්, දෙදෙනෙක්, සතුරුව වෙසෙත් නම් - විරුද්ධව වාසය කරත්නම්, කිසියම් උපදෙසිනි - යම් කිසි උපදේශයකින්, ඉන් එකෙකු - එයින් එක් සතුරෙකු, ගත - යටත් කරගත් කල්හි, සිතුව-තමන් අදහස, පැදේ-ඉෂ්ට වේ.

භාවය:- දෙදෙනකු සතුරුව වසන කල්හි, එකෙක් යටත් කර ගැනීමට හැකි වූවොත් අතිකාගේ අදහසක් ඉෂ්ට වේ.

88. දිය තුළෙහි දී මුත් - ගොඩ පත් කිඹුලු දිය නො ලබත්
එමෙන් අරණ්‍යල උන්-රුපු නොතැන්පත්තෝ වැනසෙත්.

පදර්ථ:- දිය තුළෙහිදී මුත් - දිය ඇතුළෙහි දී හැර, ගොඩ පත් - ගොඩට පැමිණි, කිඹුලු - කිඹුලන්, දිය - ජය ග්‍රහණය, නො ලබත් - නො ලබති, එමෙන් - එසේ ම, අරණ්‍යවල උන් - ආරණ්‍යවල වාසය කරන, රුපු - සතුරෝ, නො තැන්පත්තෝ-නුසුදුසු තැන්වලට පැමිණ, වැනසෙත් - විනාශයට පත්වෙත්.

භාවය:- කිඹුලා ජයග්‍රහණය කරන්නේ දියෙහි දී පමණි. ගොඩහි දී උෟ ජය නො ලබති. එසේම ආරණ්‍යවල වාසය කරන සතුරෝ නුසුදුසු තැන්වලට පැමිණ විනාශයට යත්.

89. ඔවා දෙව පරහට - තමා සම්මතයෙහි පිහිටා සිට
දුසිරිත දනන් දෙන - ඔවා වැදි දන කියන බණ වැනි.

පදර්ථ:- තමන් සම්මතයෙහි-තමන් සම්මතයෙහි, පිහිටා සිට පිහිටා - ගෙන, පරහට - අන්‍යයන්ට, ඔවා දෙව - ඔවා දෙව්, දුසිරිත දනන් - නරකයෙහි යෙදුණු මිනිසුන් දෙන, ඔවා - අවවාදය, වැද්දන් - වැද්දන් කියනා, බණ වැනි කියන බණක් වැන්න.

භාවය:- අවවාද දිය යුත්තේ තමා එම අවවාදයෙහි පිහිටාය. තමන් දුසිරිතෙහි යෙදමින් අන්‍යයන්ට සුසිරිත් කිරීමට අවවාද දීම වැදි බණකි.

90. තමහට නො සරිවන - සත සබා මැද ඉඳුව කරබා
සඳ දැක කොඳ පුබුදු - වනු දැක පියුම් හැකිළෙන මෙන්

පදර්ථ:- කොද - කුන්දයන්, පුබුදුවන - ප්‍රබෝධ කරවන, සඳ දුක - චන්ද්‍රයා දුක, පියුම - නෙළුම්, හැකිළෙන මෙන් - හැකිළෙන මෙන්, තමහට - තමාහට, නො සරිවන - සමාන නොවන, සබා මැද - සභා මධ්‍යයෙහි, කරබා - නිහඬව, ඳදිනේ - ඉන්නේ ය.

භාවය:- සඳ රැසින් පිපෙන කොද මල් දුක නෙළුම් මල් හැකිළෙන්නාක් මෙන් තමාට සමාන නොවන මිනිසුන් ඇති සබා මැද නො දෙඩා හිඳුව.

91. නොයව සබ මැදයට - යම්සේ පැමිණියත් නොදෙව බස්
කියත මැදහත් වව - අත්නැ කියා නිරයේ නොවැටෙව.

පදර්ථ:- සබා මැද - අධිකරණයට, නොයව - නොයව, යම් සේ ගියත් - යම් හෙයකින් ගියත්, බස් නොදෙව - බසක් නොදෙව, කියත - කියතහොත්, මැදහත්වව මැදහත් බවට පැමිණෙව, අත්නැ - නීතියට අයත් නොවන, දේ, කියා - කියමින්, නිරයේ - නරකයේ, නො වැටෙව - නො වැටෙව.

භාවය:- උසාවි කිසිවට නොයව. යම් විදියකින් යන්නට සිදුවහොත් එවන කථා කළයුතු නො වේ. කථා කිරීමට සිදු වුවහොත් මධ්‍යස්ථව කියව. නීති විරෝධී දේ කියා නිරයේ නො වැටෙව.

92. අවිදුන්ට කිසියම් සලසා - පමණ කර ඉඳින සත්
වලන් කරනා මැටි තබා - බඳුන් කරනව වැල්ලෙන්.

පදර්ථ:- අවිදුන්ට - නුවණුන්ට, කිසියම් සලසා - යම්කිසි වැඩක් සලසා දී එය, පමණ කර - ප්‍රමාණ කොට, ඉඳින සත් - ඇඳින තැනැත්තා, වළන් කරනා - වළන් සාදන්නාවූ, මැටි තබා—මැටි හැර, වැල්ලෙන්—වැලිවලින්, බඳුන් - භාජනයන්, කරන එව - සාදන්නාවුන් මෙනි.

භාවය:- නුගතුන්ට යම්කිසි වැඩක් සලසා දී එය පමණ කොට ඇඳින තැනැත්තා වලන් මැටි ඉවත දමා වැල්ලෙන් බඳුන් තනන්නාක් මෙනි.

93. සුදන සහවීමට - වැඩිය යහපත් සොරුන් ඉතකම්
සොරු දන පැහැර යෙත්—සුදන මනතුට රැගෙන යනුවෙක්.

පදර්ථ:- සුදන - සජ්ජනයන් හා සහවීමට වැඩිය - සහාය වීමට වඩා, සොරුන්-චෞරයන් හා-ඉතකම්-හිතවත්

භාවය, යහපති - යහපත් වන්නේ ය. සොරු චෞරයෝ, ධන - වස්තුව, පැහැරයෙත් - පැහැර ගෙනයත්, සුදන - සුජනයෝ, මනතුට - චිත්ත සන්තෝෂය, රැගෙන යනුවෙත් - යත්තෝ වෙත්.

භාවය:- සුදනන් සමඟ එක්වීමට වඩා සොරුන්ගේ හිත-වත්කම යහපත් ය. සොරු ධනය පැහැර ගෙනයති. සුදනෝ සිතෙහි සතුට පැහැර ගෙනයති.

94 තද රුදු ගුණැති හට - තද රුදු කෙනෙක් පිහිට වන්නේ
සඳහුට වයිරිව - සොරුනට අඳුරු පිහිට වනු මෙනි..

පදාර්ථ:- තද - දැඩි, රුදු ගුණැතිහට - රෞද්‍ර ගුණ ඇත්තාහට, පිහිට වන්නේ - ප්‍රතිෂ්ඨා වන්නේ ය. තද - දැඩි, රුදු - රෞද්‍ර. කෙනෙකි, සඳහුට - චන්ද්‍රයාට, වයිරිව,- වෛරව, අඳුරු - අන්ධකාරය, සොරුනට-සොරුන්ට, පිහිටවන මෙනි - පිහිට වන්නාක් මෙනි.

භාවය:- තද රුදු ගුණැති කෙනෙකුහට පිහිට වන්නේ එවැනි තද කෙනෙකි. සඳට සතුරුවූ අඳුර සොරුන්ට පිහිට වන්නාක් මෙනි.

95. සුරතුර බදුරුකළ - සිතුමිණ සුරභී දෙන සිරිදේ
තෙරුවන් වැඳ අදර කළ - සතට සවසිරින් මොක් වේ.

පදාර්ථ:- සුරතුරු - කල්ප වෘක්ෂය, බදුරු කළ - භද්‍රඝටය, සිතුමිණ - චින්තා මාණික්‍යය, සුරබි දෙන - සුරභිධේනුව, යන වස්තු, සිරිදේ - සම්පත් දේ, තෙරුවන් වැඳ, තෙරුවන් වඳිමින්, අදර කළ - ආදර - කළා වූ, සතට - සත්වයාහට, සියලු සිරින් යුත්; සියළු සිරියෙන් යුතු, මොක් වේ. නිර්වාණය පැමිණේ.

භාවය:- කල්ප වෘක්ෂය, භද්‍රඝට, චින්තා මාණික්‍යය. සුරභිදෙනුව යන වස්තු සම්පත් දේ. තෙරුවන් වඳිමින් ආදරය කරන අයට සියලු සිරින් යුත් නිවන් සැපත ගෙන දේ.

96. සී ගජ රන් රුවන් - නාලිය පුවක් සත් සත්
පත් යම් රටෙක සත් - ආදර කෙරෙත් නොමඳ සතුටින්,

පදාර්ථ:- සී - සිංහයා, ගජ - ඇත්ය, රන් - රත්රන්ය, රුවන් - මැණික් ය, නාලිය - බුලත් ය, පුවක්-පුවක් ය. සත්, ඡත්‍රය, යන සත් - මේ සත, යම් රටෙක පත්-යම්

රටකට අයත් ද? සත් – එහි වසන්නෝ; නොමඳ– බොහෝ වූ සතුටින් – සන්තෝෂයෙන්, අදර කෙරෙත් ආදර කෙරෙත්.

**භාවය:–** සිංහ, ඇත්, රන්, මැණික්, මුලත්, ඡත්‍රය, පුවක්ය යන සත යම් රටක වේ ද ඒ රට වැසියන් බොහෝ සන්තෝෂයෙන් වාසය කරති.

**97.** සිත් නැති ගල් ගුහා – පවා තපසුන් හට පිහිට වේ
දෙ ලොවෙහි වැඩ දනත් – ලෙව නො රකිනේ
කිම්ද වියතුනි

**පදර්ථ:–** සිත් නැති – සිතක් නැති, ගල් ගුහා පවා – ගල්ගුහා පවා, තපසුන්ට – තාපසයන්ට, පිහිට වෙ – පිහිටවන්නේය. දෙ ලොවෙහි – දෙලොවෙහි ම, වැඩ දනත් – වැඩ දනගෙන, වියතුන් – වියත්නි, ලෙව නොරකිනේ, ලෝකය නොරකිනේ, කිම් ද? – කවරක් නිසාද?

**භාවය:–** සිතක් නැති ගල්ගුහා පවා තාපසයන්ට පිහිට වේ. දෙ ලොවෙහි වැඩ දන ගෙන වියත්නි, ලෝකය නො රකින්නේ කුමක් නිසාද?

**98.** මහ පින් ඇති දනෝ – උතුම වෙත් ඉසුරෙන් සුරන්ටත්
නර වෙසින සක් පුර – රජ නො කෙළේ ද? මන්දතු රජ.

**පදර්ථ:–** මහපින් ඇති දනෝ – මහත් භාග්‍ය ඇති අය, ඉසුරෙන් – සම්පතින් සුරන්ටත් – දෙවියන්ටත්, උතුම වෙත් – ශ්‍රේෂ්ඨ වෙත්, නර වෙසින – මිනිස් වෙසින්, සක් පුර – ශක්‍ර පුරයෙහි, මන්දතු රජ – මහා මන්ධාතු රජතුමා, රජ නො කෙළේද – රාජ්‍ය නො කෙළේද?

**භාවය:–** මහ පිනැති මිනිස්සු සම්පත් විඳීමෙන් දෙවියන්ටත් වඩා ශ්‍රේෂ්ඨ වෙති. මිනිස් වෙසින් ම සක්පුර වාසය කළ මහාමන්ධාතු රජතුමා දෙව් සැපත් වින්දේ ය. මන්ධාතු කථාව මෙසින් සිහියට නැගෙයි.

**99.** ණය ගැන්ම ගව බිම – විකිණීම හා වෙර වදන් දෙස්
මේ පසකළ සතන් – කුලය නසින් පසඩ සඳ මෙන්.

**පදර්ථ:–** ණය ගැන්ම – ණයට ගැන්ම ද, ගව බිම – බිම හා ගවයන් විකිණීම, වෙර වදන් – වෛර වචනයෙහි, දෙස් – දෙස් ද, යන මේ පස කළ සතන්, මේ කරුණු පස කරන ලද තැනැත්තා, පසඩ සඳමෙන් - අටවක සඳ මෙන්, කුලය නසිනේ – වංශය විනාශ කරන්නේ ය.

භාවය:- ණය ගැනීම, වතු හා ගවයන් විකිණීම, වෛර වචන භාවිතය, අනුන්ගේ දෙස් කීම යන මේ කරුණු පහ කරන තැනැත්තා අටවක සඳමෙන් තම වංශය විනාශ කෙරේ.

100. තෙදතියහට විරිදූ - රුදු ගුණැතියෝ හැර නොයෙත් දුර
නුබමිණට ගනඳුර බිඳේ - සඳ සහ වසන විලසින්.

පදර්ථ:- තෙදතියහට - තේජස් ඇත්තන්ට, විරුදූ-විරුද්ධ වූවෝ, ගුණැතිය හැර - ගුණ ඇත්තන් පහකොට, දුර නොයෑත් - දුර නොයෙත්, නුබමිණට - සූර්‍යයාට, බිඳෙන - බිඳෙන්නාවූ, ගනඳුර - ඝනාන්ධකාරය, සඳ සහ - චන්ද්‍රයා සමග, වසන විලසින් - වාසය කරන මෙනි.

භාවය:- තේජස ඇතියන්ට විරුද්ධ වූ රෞද්‍ර ගති පැවතුම් ඇත්තෝ ඔවුන් අත්හැර දුරට දනාෙයති. සූර්යයාගෙන් බිඳෙන අඳුර චන්ද්‍රයා සමග එක්වන්නා මෙනි.

101. ඇතිතෙක් ම කඩතෙල් - අඳුර දුරුකර පහන් බැබළේ
පින් ඇති තෙක් - දනෝ සව්සිරිනි පරසිදුව බබළත්.

පදර්ථ:- පහන - පහන, කඩ තෙල් - පාන් තිරය හා තෙල් ඇතිතාක්, අඳුර දුර හැර - අන්ධකාරය දුරු කොට, බැබළෙ - බැබළේ, දනෝ - මිනිස්සු, පින් ඇති තෙක් - පුණ්‍ය ඇතිතාක්, සව් සිරින් - සකල සම්පත්තියෙන් පරසිදුව - ප්‍රසිද්ධව, බබළත් - බබළති.

භාවය:- පහන තිරය හා තෙල් ඇතිතාක් අඳුර දුරු කොට බැබළේ. මිනිස්සු පින් ඇතිතාක් සියලු සම්පතින් ප්‍රසිද්ධව බබළත්.

102. උතුමෝ පවා ලොව - නිවැරදි සතුන් නමුත් බඳවත්
කළ වරදට රවුළු - දියරම නො බැඳ විද සමුදුර.

පදර්ථ:- ලොව - ලෝකයෙහි, උතුමෝ පවා - උත්තමයන් පවා, නිවැරදි සතුන් නමුත් - වැරැද්දක් නො මැති සතුන් නමුත්, බඳවති - බඳිති, රවුළු කළ වරදට - රාවණයා කළ වරදට, රම - රාමයා, සමුදුර - මහ මුහුදෙහි, දිය ජලය, නො බැඳ වී ද - නො බැඳවීද.

භාවය:- ලෝකයෙහි ශ්‍රේෂ්ඨයන් පවා නිවැරදි සතුන් මුත් වැරැද්දක් නො මැතිව බඳිති. රාවණා කළ වරදට රාමයා මහ මුහුදෙහි ජලය අවුරා හෙයක් බැඳවීය.

103. හැම සැපම ඇතිකැන්-මුළු ලොවම නැති නැණිනු බැලුවත්
කප්තුර පවා ඇති - උතුරුකුරු දිව යකුන් බියාවි.

පදර්ථ:- හැම සැපම - සියළු සැපත් ම, ඇති තැන් - ඇත්තාවූ ස්ථාන, නුවණින් බැලුවත් - බුද්ධියෙන් බැලුවත්. මුළු ලොවම නැති - මුළු ලෝකයේ ම නැත්තේ ය. කප් තුර පවා ඇති - කල්ප වෘක්ෂය පවා ඇති, උතුරු කුරු දිව - උතුරු කුරුදිවයින, යකුන් - යකුන්ගෙන්, බියවේ - බිය ඇති වේ.

භාවය:- සියලු සැපත් ඇති තැනක් මුළු ලොව ම නැත. කල්ප වෘක්ෂ ඇති උතුරු කුරු දිවයිනෙහි යක්ෂ භය ඇති වේ.

104. සව් සිප් දත් වියත් - පඬිවර වෙතට පැමිණි අවියත්
පහන රිවි පහනේ - අබිමුවෙහි පහනෙව නො බබළත්.

භාවය:- සව් සිප් දත් - සියලු ශිල්ප දත්තා වූ, වියත් පඬිවර වෙතට - උගතුන් වෙතට, පැමිණ - පැමිණි, අවියත් - නූගත්තු, පහන පහන රිවි පහනේ - උදයෙහි සූර්යයා ලෝකයෙහි, අබිමුවෙහි - අභිමුඛයෙහි, පහන එව් පහනක් මෙන්, නො බබළත් - නො බබළති.

භාවය:- ශිල්ප ශාස්ත්‍ර යහපත් සේ දන්නා උගතුන් වෙත පැමිණි නූගත්තු සූර්යයා උදවූ විට පත්තු කළ පහනක ස්වරූපය දරයි.

105 පින් පව් කළ සතන් - එක තැනදීම බලා දනගන්නේ
යාන වාහනයෙහි - ඉඳිනවුන් සමහරෙක් උසුළත.

පදර්ථ:- පින් පව් කළ සතන් - පින් කළාවූ ද පව්කළාවූ ද, සත්වයෝ, එක තැනදීම - එක් ස්ථානයේදීම, බලා - බලමින්, දන ගන්නෙ - දනගන්නේ ය. සමහරෙක් - සමහරෙක්. යාන වාහනයෙහි ඉඳිනවුන් - යානවාහනයෙහි, හිඳින අය සමහරෙක් සමහර කෙනෙක්, උසුළත් - උසුලා ගෙනයති.

භාවය;- පින් කළ අයත්, පව් කළ අයත් එකම තැනකදී බලා ගත හැක. පින් කළ අය යාන වාහනවල අරා ගමන් යති. පව් කළ අය ඒ වාහන ඇදගෙන යති.

106. නිවයෝ වැඩ බස් - කිවත් නො අසත් අසත් සුදනෝ
නොඅසත් ගැරඬි මතුර - අසත් උරගිඳු කරම ඇතියෝ

පදර්ථ:- නිවයෝ - පහත් අය - වැඩ බස් - අභිවෘද්ධි වචන, කිවත්, කීවත්, නො අසත් - නො අසති, සුදනෝ සත් ජනයෝ, අසත්-අසති, ගැරඬි - ගැරඬියෝ, මතුර මන්ත්‍ර, නො අසත් - නො අසති, උරගිඳු කරම ඇතියෝ නාග රාජයා වැනි අය, අසත් - අසති.

භාවය:- හීන පැවතුම් ඇතියෝ වැඩදායි වචන කීවත් නො අසති. සත් පුරුෂයෝ එබඳු වචන අසති. ගැරඬි මන්ත්‍ර නො අසති. නාග රාජයෝ එබඳු මන්ත්‍ර අසති.

107. සබා බී රැක වූ – නැණැතිය උගත් නො මද සොඳසිප්
රුපු අබිමුවට පත් - දුබලයකු අත අනගි අවි වැනි

පදර්ථ:- සබා බී රැක වූ - සබාවට බිය වූ, නැණතිය-ප්‍රාඥයා, නො මද - බොහෝ කොට, උගත්,-උගත්තා වූ සොඳ-යහපත් වූ, සිප් - ශිල්ප, රුපු - සතුරන්ගේ, අබිමුවට පත් - ඉදිරියට පැමිණි, දුබලයකු - දුර්වලයකු; අත- අතෙහි, අනගි - අනර්ඝ වූ, අවි වැනි - ආයුධ සමානය.

භාවය:- සබාවට බිය වූ නැණවතා ඉගෙන ගත් බොහෝ හොඳ ශිල්පය සතුරන් ඉදිරියට ගිය දුබලයෙකු අතෙහි ඇති වටිනා අවියක් වැනිය.

108 කිසියම් කම් කරන - කරව නුවණින් බලා විමසා
එකකට පටන් ගෙන - පසුව ඉඳ තැවෙනු අවිදූ වෙත්.

පදර්ථ:- කිසියම් කම් - කිසියම් කටයුත්තක්, කරන - කරන කල්හි, නුවණින් - බුද්ධියෙන්, බලා විමසා - බලා පරීක්ෂා කොට. කරව - කරව්, එකකට පටන් ගෙන එක කටයුත්තකට පටන් ගෙන, ඉද - හිඳිමින්, පසුව පසුව, තැවෙනුවෝ - තැවෙත්තෝ, අවිදුවෝ - මෝඩ වෙති.

109 හුදුළුවන් කිසියම් - කරලා ගෙන සැපෙන අවියත්
තමා තම කරටම - නැගෙනුව පයත්නය කරන වැනි.

පදර්ථ:- කිසියම් කම් - කිසියම් කටයුත්තක්, හුදුළුවන් - තමා විසින් නො කළ හැකි වූයේ, කරලා ගෙන - කරට ගෙන, සැපෙන හැපෙන්නාවූ, අවියත් - මෝඩයා, තමා - තෙමේම, තම කරටම - තමන්ගේ කරට ම, නැගෙනුව - නැගීමට, පයත්නය කරන වැනි උත්සාහ කරන්නා වැනිය.

භාවය:- තමන්ට කළ නො හැකි වූ යමක් කරට ගෙන ඒ සඳහා තැත් කරන මෝඩයා තමාගේ කරටම නැගීමට තැත් කරන්නෙක් මෙනි.

110. පිනින් පැමිණුණු දෙය - මද යයි සිතා ඉසුරු පතනුවෝ
උවදුරු ඇති ගඟක - පීනුම් නො දන වැටෙනුවෝ වෙත්.

පදර්ථ:- පිනින් - පුණ්‍යයෙන්, පැමිණුණු දෙය - ලැබුණු දෙය, මද යයි සිතා - මද යයි කල්පනා කොට, ඉසුරු

පතනුවෝ - සම්පත් පතන්නෝ, උවදුරු ඇති - උපද්‍රව ඇති, ගහක - ගහක, පිනුම් නො දන්නා - පිනන්ට නො දන, වැටෙනුවෝ වෙත් - වැටෙන්නෝ වෙත්.

භාවය:- පිනෙන් ලැබුණු දෙය මද යයි කල්පනා කොට සම්පත් පතන්නෝ උපද්‍රව ඇති ගහක පිනන්ට නො දන වැටෙන්නෝ වෙත්.

111. උස රුකට නො නැඟෙව් - තම බල විතරටම වදන් දෙව්.
නුවණැතියන් වදන් - ගනුව නො ගනුව නො මිනිසුන් බස්.

පදර්ථ;- උස රුකට - උස ගසට, නො නැගෙව් - නො නැඟෙව්, තම බල විතරටම - තමන්ගේ ශක්ති ප්‍රමාණයට ම, වදන් - වචන, දෙව් - දෙව්, නුවැණැතියන් ඥානවන්තයින්ගේ, වදන - වචන, ගනිව් - ගනිව්, නො මිනිසුන් බස්, මිනිසුන් නො වන්නවුන්ගේ වචන නො ගනිව් - නොගනිව්.

භාවය:- උස් ගසට නො නැඟෙව්. තමන්ගේ ශක්ති ප්‍රමාණයට පමණක් වචන කියව්. නුවණ ඇත්තන්ගේ වචන අසව්. නො මිනිසුන්ගේ වචන නො අසව්.

112. රැදින දිවා මැද - තනිමඟ පරඟනන් සොරුන් පසු
නො යව් ගිය අවැඩක් - පැමිණේය අද සතුනි සැකනැත්.

පදර්ථ:- සතුනි - සත්වයෙනි, රැදින - රෑ කාලයෙහි, දිවා මැද දහවල් කාලයෙහි, තනිමඟ - හුදකලා මාර්ගයෙහි ද, පරඟනන් - පර ස්ත්‍රීන්ගේ හා, සොරුන් - සොරුන්ගේ පසු - පස්සෙහි ද, නොයව් - ගමන් නොකරව්. ගිය, ගමන් කළේ නම්, අවැඩක් - අනර්ථයක්, පැමිණේ - පැමිණෙන්නේ ය. සැක නැති - සැකයක් නැත්තේය.

113. දුටත් රත්රන් ඇණ - රනැයි නස්නා විනා නො දනේ
නිමලව නෙත් ඇතත් - රුවන් පෙනෙනුයෙ දීපයෙන් මේ.

පදර්ථ:- රත්රන් ඇණ - රත්රන් ආභරණ - දුටත්, දුටුවත් - නස්නා විනා - උරගෑමෙන් මිස්ව, රනැයි - රත්රන් යයි, නොම දනේ - නොම දනන්නේය. නෙත් - නේත්‍රයන්, නිමලව - නිර්මලව ඇතත්, රුවන් - රත්නයන්, පෙනෙනුයේ, පෙනෙන්නේ, දීපයෙන්මෙ - මේ පහනින්ය.

භාවය:- රත්රන් ආභරණ දුක්කත් උරගෑමෙන් තොරව මේ රත්රන් යයි නො දනේ. ඇස් යහපත් වුවත් රන්බව දත හැක්කේ එම උරගලෙනි.

114. දනවත් තැනට ලගු - වත් දීයෙනුත් ලබත් දන දන
ලොව දුරු හළ ඉරුට - කරන පුදයෙහි පහන් ලනමෙනි.

පදර්ථ:- දන - ජනයෝ, දනවත් තැනට - ධනවතුන්ට, ලගුවත් - සුළු වස්තු, දීමෙනුත් - දීමෙන්, දන - ධනය, ලබත් - ලබත්මැයි, ලොව - ලෝකයෙහි, අඳුරු හළ අන්ධකාරය දුරු කළා වූ, ඉරුට - සූර්යාට, කරන පුදයෙහි - කරන්නාවූ පූජාවෙහි, පහන් ලනමෙන්, පහන් දල්වන්නාක් මෙනි.

භාවය:- මිනිස්සු ධනවත් අයට සුළු දේ දීමෙන් ධනය ලබති. ලෝකයෙහි අඳුරු දුරු කළ සූර්යයාට කරන පූජාවෙහි පහන් දල්වන්නාක් මෙනි.

115 තපසුන් ගුරුන් තම - දෙගුරුන් පඬිවරන් සුරන්හට
නොම කොට බැති අදර - නින්ද කරනුහට නොවේ වැඩ.

පදර්ථ:- තපසුන් - තාපසයන්ට, තම ගුරුන් - තමන් ගේ ගුරුවරයන්හට, දෙගුරුන් - දෙමාපියන්ට, පඬිවරුන් - පඬිවරයන්ට. සුරන්හට - දෙවියන්හට ද, ආදර බැති ආදර භක්ති. නොමකොට - නොකොට, නින්ද කරනුහට, නින්ද කරන අයට, වැඩ නො වේ - වැඩ සිදු නො වේ.

භාවය:- තාපසයන්, ගුරුවරුන්, දෙමාපියන්, පඬිවරුන් දෙවියන් බැති අදර නොකොට නින්ද කරන අයට වැඩ සිදු නො වේ.

116 කුළු දෙස් ද කේලම් - බොරු උඩුගු බස් සකට නින්ද
අනඟ රස මුසුකතා - කුරිරු බස් නො කියව් වැනසෙතක්.

පදර්ථ:- කුළු දෙස් - බොරු සාක්ෂි, කේලාම් - කේලාම් ද, බොරු - මුසාවාද ද, උඩගු බස් - උඩගු වචන ද, අනඟරස මුසු කතා - රාගික කථා, කුරිරු බස් - කෲර වචන. වැනසෙතක් - විනාශ වෙතත්, නො කියව් නො කියව්.

භාවය:- බොරු සාක්ෂි, කේලාම්, බොරු, උඩගුබස්, රාගික කථා, කෲර වචන තමා වැනසෙතත් නො කියව්.

117. නො මද අකුසල් කොට - අවිදු විදු සව්සත කරන පින්
දුගද වළෑ හී සිට - ඇඟ පිට සුවඳ අලෙව් කරනෙව්.

පදර්ථ:- නො මද - බොහෝ, අකුසල් කොට - අකුසල් සිද්ධ කොට, අවිදු - නො දන්මෙන්, විදු - දන්නාලද, සව් සත කරන පින් - සියළු සත්වයන් කරන්නා වූ පින්.

දුගඳ – දුර්ගන්ධ වූ වළෑ – වළක, වැටී සිට, වැටීමෙන් ඇඟ පිට – ඇඟෙහි, සුවඳ අලෙවි කරන එව, සුගන්ධය ආලේප කරන්නාක් මෙනි.

භාවය;– බොහෝ අකුසල් කොට නො දැනීම නිසා විඳුනා ලද සියලු සතුන් කරන පින් දුගඳ වළෙක වැටී සිට ඇඟෙහි සුවඳ කවන්නාක් මෙනි.

118. නොකා නොදී ඉසුරු – තිබුණොත් පිනැතිහට පැමිණේ ගොදුරෙහි රස යෙදූ – දසන් හැර දිව රස විඳිනා මෙන්.

පදර්ථ:- ඉසුරු – සම්පත්, නොකා නොදී – භාවිත නො කොට පරිත්‍යාග නො කොට, තිබුණොත් – ඉතුරු කළ හොත්, පිනැතිහට – පින් ඇත්තාහට, පැමිණේ – පැමිණෙන්නේය. ගොදුරෙහි – ආහාරයෙහි, රසයෙදූ – රසයෙන් යෙදූ, දසන් හැර – දත් හැර, දිව - දිව, රස විඳින මෙන් – රස විඳින්නාක් මෙනි.

භාවය:- පරිභෝගත් දීමත් නොකොට එකතු කළ ධනය පින් ඇතියකුහට යන්නේය. ආහාරයෙහි යෙදූ රස දත් හැර දිව රස විඳින්නා මෙනි.

119. සව ඉසුරු අඩු වැඩි – වේය ගුණ නැණැති උතුමන්ටත් සිත අද නඳ කරන – පුතුන් සඳ අඩු වැඩි වන මෙන.

පදර්ථ:- ගුණනැණ ඇති – ගුණ නුවණ ඇත්තාවූ, උතුමන්ටත් – උත්තමයනටත්, සව ඉසුරු – සියලු සම්පත්, අඩු වැඩි වේය – අඩු වැඩි වන්නේ ය, සිත – සිත, නඳ කරවන – සතුටුකරන්නාවූ. පුතුන් සඳ – පූර්ණ චන්ද්‍රයා, වැඩීමෙන් – වැඩිවීමෙන්, අඩු වන මෙන – අඩු වන්නාක් මෙනි.

භාවය:- ගුණ නැණැති උතුමන්ටත් සියළු සැපත් අඩු වැඩි වෙයි. සිත් සතුටු කරන පුන්සඳ වැඩීමෙන් අනතුරුව අඩු වන්නා මෙනි.

120. දහම් දන විඳු සොඳ – අබය බත් වත් බුලත් කර පෙම දෙන මෙකී දන දන – දනයයි ලෙව කියත් පඬුවෝ.

පදර්ථ:- දන – මිනිසා, දහම් – ධර්මය, දන – ධනය ද, සොඳ විඳු – යහපත් විද්‍යාවන් ද, අබය – අබය, වත් – වස්තුව, බත් – බත්ය, බුලත් – බුලත්ය, මෙකී දන – යන දෙය, පෙම් කර – ආදර කොට, දෙන දෙන්නේ නම්, ලෙව – ලෝකයෙහි, පඬුවෝ – පණ්ඩිතයෝ, දනයයි - දන නම් යයි කියත් – කියති.

භාවය;– ධර්මය, දනය, විද්‍යාව, අබයය, බත්ය, වස්තුවය, බුලත්ය යන ද්‍රව්‍යයන් ආදරයෙන් දෙන්නේ නම් ඒ දීම දනයයි, පඬුවෝ කියති.

121. රාජවිල් නෙත්තම් – කෙළන දන හා දූත අහනන්
සොරුන් රා සොඬුනුත් – මොවුන් සෙවුවන් නැසෙනු
නියතයි.

පදර්ථ:– රාජවිල්, එනම් ක්‍රීඩාව, (දම් ඇදීම වැනි) ද නෙත්තම් කෙළින දන – නෘත්‍ය කරන ජනයා ද, දූත අහනන් – වෙසඟනන් ද, සොරුන්, සොරුන් ද රා සොඬුනුත් රා සොඬුන් ද යන මොවුන්–මේ අය. සෙවුවන්–සේවනය කරන අය, නැසෙනු – නැසීම, නියතයි – නියතමය.

භාවය:– රාජවිල් ක්‍රීඩාව, නෘත්‍ය කාරයන් ද වෙසඟනන්, සොරුන් රා සොඬුන් යන මොවුන් සේවනය කරන අය වැනසීම නියතමයි.

122. නුවණැසෙකි සුවියත් – සත සමඟ වනු ඇසෙකි දනහට
නො නැසෙන මෙ ඇස් දෙක – ඇති සත සමඟ යනු
වරද නැත.

පදර්ථ:– දනහට – මිනිසාට, නුවණ ඇසෙක් වේ – නුවණ නමැති ඇසෙක් වේ. සුවියත් සත සමඟ – මනා උගත් අය සමඟ, වනු, එක්වීම – ඇසෙකි – තවත් ඇසෙකි, නො නැසෙන මේ ඇස් දෙක – නො නැසෙන මේ දෙ ඇස, ඇති සත සමඟ – ඇත්තාවූ සත්වයා සමඟ, යනු – යෑම, වරද නැති – වරදක් නැත්තේය.

භාවය:– මිනිසුන්ට නුවණ නමැති එක් ඇසෙකි. උගත් ජනයා එක්වීම තවත් ඇසෙකි. නො නැසෙන මේ දෑස ඇති ජනයන් සමඟ යාම වරදක් නැත.

123. දුදනන් සමඟ මිතුරුව – ඉඳින නො දනුම් විතරට
ගුණ නැණැති සුදනන් – සමඟ සතුරුව උනත් වැඩ වේ.

පදර්ථ:– දුදනන් සමඟ – දුර්ජනයන් සමඟ, මිතුරුව – මිත්‍රව, ඉඳින විතරට – වාසය කිරීමට වඩා, ගුණ නැණැති– ගුණ නුවණ ඇත්තාවූ, සුදනන් සමඟ, සතුරුව– සතුරුව, උනත් – වාසය කළත්, වැඩ වේ– අභිවෘද්ධියක් සිදුවේ.

භාවය:– දුර්ජනයන් හා මිතුරුව වාසය කිරීමට වඩා ගුණ ඇති සත් පුරුෂයන් සමඟ සතුරුව වාසය කිරීමත් තමන්ගේ අභිවෘද්ධියට හේතු ය.

124. නොමඳ පිරිවර යස - ඇතත් වළකන්නට බැරි වන දෙය
තරු සෙන් පිරිවැරූ - සුපුන් සඳ රහු ගහණ නො කෙරේද?

පදර්ථ:- නොමඳ පිරිවර යස - බොහෝ වූ පිරිවර, ඇතත් - සිටියේ වී නමුත්, වළකන්ට බැරිවන දෙය - වළක්වන්ට නො හැකි වන දෙය, තරු සෙන් පිරිවැරූ- තාරකා සමූහයක් පිරිවැරූ, සුපුන් සඳ - පූර්ණ චන්ද්‍රයා, රහු - රාහු, ගහණ නො කෙරේද - රාහු අල්ලා ගනු නො ලැබුවේ ද?

භාවය:- කෙනෙකුට නොයෙක් පිරිවර ඇතත් සිදුවන දෙය වැළැක්වීමට නො හැක. තාරකා සමූහයක් පිරිවරාගත් පුන්සඳ රාහු අල්ලා ගනු නො ලැබේ ද?

125. අදමින් ලත් ඉසුරු - නො වෙති සොරුන් සෙවූ දන මෙන්
දහමින් ලත් ඉසුරු — සැපත් එ සුරිඳු ලත් ඉසුරු මෙන්.

පදර්ථ:- අදමින් — අසත් ධර්මයෙන්, ලත් - ලැබුවා වූ, ඉසුරු - සම්පත්, සොරුන්, - සොරුන්, සෙවූ- සොයන ලද, දන මෙන් - වස්තුව මෙන්, නො වෙති- නො පවතී, ලත් - ලැබූ, ඉසුරු - සම්පත්, එ සුරිඳු- ශක්‍රදේවේන්ද්‍රයා, ලත් - ලැබූ, ඉසුරු මෙන් - සම්පත් මෙන් වේ.

භාවය:- අධර්මයෙන් ලැබූ වස්තුව සොරුන් සෙවූ ධනය මෙන් ස්ථිරව නො පවතී ධර්මයෙන් ලැබූ වස්තුව ශක්‍රයා විසින් ලබන ලද වස්තුව මෙන් වේ.

126. වැව අමුණු පිරි දිය - පිටවාන හැර සුරැකි කළ මෙන්
දනවත් නැණැතියෙනි - දන් දී දෙ ලොව වැඩ සිදුකරව.

පදර්ථ:- වැව අමුණු පිරුණු පිරි දිය - වැව අමුණු පිරුණු ජලය පිටවාන හැර - සොරොව්වෙන් බස්වා, සුරැකි කළ- මනාව ආරක්ෂා කළා මෙන්, දනවත් නැණැතියෙනි- ධනය ඇති ඥානවන්තයෙනි, දන් දී- දන් දී, දෙ ලොව වැඩ - දෙ ලොවෙහි වැඩ, සිදු කරව - සිද්ධ කරව.

භාවය:- වැව අමුණු දිය පිරුණු කල වතුර බස්වන්නා වූ සොරොව්වෙන් වතුර බස්වා දන රැක ගන්නා සේ ධනය ඇති නැණැතියෙනි දන් දී දෙ ලොව ම වැඩ සිද්ධ කරව.

127. ගුරු නිරිඳු මිතුරන් - තම ලිය මවු මෙ කීවන්
තම මවු ලෙස සිතා - පවතිත් නැණැති සුදනෝ.

පදර්ථ:- තම - තමන්ගේ, ගුරු - ගුරුවරයාගේ ද, නිරිඳු- රජුගේ ද, මිතුරන් - මිතුරන්ගේ ද, ලිය - භාර්යාව හා ලියමවු - භාර්යාවගේ මවු ද, මෙ කිවන් - මෙකී භාර්යාවො තම මවු ලෙස - තමන්ගේ මෑණියන් ලෙස, සිතා, සලකා, නැණැති සුදනෝ - බුද්ධිමත් යහපත් ජනයෝ, පවතිත් - පවතිත්.

භාවය: ගුරුවරයාගේ ද, රජුගේ ද, මිතුරාගේ ද, භාර්යා- වනුත්, තම භාර්යාවගේ මෑණියනුත්, තමන්ගේ මව මෙන් සලකා බුහුමන් කිරීම නැණැති යහපත් ජනයන්ගේ පැවැත්මයි.

128. නිදන දනහට දෙන — දෙය මැයි ලොවෙහි උතුම් වියතුනි ඉසුරුමත් හට දෙන — දෙය වපුරන වැනි කෙතෙහි බිජු.

පදර්ථ:- වියතුනි - උගතුනි, ලොවෙහි - ලෝකයෙහි, නිදන දනහට - වස්තු නැති ජනයාට, දෙන - දෙන්නාවූ, දෙය - වස්තුව, උතුම් - උතුම්ය, ඉසුරුමත් හට - සම්පත් ඇති තැනැත්තාට, දෙන දෙය - දෙන්නා වූ දෙය, කෙතෙහි - කුඹුරෙහි, බිජු - බිත්තර වී, වපුරන වැනි - වපුරන්නාක් මෙනි.

භාවය:- ලොව දුප්පත් ජනයාට දෙන්නාවූ දන ඉතා උතුම ය. සම්පත් ඇති තැනැත්තාට දෙන දෙය කුඹුරෙහි බිත්තර වී වපුරන්නා මෙනි. වැඩිපුර ලබා ගැනීමට.

129. තර තිරව වැට කළ-කෙතට සිවුපා නො විදිනා මෙන් පිරිසිදුව පින් කළ - සතන්හට දුක් නොවෙ කලෙකත්.

පදර්ථ:- තර තිරව - ස්ථිර සාරව, වැට කළ - වැට බැඳි පසු, සිවුපා - සිවුපාවුන්, කෙතට - නො වදිනා මෙන් - කුඹුරට නො වදිනා මෙන්, පිරිසිදුව - පරිශුද්ධව, පින් කළ - පින්කළා වූ, සතන්හට-සත්වයාහට, කලෙකත් - කිසි කාලයකත්, දුක් නො වේ - දුකක් නො වේ.

භාවය:- හොඳට වැට බැන්දට පසු සිවුපාවුන් කුඹුරට නො වදින්නා මෙන් පිරිසිදුව පින් කළ අයට කිසිම කලෙකත් දුකක් ඇති නො වේ.

130. දළ අං නිය විසැති - සත දුදන ලිය රදුන් සිඳු ගං කලෙකත් කා කිවත්-කෙරේ අපද පමණ නො කරව.

සදර්ථ:- දළ - දළය, අං - අංය, නිය - නිය පොතුය, විස ඇති - විස ඇත්තා වූ, සත - සත්වයෝ, දුදන - දුර්ජනයෝ ද, ලිය - කාන්තාවෝ ය, රදුන් - රජ්ජුරු

වන් ද, සිඳු ගං – මුහුද හා ගංගා ද, කා කිවිත් – කවුරු කිවත්, කලෙකත් – කිසියම් කලෙකත්, අපද – විපත්, කෙරේ – සිදු කෙරේ, එනිසා පමණ නොකරව – එනිසා ප්‍රමාණ නො කරව.

භාවය:– දත්, අං, නිය වල විෂ ඇති සත්වයෝ ද, දුර්ජනයෝ ද, කාන්තාවෝ ද, රජවරු ද, මුහුද හා ගඟ ද කවුරු කිවත් ලැබුණු විපටක කරදර කරති. එ නිසා මොවුන් ගැන විශ්වාස නො කරව.

131. ලොබ දෙස් මෝ මදමත්-යතිහට තපස්කම් කිසි නැති
මෙකී සිවු ගුණ නොමැති – සතහට තපස්කම් ඇති.

පදර්ථ:– ලොබ – ලෝබකම, දෙස් – තරහ ගතිය, මෝ – මෝඩකම, මදමත් – මදයෙන් මත් වූ, මෙකී සිවුගුණ – මෙකී සිවුගුණ ඇ, ඇති – ඇත්තා වූ, යතිහට-යතිතුමාට තපස්කම් කිසි නැති – තපස්කමක් නැත, මෙ සිවු ගුණ නොමැති. සතහට – මිනිසුන්ට, කිසි – කිසියම්, තපස්කම් – තපස් බවක්, ඇති – ඇත්තේ ය.

භාවය:– ලෝබකම, තරහබව, මෝඩ කම හා මදයෙන් මත් බව යන සිවු කරුණ ඇත්තාහට තපස්කමක් නැත. මෙ අවගුණ නො මැත්තාහට තපස්කම් ඇත.

132. බෝ දරු වදති වග – එක දරු වදන ගව වගා වෙත්
සත් කුල නසනු වන්-කුල නැසෙත් සත් වග වගා වේත්.

පදර්ථ:– වග – දිවි දෙන්නු, බෝ දරු – බොහෝ දරුවන්, වදත් – වදත්, එක දරු වදන – එක දරුවකු වදන, ගව – ගව සමූහයා, බෝ වෙති – බෝවෙත්, සත් කුල නසනුවත් – යහපත් සතුන් නසන්නන්ගේ, කුල–කුලය, නැසෙත් – විනාශයට යති. සත්වග – යහපත් අයගේ වග, වැගිය – වගාවෙත්, දියුණු වෙත්.

භාවය:– ව්‍යාඝ්‍ර දෙන්නු දරුවන් බොහෝ කොට වදති. ගව දෙන වදන්නී එක දරුවෙකි. ගව සමූහය බෝවෙති. දිවි වර්ගය බෝ නොවේ. යහපත් සතුන් විනාශ කරනවුන්ගේ කුලය විනාශයට යේ.

133. සුරාපානය කළ-පව්වුන්ට දෙන ඔවා මුසු බස්
දිය තුළ වන් එකකු-පුළුස්සන වැනි ගිනිසුලක් ගොස්.

පදර්ථ:– සුරා පානය කළ-මත්පැන් පානය කළ, පව්වුන්ට – පාපිෂ්ඨයන්ට, දෙන – දෙන්නා වූ, ඔවා මුසු බස් –

අවවාද මිශ්‍ර වචනය ගිනි සුළක් - ගිනි සුළක්, ගොස් - ගොසින්, දිය තුළ - දිය යට, වන් - සිටින, එකකු - එකෙක්, පුලුස්සන වැනි - පුළුස්සන්නාක් මෙන් ය.

භාවය:- රා බී ගත් අයට දෙන අවවාදය දිය යට සිටින කෙනෙකු ගිනි හුලක් ගෙන පුළුස්සන්නා වැනි දෙයකි.

134. සුරා සොඬෙක නොබී- මිනිස් ගුණැතිව උන් විටෙක වත්
අනෙකකු සුරා බී -විඳින දුක් නුදුටුවොද වරෙකත්.

පදර්ථ:- සුරා සොඬෙක් - සුරා සොඩ කෙනෙක්, නොබී - සුරා පානය නො කොට, මිනිස් ගුණ ඇතුව - මිනිස් ගුණ ඇතිව, උන් විටෙකවත් - උන් කල්හි, අනිකකු - අනික් කෙනෙකු, සුරා බී - රා පානය කොට, විඳින දුක් - විඳින්නා වූ දුක්, වරෙකත් - එක් වරක්වත්, නුදුටුවොද - නො දක්කේ ද?

භාවය:- සුරා සොඩ කෙනෙක් සුරා පානය නො කළ වේලාවක මිනිස් ගුණ ඇතුව වාසය කරන විටක අනික් කෙනෙක් රා බී විඳින දුක් එක් වරක්වත් නුදුටුවේ ද?

135. නොකා නොබී ඉසුරු-තබා දිවි රකින අය අවියත්
කෙත රැකවලට බැඳි - මිනිස් රුවැති තණින් බැඳලූ.

පදර්ථ:- නොකා නොබී - නොකා නොබී, ඉසුරු තබා - සම්පත් තබා ගෙන, දිවි රකිනා අවියත් අය - ජීවිතය ආරක්ෂා කරන මෝඩ අය, කෙත - කුඹුරෙහි, රැක වලට - ආරක්ෂා වලට, තණින් - තණකොළ වලින්, බැඳලු - බඳින ලද, මිනිස් රූ වැනි - පඹයන් වැනි ය.

භාවය:- නොකා නොබී ධනය තබා ගෙන දිවි රකින්නා වූ මෝඩයෝ කුඹුරෙහි ආරක්ෂාවට පිදුරුවලින් හදන ලද පඹයන් වැන්නෝ ය.

136. යමෙකුගේ සැපතක් - හඩව හඬවා ගතොත් බලයෙන්
හඩ හඬා ඔහුත් තම - ඉසුරු දෙයි පන් සිය පනස් වර.

පදර්ථ:- යමෙකුගේ සැපතක් - යම් කිසිවෙකු ගේ සැපතක්, බලයෙන් - බලහත්කාරයෙන්, හඩ හඩවා ගතොත් - හඩවමින් ගතහොත්, ඔහුත් - ඔහුත්, හඩ හඩා - හඩමින්, තම ඉසුරු - තමන්ගේ සම්පත්තිය, පන්සිය පනස්වර - පන්සිය පනස් වාරයක්, දෙයි - දෙන්නේ ය.

භාවය:- කෙනෙක් තව කෙනෙකුගේ සැපතක් බලහත්-කාරයෙන් හඩව හඩවා ගතහොත් (සංසාරයේ දී) හඩමින් තම සම්පත් පන්සිය පනස් වාරයක් දෙයි.

137. ලොවට ඉත නො වනා-දෙය කෙරෙති ඉසුරට පැමිණියෝ
ලොවට උතුම් ගොවිඳු-පවා තයි යහන සැතපෙනුයේ.

පදර්ථ:- ඉසුරට පැමිණියත් - සම්පත්තියට පැමිණියත්, ලොවට - ලෝකයට, ඉත නොවන - යහපත් නොවන, දෙය - දෙය, කරති - කරති, ලොවට - ලෝකයට, උතුම් - උත්තම වූ, ගොවිඳු පවා - විෂ්ණු පවා, තයි යහනා-සර්ප යහනෙහි, සැතපෙනුයේ-සැතපෙන්නේ ය.

භාවය:- ඉතා උසස් බවට ගියෝ ලෝකයට සතුට නූපදින්නා වූ දේ ද කරති. ලෝකයට උතුම් වූ විෂ්ණු දෙවියා පවා නයි යහනෙහි සැතපෙන්නේ ය.

138. නිසල නොම වනසත-නො මඳ සව්සිප් නොයෙක් උගතත්
සසල ගුණ නො හරිත්-දියෙහි පිළිබිඹු පෙනෙන සඳ මෙන්.

පදර්ථ:- නිසල නොමවන සත - නිශ්චල නොවන්නා වූ සත්වයා, නො මඳ - බොහෝ වූ, සව් සිප් - සියලු ශිල්පයන්, නොයෙක් උගතත් - නොයෙක් දේත්, උගතත් - ඉගෙන ගත්තත්, දියෙහි පිළිබිඹු පෙනෙන සඳ මෙන් - දියෙහි සෙවනැල්ලේ පෙනෙන චන්ද්‍රයා මෙන්, සසල ගුණ- චංචලත්වය, නොහරිත් - අත් නොහරිත්.

භාවය:- තහවුරුකමක් නැති මිනිස්සු බොහෝ ශිල්පයන් ඉගෙන ගත්තත් දියෙහි සෙළවෙන පිළිබිඹු ඇති සඳ මෙන් ඒ සැලෙන ගතිය අත් නො හරිත්.

139. මහ සැපතට පැමිණි - මදින් මද යයි සිතා වැනසෙත්
මුළු දෙව් රජ ලොබින්-මන්දතු රජ මෙලොව හුණු මෙන්.

පදර්ථ:- සමහරෙක් මහ සැපතට - මහත් වූ සම්පත්තියට, පැමිණි - පැමිණ, එය මදින් මද යයි - මදයයි, සිතා - සිතමින්, වැනසෙත් - විනාශයට පත්වෙත්. මුළු දෙව් රජ ලොබින් - මුළු මහත් දිව්‍ය රාජ්‍යසම්පත් ලෝබයෙන්, මන්දතු රජ - මන්ධාතු රජතුමා, මෙලොව - මේ ලෝකයට, හුණු මෙන් - ගිලිහුණා මෙනි.

භාවය:- සමහරෙක් මහත් සම්පත්තියට පැමිණ එයත් මදි යයි සිතමින් ටිකෙන් ටික විනාශයට යති. මුළු මහත් දිව්‍ය රාජ ලාභයෙන් මන්දතු රජ මේ ලොවටම වැටුනා මෙනි.

140. මසුරු දනෝ දන්-දෙන්ට නොකියති ඇතත් යදිහට
ගොළුවන්ට මුළු දිව-ඇතිවත් කතා නො කියන මෙන්.

පදාර්ථ:- මසුරු දනෝ - මසුරු මිනිස්සු. ඇතත් - ධනය ඇතත්, දන් දෙන්ට - දන්දීමට, නො කියත් - නො කියත්. ගොළුවන්ට - ගොළු වූවන්ට. මුළු දිව ඇතත් - සම්පූර්ණ දිවක් ඇතත්, කතා නො කියන මෙන් - කථා නො කියන්නාක් මෙනි.

භාවය:- මසුරු මිනිසුන්ට ධනය ඇතත් දන්දීමට අකමැතිය. ගොළුවන්ට සම්පූර්ණ දිවක් තිබුණත් කථා කිරීම අපහසුවාක් මෙනි.

141. මසු බෝ වටී මුතු - සිපි නොම වටි මුතු ලකක් වත්
එමෙන් ලුහු දන පුත් - පෙරද කළ පිනෙන් මෙන්.

පදාර්ථ:- මුතු - මුතු කැටයක්, බෝ මසු වටී - මසුරන් බොහෝ ගණනක් වටින්නේය. සිපි - සිප්පි කටුවක්, මුතු - මුතුවලින්, ලකක්වත් - ලක්ෂයෙන් කොටසක් වත්, නො වටී - නො වටින්නේ ය, එමෙන් - එපරිද්දෙන්, ලුහු දන - මෝඩ මිනිසුන්ගේ, පුත් - පුත්‍රයෝ, පෙරද - පූර්ව ජාතිවල, කළ පිනෙන් - කරන ලද පිනෙන්, බබළති - ආලෝකවත් වෙති.

භාවය:- මුතු කැටයක් මසුරන් බොහෝ ගණනක් වටින්නේය. සිප්පි කටුවක් මුතු වලින් ලක්ෂයෙන් කොටසක්වත් නො වටින්නේය. එසේම පොඩි මිනිසුන්ගේ දරුවෝ පෙර කළ පින්වලින් බබළති.

142. කම්මැලිහට සිල්ප - නොසිදුවේ එබැවින් නිදනවේ
නිදනට මිතුරු නැත් - එහෙයින් සිතට සැප නැත.

පදාර්ථ:- කම්මැලිහට - අලසයාට, සිල්ප නො සිදුවේ - සිල්ප සිදු නොවන්නේ ය. එබැවින් - එනිසා, නිදන වේ - දුප්පතෙක් වේ, නිදනට - දුප්පතාට, මිතුරු නැත් - මිත්‍රයෝ නො වෙති. එහෙයින් - එනිසා, සිතට - චිත්තයට, සැප නැත් - සැපයක් නැත.

භාවය:- කම්මැලියාට ශිල්පයක් නො සැදේ. එනිසා දුප්පතෙක් වේ මය. දුප්පතාට මිත්‍රයෝ නැත්තේය. එනිසා සිතට සැපයක් නැත.

143. කිරි සමුදුර ඉඳත් - උවිඳු නොබනුය ගනු නොමැතිවත්
මසුරු වූ දනන් වෙත-උනත් දන දෙ ලොවට වැඩක් නැති.

පදාර්ථ:- උවිඳු - විෂ්ණු තෙම, කිරි සමුදුර - කිරි සයුරෙහි, ඉඳත් - වාසය කළත්, එය නො බනුය - එය නො බොන්නේය, වත් - එහි ඇති වස්තුව, ගනු නොමැත -

ගැනීමක් නො මැත්තේය. මසුරු වූ දනන් - මසුරු මිනිසුන් වෙත, දන උනත් - ධනය ඇතත්, දෙලොවට - දෙ ලොවට, වැඩෙක් නැත - වැඩෙක් නැත්තේය.

භාවය:- විෂ්ණු කිරි සමුද්‍රයෙහි වාසය කළත් එහි වූ චතුර නො බොයි. එහි ඇති වස්තුව ද නො ගනී. මසුරු මිනිසුන් ළඟ ධනය ඇතත් දෙ ලොවට වැඩක් නැත.

144. සිවුපා සතුන් වුව - දුරු දුරැර කෙත රකිත වැට මෙන්
දස දමිනි පවතින - නිරිඳුන් වෙතින් සත දුක් නිවේ.

පදර්ථ:- සිවු පා සතුන් - සිවුපා සතුන්ගෙන් වන, උවදුර - උපද්‍රව, දුරැර - දුරු කොට, කෙත - කුඹුර, රකින - රකින්නා වූ, වැට - වැට මෙන්, දස දමින් පවතින - දස ධර්මයෙන් පවතින්නා වූ, නිරිඳුන් - රජුන්, වෙතින් - සමීපයෙන්, සත - සත්වයන්ගේ, දුක් - දුක, නිවේ - නිවෙන්නේය.

භාවය:- සිවුපා සතුන්ගෙන් වන කරදර දුරු කොට කෙත රකින වැට මෙන් දස ධර්මයට අනුකූලව පවතින්නා වූ රජවරුන් නිසා ජනතාවගේ දුක නිවෙයි.

145. බාල රිවි වැද හිවි - යමකුළෙන් අඳුරු දුරුවන මෙන්
දස දමිනි පවතින - නිරිඳුන් වෙතින් සත දුක් නිවේ.

පදර්ථ:- බාල රිවි වැද - අරුණ සූර්යාගේ රශ්මිය වැදී, යමකුළෙන් - අවරගිරින්, අඳුරු - අන්ධකාරය, දුරුවන මෙන් - පහව යන්නා මෙන්, මැදහත් - මධ්‍යස්ථව, නිරිඳුන්ට - රජවරුන් කරා, පැමිණ - පැමිණි, සතුරෝ - හතුරෝ, බිඳි - භේදව, දුරුවෙත් - දුරුවන්නාහ.

භාවය:- බාල සූර්යාගේ රශ්මිය වැද අවරගිරින් අඳුර දුරුව යන්නා සේ මැදහත් රජවරුන්ට, විරුද්ධව පැමිණි සතුරෝ පලායති.

146. ලොව රකින නිරිඳෝ-සතට දුකුවන්ට ඉඩ නොහරිත්
ලොව රකිනා මෙරදු-කලට වැසි වස්වන විලස්මෙන්.

පදර්ථ:- ලොව - ලෝකය, රකින - රකින්නා වූ, නිරිඳෝ - රජවරු, සතට - සත්වයාට, දුකුවන්ට - දුක්වන්ට, ඉඩ නො හරිත් - ඉඩ නො හරිත්. ලොව රකින මෙරදු - ලෝකය ආරක්ෂා කරන්නා වූ මේඝය, කලට - සුදුසු කාලයට, වැසි - වර්ෂාව, වස්වන - වස්වන, විලස්නෙන් - විලාශයෙන්.

භාවය:- ලෝකය රකින රජවරු ජනයන්ට දුක්වීමට ඉඩ නො දෙති. ලෝකය රකින වලාකුළ කලට වැසි වස්නාක්මෙනි.

147. වන දවන ගිනි කඳ-සිහිල නල වසඟව නිවෙනු මෙන්
කඳ තෙදැති නිරිඳෝ ගුණැති මැතිවර වදන පිහිටත්.

පදර්ථ:- වන දවන - කැලෑව දවන්නා වූ, ගිනි කඳ - අග්නි ස්කන්ධය, සිහිල් නල - ශීතල පවනට, වසඟව - යටත් වී, නිවෙනු මෙන් - නිවෙන්නාක් මෙන්, තද තෙදැති - තදවූ තේජස් ඇති, නිරිඳෝ-නිරිඳෝ, ගුණැති - ගුණවත්, මැතිවර - ඇමතියන්ගේ, වදන - වචනයෙහි, පිහිටත් - පිහිටත්.

භාවය:- වනය දවන ගිනි කඳ සිහිල් සුළඟට යටත් ව නිවී යන්නාක් මෙන් තද තෙදැති රජවරු ගුණවත්ව ඇමති-යන්ගේ වචනයෙහි පිහිටත්.

148. සිනෙන් ගැලවෙන්ට-නොපිළිවන කොතැනක සැඟවුනත්
එමෙන් නිරිඳුන්හට - වරද කළවුන් වදින තැන් නැති.

පදර්ථ:- සිනෙන් - හීනයෙන්, ගැලවෙන්නට - ගැලවීම සඳහා, කො තැනක සැඟවුනත් - කෙබඳු සැඟවීමටවත්, නො පිළිවන - පුළුවන් කමක් නැත. එමෙන් - එසේ, නිරිඳුන්හට - රජුන්ට, වරද කළවුන් - වරද කළවුන්, වදින - වදින්නාවූ, තැන් - ස්ථාන, නැත - නැත්තේය.

භාවය:- කො තැනක සැඟවුනත් සීන දකීමෙන් ගැලවෙන්ට පුළුවන් කමක් නැත. එමෙන් රජවරුන්ට වරද කළවුන් යා හැකි තැනක් නැත.

149. තම හිමිහට දුකක්-පැමිණි විට නො හැර ගතහොත් දුක්
මෙලොව යසසිරි වේ - පරලෙව්හි සුර සැපත් අත්වේ

පදර්ථ:- තම හිමිහට - තමන්ගේ ස්වාමියාට, දුකක් පැමිණි විට - දුකක් පැමිණි කල, අත් නො හැර - අත් නො හැරීම, දුක් ගතහොත් - දුක් ගතහොත් (ඔහුට) මෙලොව - මේ ලෝකයෙහි, යස සිරි වේ - යස සම්පත් වේ. පරලෙව්හි - පරලොව, සුර සැපත් - දිව්‍ය සම්පත්, අත් වේ - අත් වන්නේය.

භාවය:- තමන්ගේ හිමියාට දුකක් පැමිණි විට, අත් නො-හැරීම දුක් ගතහොත් මේ ලෝකයෙහි කීර්ති හා ශෝභාව අයත් වේ. පරලොව දෙව් සැපත් අත් වේ.

150. නිරිඳුට දෙ ලොව වැඩ-සිදුවේ නුවණැති ඇමතියන්ගෙන්
මහ ඔසු පඬි නැණින් - රජුට වූ වැඩ අසව් දහමින්.

පදර්ථ;- නුවණැති ඇමතියන්ගෙන් - ඥානවන්ත ඇමතියන් නිසා, නිරිඳුට - රජුට, දෙලොව - දෙ ලෝකයෙහි, වැඩ

අභිවෘද්ධිය, සිදු වේ - සිද්ධ වේ. මහඔසු පඩි නැණින් - මහෞෂධ පණ්ඩිතයන්ගේ නුවණ නිසා, රජුට - රජුට, දහමින් - ධර්මයෙන්, සිදුවූ, වැඩ, දියුණුව, අසව්, අසව්.

භාවය:- බුද්ධිමත් ඇමතියන්ගෙන් රජුට දෙ ලෝ වැඩ සිදු වේ. මහෞෂධ පණ්ඩිතයන්ගේ නුවණ නිසා රජ තුමාට සිදු වූ වැඩ දහමින් අසව්.

151. මෙ බඳු බෝසත් ගුණ - යුත් කෙළෙහි ගුණදත් රජුන් හා සතුරෝ මිතුරු වෙත් - ඔවුන් වග පිළිවෙළින් පවතී.

පදර්ථ:- මෙබඳු - මෙ වැනි, බෝසත් ගුණ - බෝධිසත්ව ගුණයුත්, රජුන් හා, සතුරෝ - විරුද්ධකාරයෝ, මිතුරු වෙත් - මිත්‍රයෝ වෙත්. ඔවුන් වග - ඔවුන්ගේ කුලයද, පිළිවෙළින්, පිළිවෙලින්, පවතී - පවතින්නේය,

භාවය:- මෙබඳු උතුම් ගුණ ඇති බෝධි සත්වයෝ ගුණයෙන් යුතු වූ රජුන් සමඟ සතුරෝ වුවද මිතුරු වෙත්. ඔවුන්ගේ කුලය ද පිළිවෙළින් පවතී.

152. නුවනැස මැතිවරන් - කීමෙහි යෙදෙනු රජුට නියමයි සිතැති කම් සිදුවේ - සත් කෙත් වැවේ කුළුණ වැස්සෙන්.

පදර්ථ:- නුවණැති මැතිවරන් - නුවණ ඇති මැති වරයන්ගේ; කීමෙහි - අවවාද දීමෙහි, යෙදෙනු - යෙදීම, රජුට - රජුන්ට, නියමයි - නියම වේ. සිතැතිකම් - සිත්හි ඇති කම්, සිදුවේ - සිද්ධ වේ. කුළුණ වැස්සෙන් - කරුණා නමැති වැස්සෙන්, සත් - පුරුෂ නමැති කෙත්, කුඹුරු, වැවේ - වැවෙන්නේය.

භාවය:- නුවණ ඇති මැතිවරයන්ගේ කීම නියමයෙන් පිළිපදින රජුන්ගේ සිතැඟි ඉටුවෙයි. ජනතා නමැති කුඹුර කරුණා නමැති වැස්සෙන් වැවේ.

153 ලෙව් රකින නිරිඳුන් - කිපුන පව් කළ දනෝ වැනසෙත් සත් කෙත් වත් වවන - මේ නො මඳ වැස්සෙන් නසන මෙන්.

පදර්ථ:- ලෙව් රකින - ලෝකය ආරක්ෂා කරන, නිරිඳුන් - රජුන්, කිපුණ - කිපී ගියකල, පව් කළ දනෝ - පව් කළ අය, වැනසෙත් - විනාශයට සත්, සත් කෙත් වත් වවන - යහපත් කෙත්වත් වවන්නාවූ, මේ - මෙසය, නො මඳ වැස්සෙන් - තදින් වැසීම නිසා, නසන මෙන් - නසන්නාක් මෙනි.

භාවය:- ලෝකය රකින රජුන් කෝප වූ විට පව්කළ අය වැනසෙති. වැස්ස නිසා කුඹුරු, වතු සශ්‍රී කවේ, එම වැස්ස වැඩි වූ විට ඒ කෙත් වත් විනාශ වේ.

**154.** පරහට නො දී දුක්-දුදනන් වෙතට නො ගොස් දහමෙන්
දවස පසු වේ නම් - මහත් ඉසුරට වැඩි වියත් හට.

පදාර්ථ:- පරහට - අනායයන්ට, දුක් නොදී - දුක් නොදී, දුදනන් වෙතට - දුර්ජනයන් ළඟට, නො ගොස්, ගමන් නො කොට, දහැමෙන් - ධර්මිකව, දවස පසුවේ නම් - දවස ගෙවේ නම්, වියත්හට - උගතුන්ට මහත් ඉසුරට වැඩි - මහත් සම්පත්තියකට වැඩිය.

භාවය;- අනුන්ට දුක් නොදී දුදනන් හා ඇසුරට නො ගොස් දැහැමින් කල් ගෙවේ නම් උගතුන්හට එය මහත් ධනයකට වැඩි වේ.

**155.** පසිඳු පිරිසිදු කුල මුත් - මැද දුදනකු පැමිණියොත්
සිරිසඳ සඳ රුවන් - අමාදුක් සිඳුනි විස නැගීමෙන්.

පදාර්ථ:- පසිඳු - ප්‍රසිද්ධ, පිරිසිදු කුල මුත් - පරිසිදු කුලයක වුවත්, මැද - මැදට, දුදනයකු පැමිණියොත් - දුර්ජනයකු පැමිණියහොත්, සිරිසඳ - සිරිකතය, සඳ රුවන් - චන්ද්‍රයාය, අමාදුන් - අමෘතය දුන්, සිඳුනි - කිරි සයුරෙන්, විස නැගීමෙන් - විෂ උද්ගතවීමෙන් විනාශ වන්නාක් මෙනි.

භාවය:- ප්‍රසිද්ධ ගුණවත් කුලයක හෝ දුර්ජනයෙක් උපන් හොත් එම කුලය විනාශයට යේ. ශ්‍රී කාන්තාව, චන්ද්‍රයා, අමා ආදී උසස් දේ උපන් සාගරයෙන් විෂ හට ගෙන විනාශයට ගියා මෙනි.

**156.** මහ පොළොවට වඩා-මහත් වත් නැති මෙමුළු ලොවෙහි
ඊටත් මහත් වේ - තමා ඉසුරුව වරද ඉවසුම්.

පදාර්ථ:- මේ ලොවෙහි - මේ මුළු ලෝකයෙහි, මහ පොළොවට වඩා, මහා පෘථිවියට වඩා, මහත් වත්- මහත් වස්තුවක්, නැති - නැත්තේය. තමා ඉසුරුව - තමා බලවත් නායකයෙක් වී, වරද ඉවසුම් - වරද ඉවසීම - ඊටත් මහත් වේ - ඊටත් වඩා මහත් වේ.

භාවය;- මේ ලෝකයේ ඉතාම විශාල වස්තුව මහ පොළොවයි. තමා බලවත් නායකයෙක් වී වරද ඉවසා නම් එම (මහ පොළොවට) ද වඩා මහත් වේ.

**157,** බබළන රන් මෙරත් - කුල පවුවලින් තෙවුන විලසින්
ලොවැතිනිරිඳුන්ටත්-ඇමැතිවරුඇතිහොතිනේහොබනේ

පදාර්ථ;- බබළන, බබළන්නා වූ, රන් මෙරත් - මහ මේරුවත්, කුල පවුවලින්-සප්ත කුට පර්වතයන්ගෙන්, තෙවුන විල සින් බබළන පරිද්දෙන්, ලො වැති ලෝකයෙහි, ඇත්තා වූ, නිරිඳුන්ටත් - රජුන්ටත්, ඇමැතිවරු - අමාත්‍යයෝ, ඇතිහොත්-ඇතොත්, ඉන් - එයින්,හොබනේ - බබළා.

භාවය:- බබළන මහා මේරුවත් සප්තකූට පර්වතයන් ගෙන් බබළන පරිද්දෙන් ලෝකයෙහි ඇත්තාවූ රජුන්ටත් ඇමතියන් මෙන් නම එයින් බැබළීමට පත් වේ.

158. දිවා ර බබළන - රිවි සඳු සෙ පෙනෙන දෙවියෝ නැත්
මෙ බඳු දෙවියන්ටත් - අතරතුර රාහුගෙන් බියවේ.

පදර්ථ:- දිවා ර බබළන - දවල් රාත්‍රී දෙක්හි බබළන, රිවි සඳු සෙ-සූර්‍ය්‍යා හා චන්ද්‍රයා සේ, පෙනෙන - පෙනෙන්නාවූ, දෙවිවරු දෙවිවරු, නැත්- නැත්තාහුය. මෙ බඳු-මෙවැනි, දෙවියන්ටත් -දෙවිවරුන්ටත්, අතරතුර - කලින්කල, රාහුගෙන් -රාහු අසුරාගෙන්. බියවේ - බිය ඇතිවේ.

භාවය:- හිර සඳ දෙදෙනා ර දවල් බබළත්. එ බඳු වෙනත් දෙවියෝ නො වෙති. මෙ වැනි දෙවිවරුන්ටත් රාහු, ග්‍රහණයෙන් බිය ඇතිවේ.

159. පව් බැඳි සිත් නො මැති-දනහට යම දෙසක් පැමිණුනත්
වන නො මැති අත්ලෙහි - විෂ නො නැහෙන
මෙන් නොම වේ දුක්.

පදර්ථ:- පවු බැඳි - පාපයෙහි බැඳුණු, සිත් - සිත, නො මැති - නො ම ඇත්තාවූ, දනහට - ජනතාවට, යම් දෙසක් යමකිසි වැරැද්දක්, පැමිණුනත් - පැමිණියත්, වණ නො මැති - තුවාලයක් නො මැති, අත්ලෙහි - අත්ලෙහි, විස - විෂ, නො නැහෙන මෙන්, නො නැහෙන්නා මෙන්, දුක් - දුකක්, නොම වේ - නො වේ.

භාවය:- පාපයෙහි බැඳුණු සිතක් නො නැත්තාවූ මිනිසුන්ට යමකිසි වැරැද්දක් පැමිණියත් තුවාලයක් නැති අල්ලෙහි විෂ නො නැගෙන්නා සේ දුකක් ඇති නො වේ.

160. නල සිළු තුළට වැද - සිහිල නල නො නැසී පවතිනෙව්
සමත නැණ මැතිවර-රදුන්වෙත නිති වැසත් නො නැසෙත්

පදර්ථ:- සිහිල නල - සීතල සුළඟ, නල සිළු තුළට - ගිනිදළු තුළට, වැද - වදිමින්, නො නැසී - විනාශ නොවී, පවතින එව් - පවතින්නාක් මෙන්, සමත්, සමත්වූ, නැණ මැතිවරු - ඥානවන්ත මැතිවරු, රදුන් වෙත - රජුන් සමීපයෙහි, නිති වැසත් - නිරන්තරයෙන් වාසය කොටත්, නො නැසෙත් - විනාශයට නො යත්,

භාවය:- සීතල වාතය ගිනිදල් තුළට වැද විනාශ නොවී පවතින්නාක් මෙන් සමර්ථ නැණවත් මන්ත්‍රීවරු රජුන් සමීපයෙහි නිතරම වාසය කොටත් විනාශයට නොයත්.

161. නිරිඳුන්ගෙ සිත ඉඟි - නො දත් මැතිවර නො දත් ගිජිඳුයි
තෙසක් සිවුපා යුත් - මැති ඇති රදුට සිතුව සැදේ.

පදර්ථ:- නිරිඳුන්ගෙ - රජුන්ගේ, සිත - සිතෙහි, ඉඟි නො දත් - ඉඟි නොදත්තාවූ, මැතිවරු - මන්ත්‍රීවරු, නො දත් ගිජිඳුයි - දත් නැත්තාවූ ඇත්තුය, තෙසක් - ශක්ති තුනක් ඇති හා, සිවුපා යුත් - සිවු උපා ඇති මැති ඇති - මන්ත්‍රීන් ඇති, රදුට - රජවරුනට සිතුව - සිතූ දෙය, සැදේ - සිද්ධ වේ.

භාවය:- රජුගේ සිතෙහි ඉඟි නො දත් මන්ත්‍රීවරු දළ නො මැති ඇත්තුය. ශක්ති තුනක් ඇති, සිවු උපා ඇති මන්ත්‍රීන් ඇති රජුන්ට සිතූ දෙය ඉටුවේ.

162. නිරිඳුන් ඉදිරියෙහි - අකාරණ කන් කෙඳිරි නො කරව
රද අදහස් ලෙසට - වදන් දෙව් දෙව් සබාවන මෙන්.

පදර්ථ:- නිරිඳුන් ඉදිරියෙහි - රජ වරුන්ගේ ඉදිරියෙහි, අකාරණ - කරුණු නොවන, කන් කෙඳිරි - කන් කෙඳිරි, නොකරව - නො කරව, රද - රජුගේ, අදහස් ලෙසට - අදහස් පරිදි, සබා වන මෙන් - සත්‍ය වන (මෙන්,) පරිදි, දෙව් වදන් - උතුම් වචන, දෙව - දෙව.

භාවය:- රජවරුන් ඉදිරියේ කන්කෙඳිරි නො කරව. රජ අදහස් අනුව සත්‍ය වාදී වදන් දෙව.

163. ලොව නැව දනා බඩු - නැව් නා නිරිඳු මෙ ඇම සමඟින්
වියත් මැති මාලව් - උගත් සත බෙලෙනි පවතිනුයේ.

පදර්ථ:- දනා බඩු - ජන නමැති බඩු ද, නැව් නා - නැවෙහි නායක වූ, නිරිඳු - රජු ද, මෙ ඇම සමඟින් - මේ සියල්ල සමඟින්, ලොව නැව - ලෝකය නමැති නැව, පවතිනුයේ - පවතිනේ, වියත් මැති මාලව් - උගත් ඇමති නමැති නැවියා, උගත් සත බෙලෙනි - ඉගෙන ගත්තාවූ ශාස්ත්‍රය බලයෙනි.

භාවය:- රට නමැති නැවෙහි බඩු පටවා නැවේ ප්‍රධාන වූ රජතුමා සමඟින් පදවන්නේ උගත් ඇමති නමැති නැවියාගේ ශාස්ත්‍ර මහිමයෙනි.

164. කිසි කාරිය නැතත් - රදු හා මැතිඳු නිතියෙන්
සෙවනැ දනන්ගෙ - දනට රැකවරණයෙහි සුරකිව.

පදර්ථ:- කිසි කාරිය - කිසි කාර්යයක්, නැතත් - නැති වුවත්, රදු හා මැතිඳු - රජු හා ඇමැතියා, නිතියෙන්

සෙවනා - නිරතුරු සේවනය කරන්නා වූ, දනන්ගේ - ජනයන්ගේ, දනට - දනයට, සුරකින - අතිශයින් ආරක්ෂා කරන්නා වූ, රැකවරණයෙකි - ආරක්ෂාවෙකි.

භාවය:- කිසි කාර්යයක් නොමැතත් රජු හා ඇමතියා නිතර සේවනය කරන්නා වූ ජනයාගේ ධනයට රැකවරණයකි.

165. රදුන් සෙවනා දන - නොළං නුදුරුව ගිනි තපින මෙන්
සිහි නුවනින් යෙදී - සප් රජෙකු මෙන් සිතා වැජඹෙව.

පදර්ථ:- රදුන් - රජුන්, සෙවුනා - සේවනය කරන්නා වූ, දන - ජනයෙනි, නොළං - සමීප නොවී, නුදුරුව - ඈතට ද නොගොස්, ගිනි - ගින්න, තපින මෙන් - තපින්නාක් මෙන්, සිහි නුවණින් - සිහියෙන් හා බුද්ධියෙන් යෙදී - යුක්තව, සප් රජෙකු මෙන් - සර්ප රාජයකු මෙන්, සිතා - සිතමින්, වැජඹෙව - බැබළෙව.

භාවය:- රජුන් සේවනය කරන ජනයෙනි, ළං ද දුර ද නොවී ගිනි තපින්නා මෙන් සිහියෙන් හා නුවණින් යුතුව නාරජෙකු මෙන් සිතමින් පවතිම්.

166. රජුන් උදහස් වුව - පෙරටුව උතුරු වදන් දෙන්නෝ
ගිනි ළඟ ඉටි වීරෙන - ලෙසින් තම සිරිනි පිරිහී යත්.

පදර්ථ:- රදුණ් - රජවරුන්, උදහස් වුව - උදහස් වුවත්, පෙරටුව - ඉදිරියෙහි සිට, උතුරු වදන් - පිළිතුරු වචන, දෙන්නො - දෙන අය, ගිනි ලඟ - ගිනි සමීපයෙහි, ඉටි - ඉටි, විරෙණ ලෙසින් - දියවී යන්නා සේ, තම - තමන් ගේ, සිරිනි - සම්පත්තියෙන්, පිරිහි යති - පිරිහී යෙත්.

භාවය:- රජුන් කෝපයට පත්විට, ඉදිරියෙහි සිට පිළිතුරු දීමෙන් ගිනි ලඟ ඇති ඉටි දියව යන්නා සේ තමන් ගේ සම්පත් දිය කරවා ගත.

167. රදුන් තිළිණෙන් මුත් - අන් සතකුගෙන් නොයේ දුක් ගිම
වැසි වැස යන ගිමන් - යේද පිනිබටුවයි සතන්ගේ.

පදර්ථ:- රදුන් - රජුන්ගේ, තිළිණෙන් මුත් - පරිත්‍යාගයෙන් විනා, දුක් ගිම සතන්ගේ - මිනිසුන්ගේ දුක් නැමැති ග්‍රීෂ්මය, නොයේ - පහ නොවන්නේ ය, වැසි වැස - වර්ෂාව වැස, යන - පහව යන්නා වූ, ගිමන් - ග්‍රීෂ්මය, පිනිබටුවයි - පිනිබැමෙන්, යේද - පහව යේ ද.

භාවය:- මිනිසුන්ට ඇති දුක් නැමැති ග්‍රීෂ්මය පහ කරන්නට හැක්කේ රජුන්ගේ පරිත්‍යාගයෙනි. මහා වර්ෂාවකින් පහව යා යුතු ග්‍රීෂ්මයක් පිනි වැටීමකින් කෙළවර වේ ද?

168. රදුන් ලොබැති දෙයට – ලොබය නොකරව් පණට
හිතැතොත්
පලහැටි ගොදුරු පත් – වැටුප් මැද වැද නැසුණු ලෙස වේ.

පදර්ථ:– පණට හිතතොත් – තම ප්‍රාණය ගැන කල්පනා කරන්නේ නම්, රදුන් ලොබැති දෙයට – රජු ආශා කරන දෙයට, ලොබය නො කරව් – ලෝභ නො කරව්, ගොදුරු පත් – ගොදුරු සඳහා පැමිණි, පළහැටි – පළහැටියා, වැටුප් මැද – පහනෙහි මැද, වැද – වැදී, නැසුනු ලෙස වේ – නැසුනු ලෙස සිදුවේ.

භාවය:– තමන්ගේ පණ රැක ගැනීමට සිතතොත් රජතුමා ආසා කරන දෙයට ආසා නො කරව්. ගොදුරු සඳහා පැමිණි පලහැටියා පහන මැදට වැටී නැසුනා මෙන් සිදුවන්නේ ය.

169. රදුන් බජනය කළ – කෙදන දනවත්ව බබලන
රන් නෙර ඇසුරු කළ – හැම සතන් එම්පැහැය වන මෙන්

පදර්ථ:– රදුන් – රජවරුන්, බජනය කළ – ඇසුරු කළ, කෙදන – කවර කෙනෙක් වුවත්, දනවත්ව – ධනවත්ව, බබළා – බබළන්නේ ය, රන් නෙර – ස්වර්ණ මේරු පර්වතය, ඇසුරු කළ – ආශ්‍රය කළ, හැම සතන් – හැම සත්තුම, එම පැහැය වන මෙන් – එම පැහැයට එන්නා මෙනි.

භාවය:– රජතුමා ආශ්‍රය කරන කවර කෙනෙක් වුවත් ධනවත්ව බබළති. රුවන් මෙර ඇසුරු කරන හැම සතෙක්ම රන්වන් පැහැය ගන්නා මෙනි.

170. නිරිඳු කිපුනෙ තැනින් - පහව ගැලවෙති නැණැති සුදියෝ
එන සැරපහර දුන – ඉවත පැන ගැලවුනත් සමවෙත්.

පදර්ථ:– නිරිඳු – රජතුමා, කිපුනු - කිපුණ කල්හි, නැණැති සුදියෝ – නුවණ ඇති පණ්ඩිතයෝ, එතැනින් – ඒ ස්ථානයෙන්, පහව – පහවී, ගැලවෙති – ගැලවෙන්නාහ. එන – එන්නාවූ, සැර පහර දුක – ඊ පහර දුක, ඉවත පැන – ඈතට පැන, ගැලවුනත් – ගැලවුන අය හා, සම වෙත් – සමාන වෙති.

භාවය:– රජතුමා කෝප වූ විට, නැණැති මිනිසුන් වහා එතැනින් පහව ගැලවෙති. ඉස්සරහට එන ඊ පහර දුක ඈතට පැන ගැලවුන අය හා සමාන වෙති.

171. රජු නඳින බඳුනා - සැරහෙන බුදින ඉදිනා
රජ සිරිතිනෙකකුත් – නො කරව් සිතැති ඉදිනා.

පදර්ථ:- රජුන් - රජතුමන්, අදින - අදින්නාවූ, බඳින - බඳින්නාවූ ද, සැරසෙන - සැරසෙන්නාවූ ද, බුදින - අනුභව කරන්නාවූ ද, ඉඳිනා - ඉඳින්නාවූ ද, රජ සිරිතින් - රාජ සිරිත් අතුරෙන්, එකකුත් - එකක්වත්, ඉඳිනා සිත් ඇති, ජීවත් වීමට කැමැති අය, නො කරව් - නො කරව.

භාවය:- රජුන් අඳින, පළඳින, බඳින, සැරසෙන, අනුභව කරන, විඳින විලාසිතාවන්ගෙන් එකක් වත් අනුකරණය නො කරව.

172. රජුන් සිතතුළ කම - නො දත නො මඳව වදන් දෙන්නෝ
නො ඇඳ සිවු සැට විල් - රාජවිල් කෙළනවුන් වැන්නෝ.

පදර්ථ:- රජුන් - රජුන්ගේ, සිත් තුළ කම - සිත් තුළ වූ අදහස්, නො දත - නොම දැක, නො මඳව, බොහෝ වදන් - වචන දෙන්නෝ - කියන්නෝ, සිවු සැටක් විල් - සැටක් කොට, නො ඇඳ - නො අඳිමින්, රාජ විල් - රාජවිල් නමැති ක්‍රීඩාව, කෙළනවුන් - ක්‍රීඩා කරන්නවුන්, වැන්නෝය.

භාවය:- රජුන්ගේ සිත් තුළ ඇති අදහස් නො දත ඔහු ඉදිරිපිට වචන ප්‍රකාශ කරන්නෝ කොටු නො මැකිව රාජවිල් ක්‍රීඩාව කරන්නා මෙනි.

173. තෙද විකුම් ගුණ නැණ - ඉසුරුමත් රජුට නැති සතුරෝ
හුබමිණ උදවිට - අඳුරු දිව අන්දිවට වන් මෙන.

පදර්ථ:- තෙද - තේජස, විකුමය, ගුණ - ගුණය, නැණ - ඥනය. යන ආදිය ඇති, ඉසුරුමත් - ඓශ්වර්‍ය්‍ය යන මේවා ඇති රජුට - රජ කුමාට, සතුරෝ - සතුරෝ, නැත්මැයි - නැත්තේමැයි, හුබමින් - සූර්‍ය්‍යා, උද විට උද වූ කළ, අඳුර, අන්ධකාරය, දිව - දිවගොස්, අන්දිවට අන්‍ය දිවයිනකට, වන් මෙන්, පැමිණියා මෙනි.

භාවය:- තේජස, වික්‍රම ගුණඥාන සම්පත් ආදිය ඇති රජුට සතුරෝ නැත්තේ මැයි. සූර්‍ය්‍යා උද වූ විට, අන්ධකාරය පහම වෙන දිවයිනකට පැමිණියා මෙනි.

174. සැබෑ බස දෙවියන් - වෙති පවතී බොරු දනන් තුඩවෙ
එසෙයින් දනන් ගෙන් - නිබොරු සත ලොව
සුරනයුරු වෙත්

පදර්ථ:- සැබෑ තස - සත්‍ය වචනය, දෙවියන් වත - දෙවියන් සමීපයෙහි, පවතී, පවතී, බොරු - මුසාව, දනන්

තුඩ වේ - මිනිසුන්ගේ කටෙහි වේ, එසෙයින් - එනිසා දනන් ගෙන් - මිනිසුන් අතර, නිබොරු - සත - සත්‍ය වචන කියන්නෝ, ලොවැ - ලෝකයෙහි, සුරන් අසුරු මෙන් වෙත්. දෙවියන් මෙන් වෙති.

භාවය:- ඇත්ත වචනය දෙවියන් ළඟත්, බොරුව මිනිසා ළඟත් පවතී. එනිසා මිනිසුන් අතර සත්‍ය කියන්නෝ දෙවියන් මෙන් සළකත්.

175. නිවන් සත් වුවත් - සත් පුතකු ලදහොත් සුපින්වත්
නොමද සව සිරි වේ - සිතුමිණක් ලත්කලක් විලසින්.

පදර්ථ:- නිවන් - වස්තුව නැති, සත් වුවත් - සත්වයෙක් වුවත්; සුපින්වත් - පින්වන්ත, සත් පුතකු; සත් පුත්‍රයෙකු, ලදහොත් - ලද්දේ නම්, සිතුමිණක් - චින්තාමාණික්‍ය-යක්, ලත් කලක් විලසින් - ලබන ලද කලක් විලසින්, නොමද - බොහෝවූ - සවසිරි, සියලු සම්පත්, වේ-වන්නේ ය.

භාවය;- වස්තුව නැති අය වුවත් පින්වත් යහපත් පුතකු ලදහොත් සිතුමිණක් ලද කලක් මෙන් බොහෝ සම්පත් ඇති වේ.

176. බත් පැසෙන තෙක් මුත්- නොමද ගිනි කළ බතින්
වැඩ නැති
එමෙන් දසුන් කළ - පමණට මුත් නොවව් තද.

පදර්ථ:- බත් පැසෙන තෙක් මුත් - බත් පැසෙන ප්‍රමාණයට මිස, නො මද - බොහෝවූ, ගිනි කළ - ගිනි දල්වූව හොත්, බතින් - බතෙන්, වැඩ නැති - වැඩ නැත්තේය. එමෙන් - එසේ, දසුන් කළ - දසයන් කළ, වරද පමණට මුත්, වරදෙහි ප්‍රමාණයට, වඩා තද නො වව්- තද නො වව්.

භාවය:- බතට ගිනි දැමිය යුත්තේ - එය පැසෙන පමණට ය. ඊට වඩා ගිනි ගැසුවොත් වැඩක් නො මැත. එසේම දසයන් කරන ලද වැරැද්දේ පමණට පමණක් දඬුවම දිය යුතුය. ඊට වඩා තද විය යුතු නො වේ.

177. කුල නැණ ගුණ ඇතත් - නො තකත් ලොවෙහි
තෙදැතියන් මෙන්
සඳ මස වරෙක වැද - වදිත් නිති රිවි පුදෙන් සැරසී.

භාවය:- කුල - කුලය, නැණ - නුවණ, ගුණ - ගුණය, ඇතත් ඇත්තේ වී නමුත්, ලෙංවෙහි - ලොව, තෙදැතියන්

මුත් - තේජස් ඇත්තවුන් හැර, නො තකත් - නො සලකති, සඳ චන්ද්‍රයාට, මස වරෙක - මසකට වාරයක්, වැද - වැද යි, නිති - හැමදින, පුදෙන්-සැරසී පූජාවෙන් සැරසී, රිවි - සූය්‍ය්‍ය වඳිත් වදිති.

භාවය:- කුලය, භූවණ ගුණ ඇතත් ලොවෙහි තේජස් ඇත්තවුන්ට පමණක් සලකති. චන්ද්‍රයාට මසකට වරක් වඳිති. එහෙත් සූය්‍ය්‍යයාට දිනපතා වඳිති.

178: පව් කළවුන්ගෙ පණ – නො ඇසේය බව බවක් පාසා පින් කළ සතත්–පණ මොක් දුක නිවේ කපුරු පහණෙව්.

පදර්ථ:- පව් කළවුන්ගේ - පව්කළ අයගේ පණ – ප්‍රාණය, බව බවක් පාසා, ජාතියක් - ජාතියක් පාසා, නො- ඇසේය – නො නැසෙන්නේය, පින් කළ – පින් කළාවූ, සතත් පණ – සත්ත්වයන්ගේ ප්‍රාණය, මොක් දුක – නිර්වාණය දක, කපුරු එව් – කපුරු පහනක් මෙන්- නිවේ – නිවෙන්නේ වේ.

භාවය:- පව් කළ අය නැවත නැවතත් උපදින්නේ ය. පින් කළ අය නිවන් දක කපුරු පහනෙක් මෙන් නිවෙන්නේ ය.

179. පර පණ නසනු හට-නො දනෙ මදක්වත් පවෙහි තද බව මළකඳට ගත් ගිණිකඳ-තදය නො දනෙන විලස්නෙන්.

පදර්ථ:- පර පණ - පර පණ, නසනු හට - නසන්නාට, පවෙහි තද බව - පවෙහි තද ගතිය, මදකුත් නො දනෙ- මදකුත් නො දනෙන්නේය. මළකඳට - මළකඳට, ගත් - ගත්තාවූ, ගිනි කඳ - ගිනිකඳෙහි, තදය - තද බව, නො දනෙන විලස්නෙන් - නො දනෙන්නාක්මෙනි.

භාවය:- අනුන්ගේ පණ නසනු තැනැත්තාට පවෙහි තද ගතිය මදකුත් නො දනේ. මළකඳට ගත් ගින්නෙහි තද බව ඒ මළකඳ නො දන්නාක් මෙනි.

180. බෙර හඬ යොදුනකට – ඇසේ සෙත හඬ
දෙළොස් යොදුනට
දන් දෙන උතුමන්ගෙ–දන සඳ ඇසේ එකසෙ තිලොවට.

පදර්ථ:- බෙර හඬ – භේරී නාදය, යොදුනකට – යොදුනක් දුර, ඇසේ – ඇසෙන්නේය, සෙත හඬ – සෙත හඬ, දෙළොස් යොදුනක – දෙළොස් යොදුනක්, ඇසේ- ඇසෙන්නේය, දන් දෙන – දන් දෙන්නා වූ, උතුමන්ගෙ උත්තමයන්ගේ, දන සඳ – දන් හඬ, එකසෙ – එකාකාර යෙන්, තිලොවට – තුන් ලොවට, ඇසේ-ඇසෙන්නේය.

භාවය:- බෙර හඬ යොදුනක් දුර ද, හෙන හඬ දෙලොස් යොදුනක් දුර ද, ඇසේ. දන පතියාගේ දන් දෙන හඬ තුන් ලොවට එකසේ ඇසේ.

181. සව් කුසුමෙහි සුවඳ - නල අනුව මුත් නොයේ පෙරටුව
සතගේ සිල් සුවඳ - දස දෙසම පවතී නිරතුරින්.

පදර්ථ:- සව් කුසුමෙහි - සියලු මල්වල, සුවඳ - සුගන්ධය, නල අනුව මුත් - සුළඟට අනුව මිස, පෙරටුව - උඩු සුළඟට නොයේ-නො යන්නේ ය, සතගේ-සත්වයන්ගේ. සිල් සුවඳ - ශීල සුගන්ධය, නිරතුරින් - නිරන්තරයෙන්, දස දෙස - දශ දිසාවෙහි ම, පවතී - පවතින්නේ ය.

භාවය:- සියලු මල්වල සුවඳ යටි සුලඟට මිස උඩු සුළඟට නොයේ. සිල් සුවඳ නිරතුරුව දශ දිසාවට්‍යයේ.

182. නුවණැති මැදහතුන්-නො පත් සබ මැදට පත් වූ දනෝ
අඳුරු ගෙය තුළ වැද-අන් තුබ බඩු සොය'නුවෝ වෙත්.

පදර්ථ:- නුවණ ඇති - නුවණ ඇත්තාවූ, මැදහතුන් - මධ්‍යස්ථයන්, නො පත් - නො පැමිණි, සබ මැදට - සභා මධ්‍යයට, පත් - පැමිණි, සුදනෝ - සත්පුරුෂයෝ, අඳුර ගෙතුළට, - අන්ධකාරය ගෙය තුළට, වැද - වැදී, අනුන් තිබූ බඩු - අන්‍යයන් තබන ලද බඩු, සොයනුවෝ වෙත - සොයන්නෝ වෙත්.

භාවය:- නැණවත් මධ්‍යස්ථයන් නො මැති සබාවට පැමිණි මිනිස්සු අඳුරු ගෙයකට වැදී අන්‍යයන් තබන ලද බඩු සොයන්නාක් වැනිය.

183. අමයුරු වදන් හැර - තද කුරිරු බස් දෙන දුදනයෝ
විලිකුන් පල දමා - නීරස පළ බුදින්නන් අයුරු වෙත්.

පදර්ථ:- අමායුරු - අමා වැනි, වදන් හැර - වචන අත්හැර, තද කුරිරු බස් - රළු කෘෘර වචන, දෙන - දෙන්නා වූ, දුදනයෝ - දුර්ජනයෝ, විළිකුන් පළ දමා - ඉදුණු ගෙඩි ගත්හැර, නීරස - රස නැති, පළ - ගෙඩි, බුදින්නන් අයුරු - බුදින අයුරු වෙත්.

භාවය:- යහපත් වචන අත්හැර තද කුරිරු බස් දෙන දුර්ජනයෝ මිහිරි ඉදුණු ගෙඩි අත්හැර රසවත් නැති ගෙඩි අනුභව කරන්නාක් මෙනි

184. සුරා බොන දනහට - කොතෙක් කිවත් සුබස නාසත්
මඳැකුට සත් කළත් - තමා යන අතකට ම යනමෙන්.

පදර්ථ:- සුරා බොන - මත්පැන් පානය කරන, දනහට - ජනයාට, කොතෙක් කීවත් - කොපමණ කීවත්, යහපත් වචන නාසත් - නොඅසති, මදකුට - මත් ඇතාට, සත් කළත් - සංඥා කළත්, තමා යන අතකට, යනමෙන් - තමා යන අතකටම යන්නා මෙනි.

භාවය:- මිහිරි වදන් අතහැර, තද කුරිරු රළු බස් දෙන අසත් පුරුෂයෝ මිහිරි පල තිබියදී තිත්ත, ඇඹුල් ගෙඩි අනුභව කරන්නෝක් මෙනි.

185. සුරා සොරා බී - නො හඟවා සබා මැද උනත් ගොස් මුව විවර කළ තොමෝ - කතා කරව් සතට අඟවා.

පදර්ථ:- සොරා - රහසින්, සුරා බී - සුරා පානය කොට, නො හඟවා-එය හැඟවීමක් නො කොට, ගොස්-ගොස්, සබා මැද - සභාව මධ්‍යයෙහි, මුව විවර කළ - කට විවෘත කළ විට, තොමෝ - තමා ම, කතා කරවා - කථා කරමින්, සතට - අන්‍යයන්ට, අඟවා - සඟවා.

භාවය:- අප්‍රසිද්ධයේ මත්පැන් පානය කොට සබා මැදට ගිය අය කට ඇරි වහාම (සුරාව) තමාම කතා කරමින් සුරා පානය කළ බව අන්‍යයන්ට හඟවයි.

186. පර පණ නසා පණ - රකිනා පව්ටු දුදන අවියත්
ලෙවනා වැනි දිවින් - කරෙහි මුව අත වක වකා මී.

පදර්ථ:- පර පණ - අන්‍යයන්ගේ ප්‍රාණය, නසා - නසා, පණ රකිනා - ප්‍රාණය රකිනා, දුදන අවියත් - දුර්ජන මෝඩයෝ, කරෙහි - දලි පිහියෙහි, මුව - මුවාතෙහි මී වක වකා - මී ගල්වා, දිවින් - දිවෙන්, ලෙවනා වැනි - ලොවන්නා වැනි.

භාවය:- අනුන් පණ නසා තම පණ රකින දුර්ජන මෝඩ අය දලි පිහි මුවාතෙහි මී තවරා දිවෙන් ලෙවකමින් ජීවත් වීමක් වැනිය.

187. සිරුර උසුලා නෙකතැන - ඇවිද පරපණ නසන ලෙස්
උතුරු කුරු දිවයින - යකුන් නර වාහන මෙන්

පදර්ථ:- සිරුර - ශරීරය, උසුලා - උසුලා ගෙන, නෙක - නොයෙක් ස්ථාන, ඇවිද - ඇවිදිමින්, පරපණ - අනුන් ගේ පණ, නසන ලෙස් - නසන්නාක් මෙන්, උතුරු කුරු දිවයින - උතුරු කුරු දිවයිනෙහි, යකුන් - යක්ෂ යන්, නර වාහන කළා මෙන් - මිනිස් වාහනයනට යොදා ගන්නාක් මෙනි.

භාවය:- සිරුර උසුලාගෙන නොයෙක් තැන්වල ඇවිදිමින් සතුන් නසන ආකාරය, උතුරු කුරු දිවයිනෙහි යකුන් වාහනය වශයෙන් යොදා ගත්තා මෙනි.

**188.** සුරා සොරා බිබී - පරලොවෙහි විඳිනා නොමඳ දුක්
තිබැඳි මෙලොවම - විඳින දුක් පෙර නිමිති පානෙවි.

පදර්ථ:- (මිනිස්සු) සොරා සුරා බිබී - මත්පැන් හොරා බීමෙන්, පරලොවෙහි - පරලෝකයෙහි, නො මඳ විඳින - බොහෝ විඳින, දුක් - දුක්, තිබැඳි - තිබිය දී, පෙර නිමිති පාන එව - පෙර නිමිති පාන්නාක් මෙන්, මෙ ලොවට - මේ ලෝකයෙහි ම, දුක් විඳිති - දුක් විඳිති.

භාවය:- සුරාපානය කොට ඒ හේතුවෙන් පරලොවදී විඳීමට සිදුවන්නාවූ දුක්වල පෙර නිමිත්තක් හෝ වන්නාක් මෙනි

**189.** උගතත් මුනි දහම් - පවිටු සිත මදකුත් නොම ඇලේ
සිඳුමස් ලුණු බිබී එහි මැ වැස ගත ලුණු නො පත් මෙන්.

පදර්ථ:- මුනි දහම් බුද්ධ ධර්මය, උගතත් - ඉගෙන ගතත්, පවිටු සිත - පාප සිත, මදකුදු-මදක්වත්, නො ඇලේ - නො ඇලේමයි. සිඳුමස් - මුහුදු මසුන්, ලුණු බිබී - කරදිය බී, එහිම වැස - එහිම වාසය කොට, ගත - ශරීරයෙහි, ලුණු නො පත් මෙන් - ලුණු රසය නො ලැබුවා මෙනි.

භාවය:- බුද්ධ ධර්මය ඉගෙන ගෙන වුවත් පාපීන්ගේ සිත මදක්වත් එහි නො ඇලේ. මුහුදෙහි වූ මසුන් කරදිය බී කරදියෙහි ම වාසය කොට ශරීරයට ලුණු රසය නො ලැබුවා මෙනි.

**190.** විරිඳුන් මුල් සිඳුණු - නිරිඳුන් තබා බැරි සුරන්ටත්
හුබමිණ සතරදිව - දිවත් තම රුපු ගත නුහුණු මෙන්.

පදර්ථ:- විරිදුන් - සතුරන්, මුල් සිදුණු - මුල් සිඳීම, නිරිඳුන් තබා - රජුන් තබා, සුරන්ටත් - දෙවියන්ටත්, බැරි - බැරිය, හුබමිණ - සූර්යා, සතර දිව - සතර මහා ද්වීපය තුළ, දිවත් - දිව නමුත්, තම රුපු - තමාගේ සතුරා, ගතනුහුණු මෙන් - ගැනීමට නො හැකිවුවා මෙන්.

භාවය:- සතුරන් මුලින් උපුටා දැමීම, රජුට තබා දෙවියන්ටත් නො හැකිය. සූර්යා සතර මහා ද්වීපයෙහි දිවවත් තමන්ගේ සතුරා අල්ලා ගැනීමට නො හැකිවා මෙනි.

**191.** සව් බරණින් සැදී - මැතිසෙන් මැදෙහි උන් රජුන්ගේ
බැබළීමට වැඩිත් - සෙන් සමඟ යුදට පත් නිරිඳෝ.

**පදර්ථ:-** සව් බරණින් - සකලාභරණයෙන්, සැදී - සැදුනාවූ, මැතිසෙන් මැදෙහි - ඇමති පිරිස මධ්‍යයෙහි, උන් - වාසය කළ, රජුන්ගේ - රජවරුන්ගේ, බැබළීමට වැඩිත් - බැබළීමට වැඩියෙන්, සෙන් සඟ - සේනාව සමඟ, යුදට පත් - යුද්ධයකට පැමිණියා වූ, නිරිඳෝ - රජවරු, බබළති.

**භාවය:-** ආභරණ පැළඳ ඇමතියන් පිරිවරා රජ සබයෙහි වැජඹීමට වඩා සේනාව සමඟ යුදයට ගිය රජවරු බබළත්.

**192.** සත රැකුමට පිහිට - අහර දිය ගිනි ලුණුත් වත් සව
මෙ හැමටම පිහිට නම - මැදහත් රජුන්ගේ පිහිට මැයි.

**පදර්ථ:-** සත රැකුමට - සත්වයන් ආරක්ෂා කිරීමට, අහර - ආහාරත්, දිය - වතුරත්, ගිනි - ගින්නත්, ලුණු - ලුණුත්, සව්වත් - සියලු වස්තුත්, යන මෙ හැම - මේ සියල්ල, පිහිටමුත් - ආධාර වන්නේ නමුත්, පිහිට - පිහිට නම, මැදහත් - මධ්‍යස්ථ වූ, රජුන්ගෙන් මැයි - රජවරුන්ගෙනි.

**භාවය:-** ආහාර, වතුර, ගිනි, ලුණු හා හැම වස්තුවක් සත්වයාගේ ආරක්ෂාව සඳහා පවතී. එහෙත් නියම පිහිට නම්, මධ්‍යස්ථව රජුන්ගෙන් ම සිදුවේ.

**193.** බැබළෙන සෙ රිවි සඳ - ඈඳුර බැබළීමෙන් දියත නැති
ලොව රකින නිරිඳුන් - ලෙසට අවසෙසු රුපු නො බබළත්.

**පදර්ථ:-** රිවි සඳ - සූර්යයා හා චන්ද්‍රයා, බැබළෙන සෙ - බබලන්නාක් මෙන්, අඳුර - අන්ධකාරය, බැබළීමෙන් - බැබළීමක්, දියත - ලෝකයෙහි, නැති.

**භාවය:-** ඉර හඳ බබළන සේ අඳුර නො බබළයි. ලොව ආරක්ෂා කරන රජුන් මෙන් අවශේෂ සතුරෝ නො බබළති.

**194.** පින් මදහට ඉසුරු - දුනත් ගත් දුක් සිතා නිරිඳුන්
තෙල් මඳ පියල්ලෙන්-ගත් පහන නො පවතින ලෙස වේ.

**පදර්ථ:-** නිරිඳුන් - රජුන්, පින් මදහට - පින් නො මැත්තාහට, ගත්දුක් සිතා - කරන ලද සේවාව ගැන සිතා, ඉසුරු දුනත් - සම්පත් දුන්නත්, තෙල් මඳ සියල්ලෙන් -

තෙල් මදවූ පහන් කබලෙන්, ගත් - ගත්තාවූ, පහන - ප්‍රදීපය, නො පවතින - නො පවතින්නාවූ, ලෙස වේ ලෙස ම වේ.

භාවය:- භාග අඩු අයට ඔවුන්ගේ සේවාව ගැන සලකා රජු විසින් සම්පත් දුන්නත් තෙල් අඩු පහන් පියල්ලෙන් සෑදූ පහන නො පවත්නාක් මෙනි.

195. නිරිඳුන්ගෙ මෙත් සිත් - සැබවයි මදින් උඩගු වන්නෝ
තිමද ඇතු දළ මුතු - ගනුව අත දිගු කරන වැන්නෝ.

පදර්ථ:- නිරිඳුන්ගේ - රජවරුන්ගේ - මෙත් සිත් - මෛත්‍රී චිත්තය, සැබවයි - සැබෑ යයි යන, මදින් - මදයෙන්, උඩගු වන්නෝ උඩගුවන්නෝය. (කවර ආකාරද) තිමද - මදතුනෙන්, යුත්, ඇතුදළ - ඇතාගේ දළයෙහි, මුතු ගනුව - මුතු ගැනීමට, අත - අත, දිගු කරන වැන්නෝ - දිගු කරන අය වැන්නෝය.

භාවය:- රජවරුන්ගේ මෙත් සිත සැබවයි යන මදයෙන් උඩගුවන අග තුන් මදය ඇති ඇතාගේ දළයේ මුතු ගැනීමට අත දිගු කරන්නා වැනිය.

196. නිරිඳෝ තම රටට - මුත් අන් රටට දිවා සඳ මෙනි
පඬිවර යම් රටක - පැමිණියත් පුන් සඳ සෙ බබළා.

පදර්ථ: නිරිඳෝ - රජවරු, තමන් රටට මුත් - තමන්ගේ රටට විනා, අන් රටට - අන් රටවලට, දිවා සඳ මෙනි - දවල් කාලයෙහි සඳමෙන් වේ පඬිවර - උගතා, යම් රටක - යම් රටකට, පැමිණියත් - පැමිණුනත්, පුන් සඳ සේ - පුන් සඳ මෙන්, බබළා - බබළයි.

භාවය:- රජවරු තම රටට හැර අන් රටවලට දවල් කාලයේ පෑවූ සඳ මෙන් වෙති. උගතා කවර රටකට ගියත් පුන් සඳ සේ බබළයි.

197. සව්වත් දකින නෙත - තමා නො දකී කැඩපතින් මුත්
නිරිඳුට නැණැති සත් - මැතිඳු දපනින් දුටුව සිද්‍ධ වේ.

පදර්ථ:- සවුවත් - සියලු වස්තු, දකින නෙත - දකින්නාවූ ඇස, කැඩපතින් මුත්-කැඩපතක් නැතිව, තමා-තමන්, නො දකී-නො දක්කේ ය. නිරිඳුට - රජුට, නැණ ඇති- නුවණ ඇති, සත් මැතිඳු දපනින්-යහපත් මන්ත්‍රී නමැති කැඩපතින්, දුටුව - දුටු දෙය, සිද්‍ධ වේ-සිද්ධ වේ.

භාවය:- සියළු ම දෑය දකින ඇස කැඩපතකින් විනා තමා නො දකී. රජුට නුවණ ඇති යහපත් මන්ත්‍රී නමැති කැඩපතකින් දුටු දෙය සිදුවේ.

**198.** නිසා පියන් නිසා - නිසා ගනඳුරු දුරුව යන මෙන්
නිසා මැදහත් රජු - වෙති සතදුක් අඳුරු දුරු වෙ.

පදර්ථ:- නිසා නියන් නිසා - සඳ නිසා, නිසා ගනඳුරු - රාත්‍රී අන්ධකාරය, දුරුව යන මෙන් - දුරුව යන්නා මෙන්, මැදහත් රජු නිසා - මධ්‍යස්ථ රජු නිසා, සත වෙතින් - මිනිසුන්ගෙන්. දුක් අඳුරු - දුක් නමැති අන්ධකාරය, දුරුවේ - දුරුවේ.

භාවය;- සඳ නිසා ගනඳුරු දුරුව යන්නාක් මෙන් මධ්‍යස්ථ රජු නිසා මිනිසුන ගේ දුක් නමැති අන්ධකාරය දුරුවේ.

**199.** නිරිඳුට ඔවා දෙන - ගුණ නැණැති මැතිවරන් නැතහොත්
අපමණ ඉසුරුතකි - ඇතත් විරිඳුන් අවැඩ පැමිණේ.

පදර්ථ- නිරිඳුන් - රජුට, ඔවා දෙන - අවවාද දෙන්නාවූ, ගුණ නැණ ඇති - ගුනය හා නුවණ ඇති, මැතිවරන් - මන්ත්‍රීන් නැතහොත්, අපමණ - බොහෝ, ඉසුරු ඇතක් - සම්පත් ඇතත්, විරිඳුන් - සතුරන්ගෙන්, අවැඩ - අයහපත. පැමිණේ - පැමිණෙන්නේ ය.

භාවය:- රජුන්ට අවවාද දෙන බුද්ධිමත් මන්ත්‍රීවරුන් නැතහොත් බොහෝ සම්පත් ඇතත් සතුරන්ගෙන් අවැඩ සිදු වේ.

**200.** නිරිඳුට දනවගම - සවිසිරි ඇතත් නැතහොත් බලසෙන්
තරු පිරිවර නොමැති - නිසා පිය අනිසා පෙනෙන වැනි.

පදර්ථ;- නිරිඳුට - රජුට, දනව් ගම් - ජනපද ගම් ආදී, සව් සිරි, සියලු සැපත්, ඇතත් - ඇත්තේ වී නමුත්, බලසෙන් - බල සේනාව, නැතොත් - නැතහොත්. තරු පිරිවර නො මැති - තරු පිරිවර නැත්තාවූ, නිසා පිය - චන්ද්‍රයා, අනිසා - දවල්, පෙනෙන මෙන් - පෙනෙන්නාක් මෙනි.

භාවය:- රජුට ජනපද ගම් ආදී සියළු සම්පත් ඇතත් බල සේනාවක් නැතොත් තරු පිරිවර නො මැති චන්ද්‍රයා දවල් කාලයෙහි පෙනෙන්නා මෙනි.

201\. නිරිඳුන්ගෙන් ඉසුරු - ලත් සත් නැසෙත් එම රදුන්ගෙන්
දියෙන් ඉපදුණු ලුණු - දියට පත් දියවන විලස මෙන්.

පදර්ථ:- නිරිදුන්ගෙන් - රජුන්ගෙන්, ඉසුරුලත් - සම්පත් ලැබුවාවූ, සත් - අය, එම රජුන්ගෙන් - එම රජ්ජුරුවන් ගෙන්, නැසෙත් - විනාශයට යත්, දියෙන් ඉපදුණු ලුණු - දියෙන් හට ගත් ලුණු, දියට පත් - ඒ දියට එක්වූ කළ, දියවන විලස මෙන් - දිය වෙන්නා මෙනි.

භාවය: රජුන්ගෙන් සම්පත් ලැබූ අය එම රජවරුන් ගෙන්ම නැසෙති. දියෙන් සෑදෙන ලුණු ඒ දියට එක්ව දිය වන්නා මෙනි.

202\. මැදහත් රජ ඉසුරු - වැඩි වැඩියෙ ලොවටත් වැඩෙ වැඩ
සඳ වැළැඳි සාවැ - දිනෙන් දින කැටුවම වැඩෙන මෙන්.

පදර්ථ:- මැදහත් රජ - මධ්‍යස්ථ රජවරුන්ගේ, ඉසුරු - සම්පත්, වැඩි - වැඩෙන කල, ලොවටත් - ලෝකයාටත්, වැඩ වැඩෙ - වැඩ දියුණු වේ. සඳ වැලැඳි සාවා - සඳෙහි වාසය කරන සාවා, දිනෙන් දින - දිනපතා, කැටුවම - සඳත් සමග ම, වැඩෙන මෙන් - වැඩෙන්නාක් මෙනි.

භාවය:- මධ්‍යස්ථ රජුගේ සම්පත් දියුණු වන්නා ම ලෝකයාටත් එයින් වැඩ සිදුවේ. සඳ හා වාසය කරන හාවා දිනපතා හඳත් සමග වැඩෙන්නා මෙනි.

203\. පින් පව් කළ සතන් - දිවසින් දුටුසෙ දකිත් නිරිඳෝ
වැඩ අවැඩ මෙ දෙක ම - උන් උන්ට පමුණුවත්
සැණෙකින්.

පදර්ථ:- නිරිඳෝ - රජවරු, පින් පවු කළ - පින් හා පවු කළ, සතන් - සතුන්, දිවසින - දිව ඇසින්, දුටුසෙ - දුටුවා සේ, දකිත් - දකිත්, උන් උන්ට - උන්ට, වැඩ අවැඩ - වැඩ අවැඩ දෙක ද, සැණෙකින්ම - ඉක්මනින් ම පමුණුවත් - පමුණුවති.

භාවය:- රජවරුන් පින් පව් කළ සතුන් මොවුන් යයි දිවසින් ඇත්තා සේ දනිති. ඔවුන්ට වැඩ අවැඩ දෙක ම ඉක්මනින් ම දෙත්.

204\. නිරිඳුහට විරිඳු - දන හා ඉතව වසන අවිසක්
මරහට කම කරා - අත්සනින් කැඳවන විලස් වේ.

පදර්ථ:- නිරිඳුන්හට – රජුන්ට, නිරිඳු දන හා – සතුරුවූවන් සමඟ, ඉතව – හිතවත්ව, වසන – වාසය කරන්නාවූ, අවියත් – මෝඩ අය, මරහට – මාරයාට, තමා කරා – තමා සමීපයට, අත්සනින් – අතින්, කැඳවන විලස් වේ – කැඳවන්නා මෙනි.

භාවය:- රජුන්ට සතුරු වූවන් සමඟ හිතවත්ව වාසය කරන මෝඩ අය මාරයාට තමා කරා අත් වනා කැඳවන්නා මෙනි.

205. බෝකල් පුරුදු රජු – යයි රදුන් අන් ලෙස නොම සිතව
කිරි දෙමි නැති කළත් – උරග ඇති විස පමණ නොකරව.

පදර්ථ:- බෝ කල් – බෝහෝ කලක්, පුරුදු – පළපුරුදු, රදු යයි – රජ යයි, අන් ලෙස – අන් අයුරකින්, නොම සිතව – නො සිතව, කිරි දෙමින් – කිරි දෙමින්, ඇති කළත්-පෝෂණය කළත්, උරග, නාගයාගේ, ඇති විස-ඇත්තාවූ විෂ, පමණ නො කරව – ප්‍රමාණ නො කරව.

භාවය:- බොහෝ පළ පුරුදු රජ යයි අන් අයුරකින් නො සිතව. කිරි දී පෝෂණය කළත් නාගයාගේ ඇති විෂ ප්‍රමාණ කළ නො හැක.

206. සිල්ප උපදෙස් බත් – අබය මේ සතර දෙවූ උතුමන්
පියඹු තම පියහු – සමග පස් දෙනම පිය පිය වෙත්.

පදර්ථ:- සිල්ප – සිල්පය, උපදෙස් – අවවාදය, බත් – ආහාරය, අබය – ජීවිත අභය, යන මේ සතර – මේ කාරණා සතර, දෙවූ උතුමෝ – දුන් උත්තමයෝ, තම පියඹු – තමන්ගේ ප්‍රියාව බිරියගේ, පියහු සමඟ – පියා සමඟ, පස් දෙනම – පස් දෙනාම, පිය පිය වෙත්, ප්‍රියවූ, පිය වරු, වෙයි.

භාවය:- ශිල්ප දුන් තැනැත්තා, අවවාද දුන් තැනැත්තා ආහාර දුන් තැනැත්තා, ජීවිත අභය දුන් තැන්ත්තා යන මේ සතර දෙනාත් තම පිය බිරියගේ පියා සමග ප්‍රීතිය උපදිනා පියවරු පස් දෙනා වෙත්.

207. අදහම් නොලා සිත – දහම් නිති මෙනෙහි ලා සත රක
දවසරිනා දනෝ – දෙලොව සැප විඳ නිවන් පුර යෙත්.

පදර්ථ:- අදහම – අසධර්මය, සිත නොලා – සිතට නො ගෙන, නිතරම – නිරන්තරයෙන්, දහම – ධර්මය,

මෙනෙහි ලා, මෙනෙහි කරමින්, සත රැක – සත්වයා රැක, දවස් අරිනා – දවස් ගත කරන්නාවූ, දනෝ – මිනිස්සු, දෙ ලොව සැප විඳ – දෙ ලොවෙහිම සැප විඳ – නිවන් පුර – නිවන් පුරයට, යෙත් – යෙති.

භාවය:– අසධර්මය සිතට නො ගෙන නිතරම ධර්මය මෙනෙහි කරමින් සත්වයා රැක දවස ගත කරන්නාවූ මිනිස්සු දෙ ලොවෙහි ම සැප විඳ නිවන් පුරයට යති.

208. වැඩකට ගත නො හැකි – සතන් එක්කරගනිති යමකට
වැඩකට නො ගන්නා අබිජිත් නැකත එක් කරනු මෙන්.

පදර්ථ:– වැඩකට – කටයුත්තකට, ගත නො හැකි – ගත නො හැක්කාවූ, සතුන් – මිනිසුන්, යමකට – යම්කිසි දෙයකට, එක්කර ගනිති – යොදා ගනිති, කුමක් මෙන් ද? වැඩකට නො ගන්නා – වැඩකට නො ගන්නාවූ, අබිජිත් නැකත – අබිජිත් නම් නැකැත, එක් කරනු මෙන් – එක් කරන්නා මෙනි

භාවය:– වැඩකට ගත නො හැකි මිනිස්සු යම්කිසි දෙයකට ඈඳා ගනිති. කුමක් මෙන් ද? වැඩකට නො ගන්නා අබිජිත් නම් නැකැත එක්කර ගන්නා මෙනි.

209. තපසත් වයස කුල – ගුණ නැණ විකුම දමින් වැඩුනත්
මෙ ඇමට ම වැඩිත් – දනවත් දනෝ ලෙව්හි බැබළී.

පදර්ථ:– තපසත් – තපස, වයස – වයස, කුල – කුලය, ගුණ – ගුණය, නැන – බුද්ධිය, වික්‍රම – වික්‍රමය, දමින් – දම යන මේ හැම දෙසින් වැඩුනත් – වැඩි ගියත්, දනවත් දනෝ – ධනවත් මිනිසුන්, මෙ ඇමට ම – මේ සියල්ලන් ම – වැඩිත් – උසස් වෙති.

භාවය:– තපස, වයස, කුලය, ගුණය, ඥානය, වික්‍රමය, ධර්මය යන හැම දෙසින්.ම වැඩුණත් ධනවත් මිනිස්සු මේ හැම දෙය ට වඩා උසස් ව සිටිති.

210. එක බිලයකින් නික්මෙ – පිපිලිකාවන්ගේ ගණනට
මුළු දඹදිව දනෝ – නොසරිවෙත් දිවසින් බැලුවත්.

පදර්ථ:– එක බිලකින් – එක ගුලකින්, නික්මෙන – නික්මෙන්නාවූ, පිපිලිකාවන්ගෙ – කුහුඹින්ගේ – ගණන සංඛ්‍යාවට, මුළු දඹදිවම, දනෝ – ජනයෝ, දිවැසින්– දිවැස්වලින්, බැලිවත් – බැලිවත්, නො සරිවෙත්– සමාන නොවෙත්.

භාවය:- එක ගුලකින් පිටවන කුහුඹින්ගේ ගණන සලකන විට මුළු දඹදිව ජනයන්ට වඩා වැඩිවෙත්.

211. කොතරම් තරමැතත් - දනෝ කිසි ඉල්ලූ සඳ ලගු වෙත්
උවිඳු මහ බලිගෙන් - බිම් දන් ගනුව කුඩා වූ මෙන්.

පදර්ථ:- කොතරම් තරම ඇතත් - කොයි තරම් වුවත්, දනෝ - මිනිස්සු, කිසි - කිසිවක්, ඉල්ලූ සඳ - ඉල්ලූ සැණෙන්, ලගු වෙත් - කුඩා වෙත්. උවිඳු - විෂ්ණු තෙම, බලිගෙන් - බලි අස්රාගෙන්, බිම්, බිම් කොටසක්, දන් ගනුව - දන් වශයෙන් ගැනීමට, කුඩා වූ මෙන් - කුඩාවූවා මෙනි.

භාවය:- කොතරම් උසස් කෙනෙක් වුව කිසිවක් ඉල්ලූ සැණෙන් කුඩා බවට පත්වෙති. උපේන්ද්‍ර බලි අසුර යාගෙන් බිම්කොටසක් ඉල්ලා ගැනීමට කුඩා වූවාමෙනි.

212. එක් යහපත් කළ - සුදනෝ සියක් වැරදි ඉවසත්
දුදනෝ නො මඳ වැඩ - කළත් එක් වරදක බිඳියෙත්.

පදර්ථ:- එක් යහපතක් කළ - එක සුචරිතයක් කළ, සුදනෝ සත් පුරුෂයෝ, සියක් වැරදි ඉවසත් - සියයක් වැරදි ඉවසත්, දුදනෝ - දුර්ජනයෝ, නොමඳ - බොහෝ වරදකින්, බිඳියෙත් - බිඳෙති.

භාවය:- සුදනෝ එක් යහපතක් කළහොත් වැරදි සියයක් වුව ඉවසත්, කො තරම් යහපත් කළත් දුර්ජනයෝ එක වරදකින් බිඳෙති.

213. ලුහු දන නො දනිතත් - සුදන දුන ගනිති සුදනන් ගුණ
අකුරෙහි මැද තුබූ - රුවන් දුනගත් නැණතියන් සේ.

පදර්ථ:- අකුරෙහි මැද තිබූ - ගල්කැට මැද තිබූ, රුවන් දුනගත් - මැණික් දුන ගත්තාවූ, නැණ ඇතියන් සේ නුවණ ඇත්තන් සේ, ලුහු දන - පොඩි අය, නො ගත්තත්, සුදන - සත්පුරුෂයෝ, සුදනන් ගේ ගුණ - සජ්ජනයන්ගේ ගුණ, දුන ගත් - දුන ගනිති.

භාවය:- ගල්කැට අතර තිබෙන මැණික් ගල් දුන ගැනීමට නුවණ ඇත්තා සේ පොඩි අය දුන නො ගතත් සජ්ජනයෝ සුදන ගුණ දුන ගනිති.

214. දුන් දේ මේ ලොවට - වරව වියතුනි තැගි දන්පිත්
දුන් ලුණඹ වැස්සෙන් - ලෙව රැක නැවත සිඳු වදින මෙන්.

පදර්ථ:- වියතුනි - වියත් ජනයානෙනි, දුන්දේ - දෙන ලද්ද. මෙලොව - මේ ලෝකයේදී ම, දන් පින් - දනයට තැගි කරව් - තැගි සඳහා යොදවා, කෙසේ ද? ලුණු අඹ දුන් වැස්සෙන් - ලුණු ජලය දුන් වැස්සෙන්, ලෙව් රැක - ලෝකය ආරක්ෂා නොට, නැවත - ආපසු, සිඳු වදින මෙන් - මුහුදට යන්නා මෙනි.

භාවය:- උගතුනි, දුන් දේ මෙලොවදීම පරත්‍යාග වශයෙන් ලැබේ. ලුණු ජලය දුන් වැස්සෙන් ලෝකයම රැක නැවත මුහුදට ම යන්නා මෙනි.

215 උතුමන් සෙවුම් කළ - දනහට සව් ඉසුරු ලැබේ නිති
නෙර ඇසිර ගිය හස-හැම සතුන් එක පැහැය වන මෙන්.

පදර්ථ:- උතුමන් - උතුම් අය, සෙවුම් කළ - සේවනය කළ දනහට - ජනයාට, සව් ඉසුරු - සියලු සැපත්, නිති නිතර, ලැබේ. - ලැබෙන්නේ ය, නෙර ඇසිර - නේරු පර්වතය, උඩින් අහස ගිය, - අහසින් ගිය, හැම සතුන් හැම සතෙක්ම, එක පැහැය වන මෙන් - එක පාටක් වන්නා මෙනි.

භාවය:- උතුමන් ආශ්‍රය කළහොත් බොහෝ සම්පත් ලැබේ. මේරු පර්වතය උඩින් යන හැම සතෙක්ම එක පාටකට පැමිණෙන්නා මෙනි.

216 තදරුදු ගුණැතියන් - සමඟ වුසුවත් සුදනෝ නොනසිත්
කුරිරු ගිනි වැද පත් - පවන සිහිලස නො නස්නාමෙනි.

පදර්ථ:- තද රුදු ගුණැතියන් - තද රෞද්‍ර ගුණ අත්තන්, සමඟ වුසුවත් - වාසය කළත්, සුදනෝ - සත් පුරුෂයෝ, නො නැසෙත් - විනාශයට නොයත්. කුරිරු - කෲර, ගිනි වැදපත්, භයානක ගින්න මැදට පැමිණියත්, පවන - සුලඟෙහි, සිහිලස - ශීතල භාවය නොනස්නා මෙනි - නො නසින්නා මෙනි.

භාවය:- රෞද්‍ර ගුණ ඇතියන් සමඟ වාසය කළත් සත් පුරුෂයෝ විනාශයට නො යති. බියකරු ගිනි මැදට පැමිණියත් සුලඟෙහි සිසිල විනාශ නො වන්නා මෙනි.

217. තමනට වරද කළ - දුදනන්ට වෛර නොබැඳ කැරූ මෙත්
වඩ වඩා වැඩ කරව් - ඔවත් විළිබියට පැමිණෙන සේ.

පදර්ථ:- තමනට – තමාට, වරද කළ – වැරදි කළාවූ, දුද-නන්ට – දුර්ජනයන්ට, වෛර නොබැද – වෛර නොබැද, ඔවුන් ඒ අය, විළිබියට – ලැජ්ජාවට, බියට, වැඩියෙන්, වැඩ කරව – වැඩ කරව.

භාවය:- තමන්ට විරුද්ධව වැඹ කළ දුදනන්ට වෛර නොකොට ඔවුන්ට ලජ්ජා ඇතිවන සේ වැඩි වැඩියෙන් වැඩ කරව.

218. කුසුම් හීන වෙති – දුගඳ නද සුවඳ මල්වලටත්
එමෙන් දනන් අතුර – සමහර ගැරඬි කුණක් වැනි වේ.

පදර්ථ;- නද සුවඳ මල්වලටත් – හොඳ සුවඳැති මලිවලටත්, වඩා, දුගඳ – සුවඳ නැති, කුසුම් – මල්, හීනවෙති – හීන වෙති, එමෙන් එසේ' දනන් අතර – ජනයා අතර, සමහර අය – සමහර අය, ගැරඬි කුණක් වැනි – ගැරඬි කුණක් සම වේ.

භාවය:- සුවඳවත් මල් දුගඳ මල්වලට වඩා හීන වෙති. එලෙස මිනිසුන් අතර සමහරු ගැරඬි කුණක් සේ පිළිකුලට යති.

219. පෙර පින් නොකොට- දුන් සැපතට සැපෙන අවියත් දනෝ
නො වපුට බිජු කෙතෙහි- දන මඩිනවුන් දුක තැවෙත් ඉද.

පදර්ථ:- පෙර – පූර්ව කාලයෙහි, පින් නො කොට – පින් නො කර, දුන්, මේ කල්හි, සැපතට – සැප සඳහා සැපෙන – සැරසෙන්නාවූ, අවියත් දනෝ – මෝඩ මිනිස්සු, කෙතෙහි, කෙතෙහි – බිජු නො වපුට – බිත්තර නො වපුවා, දන මඩිනවුන් – දන නැතිකරන්නවුන් දුක – දුක, තැවෙත් – කම්පා වෙත්.

භාවය: පෙර පින් නො කොට මේ කල්හි සැපත සඳහා තැත්කරන මෝඩ අය කෙතෙහි බිත්තර වී වපුරන්නෝ ධනය මඩින අය දුක තැවෙන්නෝය.

220. ලොව කළමනා දෙය - නො දන කළහොත් නො පණත්
වැනසෙනු නියතමැයි - අහසට දමූ කැටයක් මෙණමෙන්.

පදර්ථ:- ලොව – ලෝකයෙහි, කළමනා දෙය – කටයුතු දෙය නො දන, නොදනී, නො පණත් කළහොත් – වැරදි දෙයක් කළහොත් අහසට- ආකාශයට, දමූ – දමන ලද, කැටක් විලසින්- ගල් කැටයක්, මෙණ මෙන්, වැටෙන්නා සේ වැනසෙනු – විනාශවීම නියතමැයි – ස්ථිර වේ.

භාවය:- ලෝකයෙහි කටයුතු දෙය නො දත වැරදි දෙයක් කළහොත් අහසට දමූ කැටයක් බිම වැටෙන්නාසේ විනාශයට යේ.

221. අවසෙසු දනෝ ලද - නො මද ඉසුරක් අමුත්තක් සේ
දුබුල වූ දියට නැගි - මසුන් නැසෙනා ලෙසට වැනසෙත්.

පදර්ථ:- නො මද-බොහෝ වූ, ඉසුරක් - වස්තුව, අමුත්තක් සේ - අමුත්තක් මෙන්, ලද - ලබන ලද, අවසෙසු - අවශේෂ, දනෝ - මිනිස්සු, දුදලවූ දියට-අළුත් ජලයට නැගි - නැඟෙන්නා වූ මසුන් - මාළුන්, නැසෙන - නැසෙන, විලස - විලාශයෙන්, වැනසෙත් - විනාශයට යෙති.

භාවය:- විශාල වස්තුවක් එක්විට, ලැබුණ විට මෝඩයෝ එයින් විනාශයට යති. අළුත් දියට පැමිණි මාළුන් ඒ දිය නිසා මැරෙන්නා මෙනි.

222. කළ අල්ප පිනෙනුත් සුරනර සැපත් නො මද පැමිණේ
නුග බිජු වටින් නැගී - විසල් තුසරා මඩුලු විලසින්.

පදර්ථ:- කළ අල්ප පිනෙනුත් - කළා වූ සුළු පිනෙනුත් සුරනර සැපත් - දෙව් මිනිස් සැප, නො මද - බොහෝ සේ, පැමිණේ - පැමිණෙන්නේය. නුගබිජුවටින් - නුග ඇටයකින්, නැගි - නැංගැවූ, සාමඩුලු - අතු පතර ඇති, විසල් තුර විලසින් - විශාල වෘක්ෂයක් මෙනි.

භාවය:- සුළු පිනෙකින් බොහෝ වූ දෙව් මිනිස් සැප ලැබේ. පොඩි නුග ඇටයකින් පැලව අතුපතර දමා විශාල වෙන නුග ගස මෙනි.

223. තිරසර ගුණැති සත - සව් සතට මැදහත්ව පවතිත්.
මහමෙර සුර අසුර - දෙ ලොවට සමව සද සිටිනෙව්.

පදර්ථ:- තිරසර ගුණ ඇති - ස්ථිර ගුණ ඇත්තාවූ, සත-සත් පුරුෂයෝ, සතට - සත්වයාට, මැදහත්ව - මධ්‍යස්ථව, පවතිත් - පවතිත්. මහමෙර - මහා මේරු පර්වතය, සුර අසුර දෙ ලොවට - දෙව් අසුර දෙ ලොවට - දෙව් අසුර දෙ ලොවට ම, සමව සමව, සිටින - එව - සිටින්නාක් මෙනි.

භාවය:- ස්ථිර සාර ගුණ ඇති සත් පුරුෂ අය සත්වයාට මධ්‍යස්ථව පවතිත්. මහා මේරු පර්වතය සුර අසුර යනා දෙ ලොවට ම සමානව පවතින්නාක් මෙනි.

224. සහසික පවිටු දන - මළ කල ගේය නිරයට
පහන නිවි සඳෙහි - මුළු ගෙය අඳුරු වැසෙන විලසින්.

පදර්ථ:- සහසික පවිටු දන - සාහසික පවිටු අය, මළ කල- මළ කාලයෙහි, නිරයට - නරකයට, ගෙන යේ - ගෙන යන්නේය, පහන - ප්‍රදීපය, නිවි සඳෙහි - නිවී ගිය කල්හි, මුළු ගෙය - මුළු මහත් ගෙයම, අඳුරු - අඳුරෙන්, වැසෙන - වැසෙන්නාවූ, විලසින් - විලාසයෙන්.

භාවය:- සාහසික පවිටු මිනිස්සු මළ කල්හි නරකයට ගෙන යනු ලබති. එය කෙබඳුද? පහන නිවි කල්හි මුළු ගෙයම අඳුරෙන් වැසෙන්නා මෙනි.

225. නො තලා කුසුම් රොන්-ගන්නා රුසිරු බිඟුන් විලසින්
නො තලා ලොව සතුන්-අයබදු ගනුත් දෙලොව වැඩවේ.

පදර්ථ:- කුසුම් නො තලා - මල් නො තලමින්, රොන් ගන්නා - රොන් ගන්නාවූ, බිඟුන් විලසින් - මී මැස්සන් මෙන්, ලොව - ලෝකයෙහි, සතුන් - සත්ත්වයා නො තලා - නො තලමින්, අයබදු ගනිත් - අයබදු ගැනීම, දෙ ලොව - දෙ ලොවෙහි ම, වැඩ වේ - අභිවෘද්ධිය ඇති වේ.

භාවය:- මී මැස්සා මල නො තලා රොන් ගන්නා එ සේම සතුන් නො තලා අයබදු ගැනීම දෙ ලොවට ම වැඩ සිදු කර දේ.

226. අසිරුවන් සනහට දුක්විය නොදෙත් තමන් නැසෙතත්
රාවණ තම මලුට - අල කොන පලක් මණ දරුමෙන්.

පදර්ථ:- ඇසිරුවන් සනහට - ආශ්‍රය කළ ජනයාට, තමන් නැසෙතත් - තමන් විනාශයට ගියත්, දුක්විය නො දෙක් - දුක් විඳීමට ඉඩ නො දෙති. රාවණ - රාවණ තෙම, තම මලුට - තමන්ගේ මල්ලිට, (විභීෂණට) අලංකාන ගැසුවාවූ - කුන්ත පහර, එක්මන - ලක්ෂ්මණ කුමාරයා, දරු මෙන් - දරුමෙනි.

භාවය:- උත්තමයෝ තමන් ආශ්‍රය කළ ජනයාට කරදරයක් විඳීමට ඉඩ නො දෙති. තමා ඒ විනාශයට මූණ පාති. රාවණ රජු විභීෂණට ගැසූ කුන්ත පහලට ලක්ෂමණ මූණ පෑවා මෙනි.

227. දුරුකර දුදනයන් – සුදනා සමගම කර දෙලෝ වැඩ
අපමණ ඉසුරු තෙද – විකුම් නැණකත් මැකේ මරණින්.

පදර්ථ:– දුදනයන්,–දුර්ජනයන්, දුරුකර – දුරු කොට; සුදනා සමඟම – සුදනන් සමඟ, දෙ ලෝ වැඩ – දෙ ලොවෙහි අභිවෘද්ධිය, කර – කරන්නේය, අපමණ – අප්‍රමාණ, ඉසුරු – සම්පත්, තෙද – තේජසත්, විකුම – වික්‍රමයත්, නැණ ඇතත් – නුවණ ඇතත්, මරණින් – මරණයෙන්, මැකේ – විනාශ වේ.

භාවය:– දුදනන් හැර සුදනන් සමඟ දෙ ලෝ වැඩ කළ යුතුය. බොහෝ සම්පත්, තේජස්, වික්‍රම, බුද්ධිය, තිබුණත් ඒ සියල්ල මරණයෙන් කෙළවර වේ.

228. තෙදැති නිරිඳුන් දික් – විජය නො කළත් පවති අණසක
සුර පුර ඉඳු ඉඳිත් – දෙව්දුනු දසදිගක තෙවුන මෙන්.

පදර්ථ:– තෙදැති – තේජස් ඇති, නිරිඳුන් - රජුන්, දික් විජය නො කළත් – දිශා ජයග්‍රහණය නො කළත්, අණසක – ආඥා චක්‍රය, පවතී – පවතින්නේය, ඉඳු – ශක්‍රයා, සුර පුර – දෙව්ලොව, ඉඳිත් – වාසය කරමින්, දෙව් දුනු – දේවචාප, දස දිග – දශ දිසාවෙහි, තෙවුන මෙන් – බබළන්නාක් මෙනි.

භාවය:– තෙදැති රජවරුන් ජයග්‍රහණය නො කළත් ඔවුන්ගේ අණසක දශ දිශාවෙහි පැතිර පවතී ශක්‍රයා දෙව්ලොව වාසය කළත් ඔහුගේ දුන්න බබළන්නා මෙනි.

229. සරත් පුන්සඳකින් – මුළු ගුවන බබළන මෙන්
නිරිඳුන් මැතිවරන් – මැදහත් කමින් ලොවත් බබළා.

පදර්ථ:– සරත් - සරත් කාලයෙහි, පුන් සඳකින් – පූර්ණ චන්ද්‍රයාගෙන්, මුළු ගුවන – මුළු ආකාශයම, බබළන මෙන් – බබළන්නාක් මෙන්, නිරිඳුන් – රජුන්, මැතිවරන් – මන්ත්‍රීවරුන්ගේ, මැදහත් කමින්–මධ්‍යස්ථ භාවයෙන්, බබළා – බබළයි.

භාවය:– සරත් කාලයෙහි පුන්සඳ මුළු අහස ම බබළවයි. රජුන් මැතිවරුන්ගේ මධ්‍යස්ථ භාවය ලෝකයත් බබළවයි.

230. දිවිනෙක් සතුරු තද – පව් බිය අසත නොමඳ නුගුණත්
මෙකී සිවු අවැඩ ම – පරහන සතට පැමිණේ.

පදර්ථ:- දිවි තෙක් - පණ ඇති තාක්, තද සතුරු - තද සතුරෝය, පව - පවය, බිය - බියය, අගුණත් - නුගුණය, අසන - ඇසුමය, යන මෙකී සිවු අවැඩ ම - මේ අවැඩ සතර ම, පරඟන පතන - අන් ස්ත්‍රීන් බලාපොරොත්තු වන, සතට - අයට, පැමිණේ - පැමිණෙන්නේය.

භාවය:- ජීවිතය ඇති තාක් සතුරන් පව, බිය, අගුණ ඇසීම යන කරුණු සතර අනුන්ගේ ස්ත්‍රීන් කරා යන්නාට පැමිණේ.

231. නූපයා සවසිරි - දූගී ලුහු දනගෙ අඹු සොඬකම්
අවියත්ව පඬි බැව - පානෙ නැණ නැති දද දනෝ වෙත්.

පදර්ථ:- දූගී දුප්පත්, ලුහු දනගෙ - පහත් ජනයාගේ, අඹු සොඬකම් - කාන්තාවන්ට සොඬවීම, සවසිරි - සකල සම්පත්තිය, නූපයයි - නූපදවයි, අවියත්ව - ඉගෙනීමක් නො මැතිව, පඬි බැව් පානෙ - පණ්ඩිත බව ප්‍රකාශ කරන්නාවූ, නැණ නැති - නුවණක් නැති, දද දනෝ - මෝඩ ජනයෝ, වෙත් - වෙති.

භාවය:- දුප්පත් පහත් ජනයාගේ අඹු සොඬකම නිසා සම්පත්තිය නවත් පිරිහේ. මෝඩව සිට පණ්ඩිතකම ප්‍රකාශ කරන්නෝ මෝඩයෝය.

232. සක්විති රජ ඉසුරු - සරි කරත දෙව්ලොව සුරකු සිරි
නහස්නා පහනට - හිමව් කුළු සරි කොට සිතන වැනි.

පදර්ථ:- සක්විති රජ ඉසුරු - සක්විති රාජ්‍ය සම්පත්තින්, දෙව් ලොව - දිව්‍ය ලෝකයෙහි, සුරකුසිරි - දෙවියෙකුගේ සැපතට, සරි කරත - සමාන කරන කල්හි, නහස්නා පහනට - උරගලට, හිමව්කුළු - හිමාල පර්වතය, සරිකොට - සමාන කොට, සිතන වැනි - සිතන්නා මෙනි.

භාවය:- සක්විති රාජ්‍ය සම්පත් එක දෙවියකුගේ සැපතට සමාන කරන විට උරගලට හිමාලය පර්වතය සමාන කොට සිතීමක් වැනිය.

233. මෙ බඳු සුර පුරටක් - දඹදිව වැඩිය පින් කෙත්
එමතු නොව මුනිවර - මෙහි ඉපද බුදුව මොක් දෙනුවෝ

පදර්ථ:- දඹදිව - ජම්බු ද්වීපය, මෙ බඳු - මෙ වැනි, සුර පුරටත් - දෙව් ලොවටත්, වැඩිය - වැඩි වූ, පින් කෙතකි - පුණ්‍ය ක්ෂේත්‍රයකි, එමතුදු නොව - එපමණක් නොව, මුනිවර - බුදුවරු, මෙහි ඉපිද - මෙ ජම්බුද්වීපයෙහි ඉපිද, බුදුව - බුදුවී, මොක් දෙනුවෝ - නිර්වාණ සම්පත්තිය දෙන්නෝය.

භාවය:- දඹදිව සුරපුරයටත් වඩා පින් කෙතකි. බුදුවරු පහළ වන්නෝ ද මෙහිදී ය. ඒ බුදුවරු නිවන් සම්පත් දෙති.

234. සුදනන්ට කළ වැඩ–පළ නොදෙති යන සැකය නොසිතව් තෙරළු පැලයට ඇදි - දියට අග පළ ගෙන සිටිහ මෙන්.

පදර්ථ:- සුදනන්ට - සත් පුරුෂයන්ට, කළ වැඩ - කරන ලද වැඩ, පළ නො දෙති - පල නො දෙන්නේය. යන - යන, සැකය සිත - සැක සිත, තෙරළු පැලයට - පොල් පැලයට, ඇදි - ඇද්දවූ, දියට - ජලයට, අග පල සිටින එව - කෙළවර ගෙඩි ගෙන සිටින්නා මෙනි.

භාවය:- සත්පුරුෂයන්ට කළ වැඩ පළ ගෙන නො දේය යන සැක සිත නො සිතව. පොල් පැලයට ඇද්ද දිය කෙළවර ගෙඩි ගෙන සිටින්නා මෙනි.

235. අග සිට මුලට උක් - කන වැන්න සුදනන්ගෙ ඉතකම දුදනන් සමඟ වනු - එහි මුල පටන් අගට බුදිනෙව.

පදර්ථ:- සුදනන්ගෙ - සත්පුරුෂයන්ගේ, ඉතකම - හිතවත් කම, අග සිට - කෙළවර සිට, මුලට - මුල තෙක්, උක් කන වැන්න - උක් ගස් කන්නාක් වැනිය. දුදනන් සමඟ - දුර්ජනයන් සමඟ, වනු - වීම, එහි - උක් ගසෙහි, මුල පටන් - මුල සිට, අගට - අග තෙක්, බුදින එව - කන්නාක් මෙනි.

භාවය:- සත් පුරුෂ හිතවත්කම අග සිට මුලට උක් ගස් කන්නාක් මෙනි. දුර්ජනයන් හා එක්වීම මුල සිට අග තෙක් උක් ගස් කන්නාක් මෙනි.

236. නොයෙක් කටයුතුකම්-දන්නා ලෙසට ලොව නැණැති වී නොයෙක් උපමායෙන් - සැදූ නිරතුරු බලා ගැනුමට.

237. අනුවණ දුරුර සැප - වාසය කර මෙලොව නිතිතුරෙන් සගමොක් සැපත් ලැබ - ගන්ට බලව ලෝකෝපකාරය.

පදාර්ථ:- නැණ ඇතිවී – ඥානවන්තව, ලොව ඇති – ලෝකයෙහි ඇත්තා වූ, නොයෙක් කටයුතු කම් – නොයෙක් කටයුතු, දන්නා ලෙසට – දැන ගැනීම පිණිසත්, නිරතුරුව – නිතර, අනුවණ දුරැර – අනුවණකම් බැහැර කොට, මෙ ලොව – මේ ලෝකයෙහි, නිරතුරන් – හැමවිට, සැප වාසය කර – සැප වාසය කොට, සග මොක් සැපත් ලැබ – ස්වර්ග මෝක්ෂ සම්පත් ලබමින්, නොයෙක් උපමායෙන් – නන් වැදෑරුම් උපමායෙන්, සැදූ – සැදූනා වූ, ලෝකෝපකාරය – ලෝකෝපකාරය, බලව – බලව.

භාවය:- බුද්ධිමත්ව ලෝකයෙහි ඇති කටයුතු දැන ගැනීමටත් නිරතුරුව අනුවණකම් දුරලා මෙලොව නිතර සැප වාසය කොට සගමොක් සැපත් ලබා ගැනීමට නොයෙක් උපමායෙන් සැදුණු ලෝකෝපකාරය බලව.

## කර්තෘ සන්දර්ශනය

කෙළවර කෙළෙ මෙ පොත – පුරා සතාස සතවස පිරිසිටි පරපුර වණිජකුල – රණස්ගලු තෙර සාමින්.

ශකවර්ෂ 1721 දී වාණිජ කුලයෙහි උපන් රණස්ගල්ලේ හිමි විසින් මේ ලෝකෝපකාරය ලියා නිම කරන ලදී. උන්වහන්සේ තොටගමුවේ විහාරයෙහි බොහෝ කලක් වැඩ සිටි කෙනෙකි.

## තව මතයක්

කිත් දිගු බිත් සුසැදූ කුති හැම ස ද
මෙත් මහතෙක් පහමුල යති ස ද
සත් වග සෙත් කළ සුනිඳු පද වැ ද
සිත් ලෙස අත් කෙළෙ මොක් සැප මන න ද

සසර ට ගැලෙවන උපදෙස් කී වා
අසර කි මොක් පුර සතහට පෑ වා
නිතර මෙ බස් සැම කල් පවතී වා
එතර නිවන් පුර මෙමට ලැබේ වා

දස දෙස සව සත සුවපත් වේ වා
විස ලෙස දස අකුසල් නො කෙරෙත් වා
දස කුස ලෙන් හැම දෙන ම දිනෙත් වා
අස දි ස වූ මොක් සැපත ලබත් වා

නිමි.

85/.1
89783 RAN